ISLAM LAND

ඉස්ලාමීය ඉගැන්වීම් 3

## බිස්මිල්ලාහිර් රහ්මානිර්රහීම්

සියළු පශංසා අල්ලාහ් තආලාටම හිමය. ශාන්තිය හා සමාදානය මුහම්මද් (සල්) තුමාණන් හා එතුමාගේ මිතුරන් හා සියළු දෙනා වෙත හිමි වේවා

**ප්‍රවිශ්ඨවීම**

අල්ලාහ් තආලා මෙසේ සඟහන් කරයි.

දහම්ලත් ජනයිනි අපි අල්ලාහ් හැර අන්කිසිවක් ඉබාදත් නොකරමුයිද (අවනත නොවෙමුයිද- අපි ඔහුට අන්කිසිවක් සමානනොකරමුයිද, අපගෙන් සමහරෙක් අල්ලාහ් හැර අන්කිසිවක් පරමාධිපත්‍යයන් ලෙසින් නොගනිමුයිද අප අතරද නුඹලා අතරද පොදු සම්මුතියකට එළඹෙමුයිද (නබි මුහම්මද්) ඔබ පවසනු. එවිට ඔවුන් (ඔබගේ ආරාධනාව නොපිළිගෙන) පිටු පෑවොත් නියත වශයෙන්ම අප මුස්ලිම් (අල්ලාහ්ට පමණක් ඉබාදත් කරන ඔහුට පමණක් යටහත් වන) බවට නුඹලා සාක්ෂි දරනුයි (නබි මුහමමද්) පවසනු. (ආල ඉම්රාන් 64)

සත්‍යවශයෙන්ම ඉස්ලාම් ධර්මය සතවූ ධර්මයකි. මන්ද එය ස්වභාදර්මයට ගැලපෙන ධර්මයක් නිසාය, එය පැහැදලි ධර්මයකි. අපැහැදිලි අවිනිශ්චිත ධර්මයක් නොවේ. කෙනෙකුගේ සිතෙහි කැකෑරෙන ඕනෑම ගැටළුවක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් අසන්නට ඕනෑම කෙනෙකුට අයිතියක් ඇත. ඉස්ලාම් ධර්මය සම්බන්ධයෙන්

ISLAM LAND

www.islamland.com

ප්‍රශ්න කිරීමේ දොරටු විවෘත වුවද පිළිතුරු දීමේ දොරටුව සෑම කෙනෙකටම සඳහාම විවෘතව තබා නැත. අල්ලාහ් තආලා මේය සම්බන්ධයෙන් මෙසේ සඟහන් කරයි.

"මාගේ රබ් (පරමාධිපති) තහනම් කළේ ප්‍රසිද්ධ හෝ රහස්‍ය නින්දිත ක්‍රියාවන්ද න්‍යායෙන් තොරව අක්‍රමිකතාවන්ද (අල්ලාහ්ගේ) අනුමැතියෙන් තොරව පහළ වූ දෑ, අල්ලාහ්ට සමානයන් ලෙස තැබීමද, අල්ලාහ් ගැන නුඹලා නොදන්නා දේ කීමද යැයි (නබි මුහම්මද්) පවසනු" ( අල් අහ්රාෆ් 33)

දහම පිළිබඳව අසනු ලබන ප්‍රශ්න සහ පිළිතුරු දීමේ වරම එම විෂයට අදාල උගතුන්ගෙන් පමණක් විමසා දැනගන්නා ලෙස අල්ලාහ් අණ කරයි. අල්ලාහ් තආලා මේය සම්බන්ධයෙන් මෙසේ සඳහන් කරයි.

නුඹලා මෙය නොදන්නෙහි නම් (දහම්) දැනුම ඇති අයගෙන් විමසනු. (සූරතුන් නහ්ල් 43)

දහම පිළිබඳ දැනුම් ලබාගැනීමේ ක්‍රම විධි මුහම්මද් නබි (සල්) තුමා විසින් පෙන්වා දී ඇති අතර එය නොසුදුසු අයගෙන් ලබා ගැනීමේ අනතුරු දායක තත්ත්වය ගැනද මෙසේ විස්තර කර ඇත.

ඥානය අල්ලාහ් තආලා විසින් මහුගේ ගැත්තන්ගෙන් එකවර උදුරාගන්නේ නැත උගතුන්ව ඔහු සමීපයට අත්පත්කර ගැනීම තුලින් දැනුම් ඥානය අත්පත් කරගනී. එවිට උගතුන් නොමැති බැවින් මිනිසුන් නූගතුන් සිය නායකයින් බවට පත්කර ගනිති, මවුන්ගෙන් අසනු ලබන ප්‍රශ්න සදහා පිළිතරු දීමෙන් ඔවුන්ද නොමග ගොස් අනුන්ද නොමග යවති.

ඉස්ලාම් ධර්මයේ විශ්වාස කල යුතු අපැහැදිලි ගුප්ත කරුණු අන්තර් ගතවී නැත. මිනිසාගේ බුද්ධියට ගෝචර නොවන හා මිනිසාගේ යහපතට අවශ්‍ය නොවන විෂයන් අල්ලාහ් තආලා විසින් දහමෙහි සදහන් කර නැත නමුත් මිනිසාගේ මෙලොව පැවැත්මට අවශ්‍යවන දේ අල්ලාහ් තආලා විසින් මුහම්මද් නබි තුරිමාණන්ගේ ප්‍රකාශයෙන් හෙළිදරව් කර ඇත. මනුෂ්‍යයන් වශයෙන් අපගේ සිත් සතන් තුල බොහෝ කරුණු සම්බන්ධයෙන් විවිධ ප්‍රශ්න හා ප්‍රහේලිකා මතුවන අවස්ථා ඇත. මේ සදහා ඉස්ලාම් ඉතා සරල අන්දමින් හා මාහැඟි විලාසයකින් බුද්ධි ගෝචරවන ආකාරයට පිළිතුරු ලබා දී ඇත.

මිනිසාගේ ආරම්භය ගැන කෙනෙකු විමසන්නේ නම් ඒ සදහා පිළිතුරු අල්ලාහ් තආලාගේ වදනින් මෙසේ ලබා ගත හැක.

මැටියෙහි (වූ) සාරයෙන් මිනිසා අපි නියතවශයෙන් මැව්වෙමු. පසුව අපි ඔහු සුරක්ෂිත ස්ථානයක ශුක්‍රාණු බිඳුවක් ලෙසින් (තැන්) පත් කළෙමු. පසුව අපි ශුක්‍රාණු බිඳුව ලේ කැටියක් කළෙමු. ඉන්පසු ලේ කැටිය මස් කැබැල්ලක් බවට පත් කළෙමු. අනතුරුව මස් කැබැල්ල ඇටකටු බවට පත් කළෙමු. පසුව ඇට කටු මසින් ආවරණය කළෙමු. ඉන්පසු එය (එම කලලය) අපි වෙනස් නර්මාණයක් කළෙමු. නිර්මාපකයන්ගෙන් ඉතා ලක්ෂණ (නිර්මාපකයාවූ) අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය. (අල් මුඃමිනූන්)

අල්ලාහ් තආලා විසින් නිර්මානය කරන ලද විවිධ හා විෂම නිර්මානයන් අතර මිනිසාගේ තත්වය සහ විශිෂ්ඨත්වය ගැන කෙනෙකු විමසන්නේ නම් ඒ සඟහා පිළිතුරු අල්ලාහ් තආගේ හෙළිදරව්වෙන් මෙසේ ලබා ගැනීමට හැක.

නියතවශයෙන්ම ආදම්ගේ දරුවන් අපි සම්භාවනීය තත්වයට පත් කළෙමු. තවද පිවිතුරු දැයින් ඔවුනට භෝග සැපයිමු. තවද අප මැවූ බොහෝ ජීවින් අතරිරින් ඔවුන් අතිවිශිෂ්ඨ කළෙමු.(බනී ඉස්රාඊල්)

මිනිසා හා අනිකුත් මැවීම් අතර ඇති සබඳතා පිළිබඳ කෙනෙකු විමසූ විටක ඒ සදහා පිළිතුරු පහත සදහන් අල්කුර්ආන් වදනින් ලබා ගත හැක.

නැව් ඔහුගේ අණසක යටතේ (මුහුෙහි) ගමන් කිරීම සඳහාද ඔබලා විසින් ඔහුගේ දායාදයන් ලබා ගැනීම පිණිසද තවද ඔහුට කෘතගුණ දැක්වීම පිණිසද ඔබට මුහුද වශීකර දුන්නේ ඔහුමය.

ඔහු විසින්ම අහස්හි සහ පොලෝතලයෙහි ඇති සියළු දෑ ඔබ සඳහා වශී කර දී ඇත මේ සම්බන්ධයෙන් සිතීමට හැකි සමාජයට විවිධවූ (සාක්ෂි) සාධකයන් ඇත. (සූරතුල් ජාසියා )

සියළු මැවුම් නිර්මානය කිරීමට හා ඔවුන්ගේ මෙලොව පැවැත්මට හේතුන් කුමක්දැයි යන පැනයට පිළිතරිරු පහත සදහන් වදනින් පැහැදිලි වෙයි.

"තවද ජින් වර්ගයාද මිනිස් සත්වයාද මා වන්දනාමානය කිරීමට හැර නිර්මානය නොකළෙමි. ඔවුන්ගෙන් මා කිසිවක් අපේක්ෂා නොකරමි ඔවුන් මට අහාර සපැයිය යුතරියැයි බලාපොරොත්තු නොවමි. සත්‍ය වශයෙන්ම අල්ලාහ් (සියළු සතත්වයින් සදහා) ආහාර සපයමින් සිටියි (සූරත් අල් දාරියාත්)

(සියළු කාරණා සම්බන්ධයෙන්) ආරම්භයාද ඔහු වේ අවසානයාද ඔහුමවේ ප්‍රසිද්ධ වූ තැනැත්තාද ඔහුම වේ අභ්‍යන්තර වූ තැනැත්තාද ඔහුම වේ. (සූරතරිල් හදීද් : 03)

මානසික සුවය සිතට සහනය සහ තිරසාර රංජතික මනෝභාවය ලබා ගන්නා මාර්ගය ගැන කෙනෙකු විමසන්නේ නම් ඒ සඳහා පිළිතුර පහත සඳහන් වදනින් ලබා ගත හැක.

විශ්වාස කර අල්ලාහ් සිහිපත් කිරීමෙන් ඔවුන්ගේ සිත් සතන් සහනයට පත්වේ. දැනගනු අල්ලාහ් ගැන සිහිකරීමෙන්ය සිත් සහනයට පත්වේ. (අල් රාඉද් 28)

වාසනාව හා සාර්ථක ජීවිතය යනාදිය උදාකර ගන්නා මාර්ගය ගැන අල් කුර්ආනය මෙසේ විස්තර කරයි.

පුරුෂයෙකු හෝ ස්ත්‍රීයක හෝ වේවා ඔහු විශ්වාසකරන්නකු ලෙසින් යහපත් ක්‍රියා කරන්නේද නියතවශයෙන් අපි ඔහුට යහපත් ජීවිතයක් ගෙනයෑමට ඉඩ සලස්වන්නෙමු. තවද ඔවුන් කරමින් සිටි විශිෂ්ඨ දෑ අනුව අපි ඔවුන්ගේ තිළිණ නියතවශයෙන් ඔවුනට ලබා දෙන්නෙමු. (සූරතරින් නහ්ල් 97)

අල්ලාහ් තආලා පිළිබඳ සහ ඔහු විසින් හෙළිදරව් කරන ලද දෑ කෙරෙහි විශ්වාස නොකරන අයවලුන්ගේ තත්ත්වය ගැන විමසනු ලබන්නේ නම් ඒ සඳහා පිළිතුරු පහත සඳහන් වදනින් ලබා ගත හැක.

ෑයමෙකු මා මෙනෙහි කිරීම (දහම) පිටුපාන්නේද නියතවශයෙන්ම ඔහුට (මෙලොවදී ගතකිරීමට සදුවන්නේ) දුක්ඛිත ජීවිතයකි. කියාමත් (මළවුන් කෙරෙන් නැගිටුවන) දිනයේ අපි ඔහු අන්ධයකාරී ලෙස නැගිටුවන්නෙමු. මාගේ රබ් (පරමාධිපතියාණෙනි) ඔබ මා (අද) අන්ධයෙකු කළේ කුමක් නිසාද? මා (පොළෝ ජීවිතයෙහිදී) දෘෂ්ඨිය ඇත්තෙකු ලෙස ජීවත්වුනෙමි යැයි ඔහු ඔහු පවසනු ඇත. එසේය. අපගේ ආයාත් (වදන්) නුඹ වෙත පැමිණියේය. නමුත් නුඹ ඒවා අමතක කළෙහිය. එලෙසම මේදින නුඹ අමතක කරනු ලබන්නේයැයි ඔහු (අල්ලාහ්) කියන්නේය. (සූරත් තාහා 124 ’ 126)

පුද්ගලික වශයෙන් සහ සමාජීය වශයෙන් යහපතක් ඇතිකරවන අංගසම්පූර්ණ වූ සියළු නීති රීතිවලින් සමන්විත ධර්මයක් ගැන අසනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරක් මෙසේ ලබා ගත හැක.

අද දින මම නුඹලා වෙනුවන් නුඹලාට නුඹලාගේ ආගම සම්පූර්ණ කළෙමි. තවද නුඹලාගේ දීන් (ජීවන රටාව) වශයෙන් ඉස්ලාමය සතුටින් තෝරා ගතිමි. ( සූරත් අල් මාඉදා 3)

කෙනෙකු විසින් පිළිගත යුතු සත්‍ය ධර්මයක් පිළිබඳවද අල්ලාහ් කෙරෙහි සහ ඔහුගේ ස්වර්ගය

වෙත මග පාදන මාර්ගයට පිවිසිය හැකි ක්‍රමය ගැන කෙනෙකු විමසුවහොත් ඒ සඳහා පිළිතුරු පහත සඳහන් වදනින් ලබා ගත හැක.

(මෙම අවනත වීමේ මාර්ගය වන) ඉස්ලාමය හැර (කවර හෝ අන්‍ය) දහමක් අනුගමනය කරන්නකුවේද ඔහුගෙන් එය (දහම) කිසි විටෙක පිළිගනු නොලැබේ. තවද ඔහු පරලොවදී පරාජිතයින්ගෙන් කෙනෙක් වේ. (ආලඉම්රාන් 85)

අල්ලාහ් තආලා විසින් පවත්වාගෙන යනු ලබන මිනිස් සබඳතාවය ගැන කෙනෙකු විමසන්නේ නම් ඒ සඳහා පිළිතුරක් පහත සඟහන් වදනින් ලබාගත හැක.

මනුෂ්‍යයිනි අප ඔබ සැම එකම ගැහැණියකගෙන් හා පිරිමියෙකුගෙන් නිර්මාණය කළෙමු. ඔබලා එකිනෙකා හඳුනාගැනීම වස් කණ්ඩායම් හා ගෝත්‍ර බවට පත් කළෙමු. (එබැවින්) ඔබලා අතරිරින් ඉතා බියබැති තැනැත්තා අල්ලාහ් වෙත ඉතා ගරුත්වයට පාත්‍ර වූ තැනැත්තා වෙයි. නිසකවම අල්ලාහ් සියල්ල දන්නේය අවබෝධ කරන්නේය. (සූරත් හිජ්රාත් 13)

අල්ලාහ් තආලා වෙත ඥානයට ඇති වැදගත්කම ගැන කෙනෙකු විමසන්නේ නම් ඒ සඳහා පිළිතුරු මෙසේ ලබා ගත හැක.

විශ්වාස කළ අයවලුන්ගේ සහ ඥානය ලැබූ අයගේ තත්ත්වය අල්ලාහ් උසස් කරන්නේය. අල්ලාහ් ඔබලා කරන (ක්‍රියාවන්) ගැන හොදින් දනී.

මෙලොව ජිවන ගමනෙහි අවසානය ගැන අසනු ලබන පැනයට පිළිතුරු මෙසේ සදහන් වී ඇත.

සෑම ජීවියෙක්ම මරණයේ සුව විදිති. නුඹලාට නුඹලාගේ පූර්ණ ඵලවිපාක දෙනු ලබන්නේ පරමාන්ත දිනයේදීය. යමෙක් අපායගින්නෙන් වළක්වා ස්වර්ගයට ඇතුළත් කරගනු ලැබේ නම් ඔහු සැබෑ ලෙසින්ම සාර්ථකත්වය ලබන්නේය. මෙලොව ජීවිතය මායා සුඛෝපභෝගි තත්වයෙන් යුක්ත වූ දෙයක් මිස වෙනත් නැත. ( සූරත් ආල ඉම්රාන් 185)

මළවූවන් නැවත නැගිටුවීමට අල්ලාහ් තආලාට ඇති හැකියාව ගැන කෙනෙකු විමසන්නේ නම් ඒ සඟහා පිළිතුරු මෙසේ ලබා ගැනීමට හැක.

තවද ඔහු සිය මැවුම් අමතක කොට අප වෙනුවෙන් උපමාවක් දක්වයි. ,මිනිස් ඇටකටු දිරාපත් වීමෙන් පසු එයට ප්‍රාණය ලබා දෙන්නේ කව්රුන්ද පළමුව ඒ සදහා ප+ාණය ලබා දුන් තැනැත්තාම ඒ සදහා ප්‍රාණය ලබා දෙයි. ඔහු සෑම මැවීමක් ගැන හොදින්

දනී. යනුවෙන් නබිතරිමාණෙනි පවසන්න. (යාසීන් 78 ’ 79)

තකනෙකුගේ යහපත් ක්‍රියාවන් සඳහා අල්ලාහ් තආලා විසින් ලබා දෙන ආනිසංශ ගැන අසනු ලබන ප්‍රශ්න සදෟහා මෙසේ පිළිතුරු ලබා දිය හැක.

විශ්වාස කොට දැහැමි කටයුතු කළ අයට නියතවශයෙන් ඔවුන්ගේ ආගන්තුක සත්කාර ස්ථානය පිර්දව්ස් නමැති ජන්නාහ් (ස්වර්ගයන්) වේ. ( සූරතුල් කහ්ෆ් 107)

මළවූවන් නැගිටුවීමෙන් පසු සිදුවන ක්‍රියාවලියන් පිළිබඳ අසනු ලබන ප්‍රශ්න සඳහා පිළිතුරු පහත සඳහන් ආකාරයට විස්තර කිරීමට හැක. සත්‍ය වශයෙන්ම එම සිදුවීම සදාතනිකයි අවසානයකින් තොරයි එය මං දෙකකින් සමන්විතය එකක් ස්වර්ගයයි අනික නිරයයි. මේ සඳහා තෙවන මාර්ගයක් නොමැත.

සොහොයුරු සොහොයුරිය

අද ලෝකය මුහුණපාන සියළු ප+ශ්න ගැටළු සඟහා ඉස්ලාම් දහම තුල විසඳුම් තිබෙන බවට මා ගැඹුරින් විශ්වාස කරමි. ඉස්ලාම් ලබා දෙන විසඳුම් ප්‍රායෝගිකව ක්‍රියාවට නංවන්නේ නම සියළු ගැටලු සඟහා විසඳුම් ලෙහෙසියෙන් හා පහසුවෙන් ලබා

ගත හැක. කාලාන්තරයක් තිස්සේ ලොවේ පවතින ගැටුම් හා ගැටළු සඳහා ලොව සුපතල විද්වතුන් සියළු විකල්ප ප්‍රායෝගික ලෙස අත්හදා බැලුවද ඒ සියළු විසඳුම් ඉතා අල්ප ගැටළු සඟහා විසඳුම් ලබා දුන් නමුත් බොහෝ තීරණාත්මක ගැටළු සඳහා විසඳුම් ලබා දීමේ උත්සාහය අසාර්ථක වී ඇත. අද පවතින ගැටළු සඳහා විසඳුමක් ලෙස ලෝවැසියන් ඉස්ලාම් මාර්ගය සියළු ගැටළු සහ ගැටුමන් සඳහා සරණක් ලෙස තෝරා නොගන්නේ ඇයි? (F. Filweas)[1] මෙසේ සඟහන් කරයි. මෑතකදී මා විසින් නිකුත් කරන ලද ප්‍රකාශනයන්හි ශාස්ත්‍ර ඥයින් ගේ සහ ලේඛකයින්ගේ අදහස් සඳහන් කළෙමි. මේ සෑම විද්වතෙකුම ආගමික අදහස්වලින් හිරවී සිටින ජනයාට ගැලැවීමක් ලැබීම කාලීන් අවශ්‍යතාවයකි යනුවෙන් පවසති. නමුත් මෙම විද්වතුන් මුස්ලිම් බහුතරයක් වශයෙන් වාසය කරන සමාජය වටා පවතින මිණුම් දණ්ඩෙන් ඉස්ලාමය මැනීම සහ තක්සේරු කිරීම විශාල වරදක් යනුවෙන් පවසති. නමුත් ඉස්ලාම් ඔවුන් සිතනවාටත් වඩා වෙනස්වූ අංග සම්පූර්ණවූ ධර්මයකි. සෑම කාලයකටම උචිත වූ ධර්මයකි. නමුත් අවාසනාවකට මෙන් අද බොහෝ මුස්ලිම්වරුන් ඉස්ලාමීය ඉගැන්වීම් තුලින් ඈත්වී සිටින තත්ත්වයක් දැකගැනීමට හැක. බොහෝ දෙනා

---

 භ්‍රි+තාන්‍ය ජාතික ් හමුදා නිළධාරියෙක් පළමු ලෝකයුද්ධයට සහභාගිවූ කෙනෙකි. ක්‍රි+ස්තියානි සමාජයෙහි හැඳුනු වැඩුනු කෙනෙකි 1924 දී ඉස්ලාම් දහම වැළඟගත්තේය.

සිතන ආකාරයට ඉස්ලාම් එක්තරා කාලයකට හෝ වේලාවක සීමා වූ ධර්මයක් නොවේ මෙය ධර්මයක් පමණක් නොව රාජ්‍යයක් පාලනය කිරීම සඳහා සියළු පනත් නර්දේශවලින් සමන්විත වූ ධර්මයකි. අල්ලාහ් තආලා අල්කුර්ආනයෙහි සඳහන් කරන ආකාරයට

(නබි මුහම්මද්) ප්‍රඥාවෙන් සහ උතුම් උපදෙසින් නුඹගේ රබ් (පරමාදිපති) ගේ මාර්ගයට (ජනයාට) ඇරයුම් කරනු. තවද ඔවුන් සමග ඉතා හොදින් කරුණු සාකච්චා කරනු. (සූරතුන් නහ්ල් 125)

යන මෙම උපදේශනය සහ මෙම ධර්මයෙහි මූලික ඉගැන්වීම් හොදින් අධ්‍යයනය කරමින් යහපත් දේ අනුගමනය කරමින් සහ වළක්වා ඇති දෙයින් වැළැකී සිටින්නේ නම් මෙම දහම ලෝක පූජිත දහමක් වෙනවාට කිසිම සැකයක් නැත. ජාක් අස්. රෙස්ටර් මහුගේ , අරාබි ශිෂ්ඨාචාරයු යන ග+න්ථයෙහි මෙසේ සඳහන් කරයි. ඉස්ලාම් යන වචනය අර්ථ තුනකින් සමන්විත වේ එනම් එහි පළමු තේරුම ආගමයි දෙනව තේරුම රජදහනයි තෙවන තේරුම සංස්කෘතියයි. කෙටියෙන් පවසතොත් ඉස්ලාම් යනු අංග සම්පූර්ණ වූ ශිෂ්ඨාචාරයයි.

නමුත් සමහර මුස්ලිමවරුන්ගේ වැරදි ආදරශ මුල්කරගෙන එසේ වැරදි කරන මුස්ලිම්වරුන්ගේ මිණුම් දණ්ඩෙන් ඉස්ලාමය මැනීමට නොහැක.

මේ සඳහා පහත සඳහන් උදාහරණය ඉදිරිපත් කිරීමට හැක.

වාහනයක් නිශ්පාදනය කිරීමේදී එම වාහනය නිශ්පාදනය කරන කර්මාන්ත ශාලාව විසින් එම වාහනය ගමනා ගමනයෙහි යෙදවීම, නඩත්තු කිරීම, සහ එහ පැදවීම යනාදිය පිළිබඳ උපදෙස් ඇතුලත් කැටලොක් හෙවත් මාර්ගෝපදේශ පොත් පිංචක් නිකුත් කරනු ලබයි. එම වාහනය මිළදී ගත් තැනැත්තා විසින් මෙම වාහනය මගේය මා සිතන පතන ආකාරයට මෙය භාවිතා කරමි යනුවෙන් අදහස් කරමින් අදාල මාර්ගෝපදේශ පොතෙහි අදහස්වලට විරුද්ධව ක්‍රියාත්මක වන විට්දි අදාල තානැත්තා විසින් රිය පැදවීමේදි අනතුරකට භාජනය විමට හැකි අතර වාහනයටද විශාල හානියක් සිදු විය හැක. මෙවැනි අවස්ථාවක අදාල නිශ්පානද කර්මාන්ත ශාලාවට දොස්පැවැරීමෙන් පලක් නැත. දොස්පැවැරිය යුත්තේ වැරදි ලෙස සිය මනංකල්පිතය අනුව රිය පැදවූ රියදුරු මහතාටය. එබැවින් ඉස්ලාම් නමින් වැරදි ලෙස හැසිරෙන දුදනන්ගේ වැරදි නිසා ඉස්ලාමයට දොස් කීමෙන් පලක් නැත.

මුහම්මද් නබි (සල්) තරිමාණන් එතුමාගේ සමුගැනීමේ හජ් වන්දනාවේදී සිය මිතුරන් අමතා මෙසේ දේශනා කළහ

ඔබලා මෙම දිනය කුමන ආකාරයේ දිනයක්ද යනුවෙන් දන්නවාද? එවිට එතුමාගේ මිතුරන් මේ ගැන අල්ලාහ් තආලා සහ ඔහුගේ රසූල් මනාව දනී යනුවෙන් පැවැසූහ. එවිට එතුමාණන් මෙය (අකුසලයන්) තහනම් කරන ලද දිනයකි යනුවෙන් පැවැසූහ. මෙම නගරය කුමන නගරයක්ද යනුවෙන් ඔබලා දන්නවාද? යනුවෙන් ප්‍රශ්න කළහ. එවිට සිය මිතුරන් මේ ගැන අල්ලාහ් තආලා සහ අල්ලාහ්ගේ රසූල් පමණක් දනී යනුවෙන් පැවැසූහ. එවිට එතුමාණන් මෙය (සමහර ක්‍රියා) තහනමට ලක් කරන ලද නගරයකි යනුවෙන් පෙරලා පිළිතුරු දුන්හ. මෙම මාසය කුමන මාසයක්ද යනුවෙන් ඔබලා දන්නවාද? යනුවෙන් මුහම්මද් නබි තුමාණන් විසින් පැවැසූ විට  සහාබාවරුන් මේ ගැන අල්ලාහ් තආලා සහ අල්ලාහ්ගේ රසූල් පමණක් දනී යනුවෙන් පැවැසූහ. එවිට එතුමාණන් මෙය (සමහර ක්‍රියා) තහනම් කරන ලද මාසයකි යනුවෙන් පැවැසූහ. එවිට එතුමාණන් මෙම දිනයේදී මෙම මාසයේදී මෙම භූමියේදී ඔබ සැමගේ රුදිරය මිළමුදල් දේපළ සම්පත් සියල්ලක් වැනැසීමෙන් ආරකෂාව ලබා දී ඇත, යනුවෙන් පැවැසූහ.

ඉස්ලාමීය මූලික ඉගැන්වීම් අතුරින් කෙනෙකුගේ ප්‍රාණය දේපොළ මිළමුදල් බුද්ධිමහය සම්පත් හා දුබලයින් දුර්වලයින් හා අනාතයින් සඳහා ආරක්ෂාව ලබා දීම වැදගත් තැනක් ගනී.

අල්ලාහ් තආලා මෙසේ පවසයි. නීතිය පසිඳලීමේ හේතුව නිසා හැර කිසිදු මිනිස් ජීවයක් ඝාතනය නොකරන්න මෙය අල්ලාහ් විසින් තහනම් කර ඇත. ( අල් ඉස්රා 33 )

අල්ලාහ් තආලා මෙසේද සඳහන් කරයි, ඔබලා සිය දිවි නසානොගන්න අල්ලාහ් ඔබලා කෙරෙහි ආදරය දයාව දක්වයි.

ජීවිත චරිතය ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ගැන අල්ලාහ් තආලා මෙසේ සඳහන් කරයි.

“ ඔබලා දුරාචාරයට ලං නොවන්න් මන්ද එය නීච ක්‍රියාවක් හා දූෂිත මාර්ගයක්ද වේ (අල්ඉස්රා 36)

මුදල් දේපල වංචාකිරීම ගැන අල්ලාහ් මෙසේ සඳහන් කරයි. ඔබලා එකිනෙකාගේ මුදල් වංචාලෙස පරිහරණය නොකරන්න (සූරත් බකරා 188)

බුද්ධිය විකෘති වීමෙන් ආරක්ෂා වීමේ අවශ්‍යතාවය ගැන අල්ලාහ් මෙසේ සඳහන් කරයි.

සුරා පානය සූදුව ශාස්ත්‍ර බැලීම පේනබැලීම සහ වන්දනාමානය සඳහා සිටුවන ලද ස්මාරකයන් ශෂිතාන්ගේ ක්‍රියාවකි එබැවින් ඒවායින් වැලකී සිටින්න. ( අල් මාඉදා 90 - 91)

පාරම්පරික උරුමයන් දූෂණය කිරීම ගැන අල්ලාහ් තආලා මෙසේ සඳහන් කරයි.

ඔවුහු ඔබගේ ධර්මයෙන් ඈත්වූ කල්හි පොලව මත කළකෝලාහල කිරීමටද අස්වැන්න හා අනාගත පරම්පරාව වනසන්නටද උත්සක වෙති අල්ලාහ් කෝලාහල ඇති කිරීම අනුමත කරන්නේ නැත. (අල් බකරා 205)

දුබලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වැදගත් කම ගැන අල්ලාහ් 'ආලා මෙසේ සඳහන් කරයි.

"අල්ලාහ් තආලා හැර කිසිවක් වන්දනාමානය නොකරන ලෙසත් දෙමව්පියන්ට උපස්ථාන කරන ලෙසත් අල්ලාහ් අණ කරයි " ඔවුන්ගෙන් කෙනෙකු වයෝවෘද තත්වයට පත් වූයේ නම් ඔවුන් අමනා නොදකින් යන වචනයද පාවිච්චි නොකරන්න

(ඔවුන් ඔබෙන් යමක් ඉල්ලා සිටින්නේ නම්) ඔවුන් පලවා නොහරින්න. ඔවුන්ට ආදරයෙන් කරුනාවෙන් අමතන්න. ආරක්ෂකයාණෙනි! ඔවුන් අප කුඩා අවදියේදි ආදරයෙන් හදාවඩා ගත් ආකාරයට ඔවුන්ටද ආදරය දක්වන්න (අල් ඉස්රාහ් 23 )

අනාතයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳව අල්ලාහ් තආලා මෙසේ පවසයි

අනාතයින් සතු සම්පත් අසාධාරන ලෙස පරිහරනය නොකරන්න (සූරතුල් දුහා 09)

අනාතයින් සතු මුදල් ආරක්ෂා කිරීමේ අවශ්‍යතාවය ගැන අල්ලාහ් තආලා මෙසේ පවසයි

අනාතයින්ගේ මුදල් සාධාරන මාර්ගයෙහි හැර අසාධාරනය ලෙස පරිහරනය කිරීමේ අදහසින් එයට ලං නොවන්න. (අල් ඉස්රා 34)

ළමුන්ගේ අයිතිවාසිකම් පිළිබද මෙසේ සඳහන් කරයි.
සාගතයට භිය වී දරුවන් ඝාතනය නොකරන්න අප ඔබට සහ ඔවුන්හට අහාර සපයන්නෙමු ( අන්ආම් 151)

ගිලන්වූ අයගේ අයිතිවාසිකම් ගැන මුහම්මද් නබි තුමාණන් මෙසේ පවසයි.

යුද්දයකදී අත්අඩංගුවට ගත් අය නිදහස් කරන්න. කුසගින්නේ පසුවන්නන්හට ආහාර සපයන්න ගිලන්ගතව සිටින්නන්ගේ සුවදුක් විමසන්න. (හදීස්)

වැඩිහිටි අයගේ අයිතිවාසිකම් ගැන මෙසේ පවසයි

මුහම්මද් නබි තුමාණන් මෙසේ පැවැසූහ වැඩිහිටි අයට ගරු නොකරන්නාද කුඩා දරුවන්හට ආදරය නොකරන්නාද කුසලය කෙරෙහි අණ නොකරන්නාද අකුසලයන් නොවලක්වන්නාද අප සමාජයට අයත් කෙනෙකු නොවේ. (අල් හදීස්)

දුගියන්ගේ අවශ්‍යතා ඉටුකිරීම ගැන මෙසේ පවසයි (සිය අවශ්‍යතාවය ඉටුකරගැනීම සඳහා යමක්) ඉල්ලා සිටින්නන්ව පලවා නොහරින්න (අල් දුහා 10)
මුහම්මද නබි තුමාණන් මෙසේ සඳහන් කරයි “ කෙනෙකු සිය සහෝදරයාගේ අවශ්‍යතා ඉටුකරන්නේද අල්ලාහ් තආලා ඔහුගේ අවශ්‍යතා ඉටුකර දෙයි” (අල් හදීස්)

<u>ඉස්ලාමයේ ආධ්‍යාත්මික තත්ත්වය</u>

අල්ලාහ් තආලා විසින් පහළ කරන ලද ඉස්ලාම් ධර්මය එක්තරා මූලික ඉගැන්වීමකින් හා විශිෂ්ඨ ප්‍රතිපත්තියකින් යුක්ත වේ. එය ශාන්තිමත් ධර්මයකි. එය අනුගමනය කරන්නන්හට එය කෙරෙහි විශ්වාසය පිහිටුවන ලෙසත් ඒ අනුව ජීවිතය සකස්කරන ලෙසත් එය අන් අයට ප්‍රචාරය කරන ලෙසත් උගන්වයි. ප්‍රචාර කටයුතුවලදී බලහත් කාරයෙන් තොරව එය ව්‍යාප්ත කරන ලෙස දිරිගන්වයි.

මේ ගැන අල්ලාහ් තආලා අල්කුර්ආනයේ මෙසේ පවසයි " ඉස්ලාම් දහමෙහි බලහත් කිරීම් නැත එහි ධර්මය සහ අධර්මය වෙන්කර පෙන්වා ඇත. " (අල්බකරා 256)

මෙම දහම ප්‍රචාරය කරන්නන් වෙත අල් කුර්ආනය මෙසේ අවවාද කරයි.

" ආරක්ෂකයානන්ගේ දහම වෙත ප්‍රඥාවෙන් හා අලංකාර සහිත අනුශාසනාවෙන් ආරාධනා කරන්න, ඔවුන් සමග (දහම සම්බන්ධයෙන්) වාද විවාද කරන විට අලංකාර මාර්ග අනුගමනය කරන්න.

යම් කිසි කරුණක් කෙරෙහි වැටහීමක් පැහැදීමක් ඇති කරවීම ඉස්ලාම් ධර්මයෙහි මූලික ඉගැන්වීමයි,

එබැවින් බලහත් කාර ලෙස ඉස්ලාම් දහම ප්‍රචාරය කිරීම වලක්වයි මන්ද එහි ප්‍රතිපලයක් වශයෙන් සිදු වන්නේ කෙනෙකුගේ සිත්සතන් තුල නැති දෙයක් වචනයෙන් ප්‍රකාශ කරවීමට සහ කුහක කම සඳහා මග පෙන්වන ක්‍රියා වලියක් ඉස්මතු විමයි.

## කුහකකම

කුහකකම කුෆ්ර් හෙවත් ඉස්ලාමය ප්‍රතික්ෂේප කිරීමේ ගුණාංගයට වඩා පහත් ගුණාංගයක් ලෙස ඉස්ලාම් හඳුන්වා දෙයි “ (වංචනිකයින්) කුහකයින් නිරයේ පහලම ස්ථානයෙහි සිටින්නෝය ” (අන් නිසා 145)

ඉස්ලාම් දහම සහ වන්දනාමාන වත් පිළිවෙත්

ඉස්ලාමීය ඉගැන්වීම්වලට අනුව ඉස්ලාමයේ වන්දනාමාන පිළිවෙත් මුවින් ප්‍රකාශ කිරීම ගතින් ක්‍රියාවට නැංවීම හා සිතින් විශ්වාස කිරීම් යනාදි වශයෙන් වර්ග කිරීමට හැක.

ඉස්ලාම් ධර්මයෙහි විශ්වාස කළ යුතු කරුණු හය මෙසේ විස්තර කිරීමට හැක.

1. අල්ලාහ් තආලා කෙරෙහි විශ්වාසය පිහිටුවා ගැනීම - අල්ලාහ් ඒකත්වයට පත් කිරීම කොටස් තුනකින් සමන්විතය.

- පළමුව මවා පෝෂනය කරන්නාවූ ආරක්ෂකයානන් වහන්සේ ලෙස විශ්වාස කිරීම එනම් ඔහු ජීවමාන බවත් අල්ලාහ් එක්කෙනෙකු බවත් විශ්වයේ සියල්ලක්ම ඔහු විසින් නිර්මාන කරන ලද බවත් ඔහු සිතු දේ සිදුවන බවත් නොසිතු දේ නොසිදුවන බවත් විශ්වාස කිරීමයි. මේ ගැන අල්ලාහ් මෙසේ සඳහන් කරයි. " සියළු මැවීම් සහ අණ අල්ලාහ් සතුවේ ලෝකය මවා පාලනය කරන අල්ලාහ් උත්තරීතර වේ (අල් කුර්ආන්)

අල්ලාහ් තඅාලා විසින් අල්ලාහ්ගේ ඒකීයභාවය ගැන සහ අල්ලාහ් සමග තවත් දෙවියෙකු ජීවමාන වීමේ අතිශයෝක්තිය ගැනද අල්කුර්ආනයෙහි විස්තර කර ඇත. " අල්ලාහ් ඔහුට පුත්‍රයානන් කෙනෙකු තෝරාගත්තේ නැත ඔහු සමග තවත් දෙවියෙකු ජීවමානව සිටින්නේ නැත ( සූරත් මුඃමිනූන්)

- දෙවනුව වන්දනාමාන කටයුතු වලදී අල්ලාහ් ඒකීයභාවයට පත් කිරීම, එනම් අල්ලාහ් එකම සත්‍යවූ දෙවියා ලෙස සහ වන්දනාමානය කිරීමට එකම සුදුසු දෙවියා ලෙස විශ්වාස කිරීමයි. තවද සියළු වැඳුම් පිදුම් අල්ලාහ් කෙරෙහි පමණක් ඉටුකිරීම

ඔහු හැර වෙන කිසිවක් හෝ කිසිවෙකු කෙරෙහි භාර නොවීම, අපේ අවශ්‍යතායන් සඳහා ඔහුගෙන් පමණක් අයද සිටීම, නපුරෙන් අත්මිදීමටත් අවශ්‍යතාවයක් ඉටු කරගැනීමටත් අල්ලාහ් හැර වෙන කිසිවෙකුගේ පිහිටක් නොපැතීම, කිසිඳු ආකාරයක වන්දනාමානයක් පිදීමක් අල්ලාහ් හැර වෙන කිසිවෙකුට හා කිසිවකට නොකිරීම, මේ සම්බන්ධයෙන් අල්ලාහ් තආලා මෙසේ සඳහන් කරයි. " නබිවරයාණෙනි මා හැර වන්දනාමානය කිරීමට වෙන දෙවියෙකු නැත. එබැවින් මට වන්දනාමානය කරන්න යනුවෙන් ( වහී) හෙළිදරව් කරමින් හැර ඔබට පෙර වෙන කිසිඳු නබිවරයෙකු පහළ කළේ නැත. ( අල් අන්බියා 24)

- තෙවනුව අල්ලාහ්ගේ අලංකාර නාමයන් සහ ලක්ෂනයන් කෙරෙහි ඒකියත්වයට පත් කිරීම, එනම් අල්ලාහ් තආලාට උත්තරීතර අලංකාර නාමයන් ඇති බවට හා විශේෂ ලක්ෂණ ඇති බවට විශ්වාශ කිරීම හා ඒ සියල්ලක්ම කිසිඳු ඇද කුදුවකින් තොර බවට විශ්වාස කිරීම මේ ගැන අල්ලාහ් තආලා මෙසේ සඳහන් කරයි. "අල්ලාහ් තආලාට

උත්තරීතර වූ අලංකාර නාමයන් ඇත ඒ තුලින් ඔහු අමතන්න.'' (අල් අඃරාෆ් 180)

මෙම අලංකාර නාමයන් සහ ලක්ෂන අල්ලාහ් තආලා විසින් අල්කුර්ආනයේ සහ මුහම්මද් නබි තුමා විසින් දේශනා කොට වදාල කරුණු අඩංගු අල් හදීස් ග්‍රන්ථයේද ලේඛනය ගත කර ඇත. මේවා කිසිවක් අල්ලාහ්ගේ මැවීම්වලට කිසිදු ක්‍රමයකින් සමාන කිරීමට නොහැක අල්ලාහ් මේගැන මෙසේ සඳහන් කරයි. " ඔහුට සමානව කිසිවක් නැත ඔහු අසයි බලයි.: අල් ෂූරා 11)

## මලාඉකා වරුන් පිළිබඳ විශ්වාසය

අල්ලාහ්ගේ බලය යටතේ කටයුතු කරන දේව දූතයින් හෙවත් මළාඉකාවරුන් විශාල සංඛ්‍යාවක් සිටින බවත් මවුන්ගේ සංඛ්‍යාව අල්ලාහ් හැර වෙන කිසිවෙකි නොදන්නා බවට විශ්වාස කිරීම, ඔවුහු අල්ලාහ්ගේ කැමැත්ත හා අනුමැතිය අනුව අල්ලාහ්ගේ මැවුම් නිරීක්ෂණ කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කටයුතුවල නිරත වී සිටිති. අල්ලාහ් තආලා විසින් ඔවුහු විවිධ කටයුතු සඳහා පත්කර ඇත. අල්ලාහ් තආලා මේ

සම්බන්ධයෙන් මෙසේ සඳහන් කරයි, “ (අල්ලාහ්ගේ අණ අනුව) ඔවුහු සියළු කාර්‍යයන් පාලනය කරති.” (නාජිආත් : 05)

ඔවුහු අල්ලාහ් තආලා විසින් ආලෝකයෙන් නිර්මාණය කර ඇත. ඔවුහු ආලෝකයෙන් නිර්මාණය කරනු ලැබූ නමුත් අපට ඔවුහු සියසින් දැක බලා ගැනීමට නොහැක නමුත් ඔවුන්ට විවිධ වෙසින් පෙනී සිටීමට අල්ලාහ් විසින් ඔවුන්ට බලය ලබාදී ඇත, ජිබ්රීල් (අලෛ) තුමා මළාඉකා වරයෙකි ඔහු මර්යම් තුමිය අභියස මනුෂ්‍යයෙකුගේ වෙසින් පෙනී සිටියේය අල්ලාහ් තආලා මේ ගැන මෙසේ සඳහන් කරයි

ඇත්තෙන්ම මම නුඹගෙන් පරමදයාලුහු කෙරෙහි පහිට සොයමි. (එහෙයින් මට ලංනොවන්න) ඔබ බියබැතියෙන් සිටින්නේ නම්. සූරත් අල් මර්යම 18 - 19

මුහම්මද් නබිතුමාණන් විසින් ජිබ්රීල් (අලෛ) තුමාණන්ව අල්ලාහ් විසින් නිර්මානය කළ ආකාරයේ ස්වාභාවික ලක්ෂණයෙන්ම දැක බලා ගත්හ. ඔහු පිහාටු හයසීයකින් සමන්විතය ඔහු කෙරෙහි දැක්වූ ගෞරවය නිසා ජිබ්රීල් උසස් ස්ථානයක කටයුතු කරයි. මෙම මලාඉකාවරුන්

පිහාටුවලින් යුක්ත වූ අතර සමහරු පිහාටු දෙකකින්ද තුනකින්ද ඊට වඩා වැඩි ගණනකින් යුක්ත අයද සිටින බවට අල් කුර්ආනය සාක්ෂි දරයි. ඔවුහු දිවා රාත්‍රී මුළුල්ලේ අල්ලාහ් මෙනෙහි කරමින් දික්රු හෙවත් ස්තෝත්‍ර කරති. අල්ලාහ් වන්දනාමානය කිරීම මලාඉකා වරුන්ගේ අරමුණ වේ. ඒ සඳහා ඔවුන් අල්ලාහ් තආලා විසින් නිර්මාණය කරන ලදි. අල්ලාහ් තආලා සහ ඔහුගේ වක්තෘන් අතර දූතයින් ලෙසද ඔවුහු කටයුතු කළහ අල්ලාහ් තආලා මේ සම්බන්ධයෙන් මෙසේ පවසයි “ (අල්ලාහ්ගේ අණ පරිදි) රූහුල් අමීන් (හෙවත් ජිබ්රීල්) මෙය රැගෙන පහළ විය. ඔබ අනතුරු අඟවා අවවාද කරන්නෙකු ලෙස පත් වීම සඳහා ඔබේ සිත් සතන් වෙත මෙය පහළ කළේය” ( අෂ් ශුඅරා 195)

අල්ලාහ් තආලා විසින් අණ කරන ලද කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම ඔවුන්ගේ වගකීම වේ “ ඔවුනට ඉහළින් වැඩ සිටින අල්ලාහ්ට ඔවුහු බිය වෙති. ඔවුන් හට (අල්ලාහ් විසින්) අණ කරනදේ ඔවුහු ක්‍රියාත්මක කරති.

මෙම මළාඉකාවරුන්හට දූ දරුවන් නොවෙති. මේ ගැන අල්ලාහ් තආලා මෙසේ සඳහන් කරයි

“කාරුනිකයාණන් (අල්ලාහ් ඔහු සතුව) දරුවෙකු ඇති කරගත්තේය යනුවෙන් මවුහු පවසති, අල්ලාහ් අති විශිෂ්ඨය. නමුත් (මළාඉකාවරුන්) අල්ලාහ්ගේ ගෞරවනීය ගැත්තන් වේ, අල්ලාහ්ගේ වචනයේ සීමාවට ඉහළින් ඔවුහු කටයුතු කරන්නේ නැත. ඔවුහු අල්ලාහ්ගේ අණට කීකරුවී කටයුතු කරති. ( සූරතුන් නහ්ල් 50)

අල්ලාහ් තආලා විසින් සමහර මලාඉකාවරුන්ගේ නාමයන් සහ ඔවුන්ට පැවැරී ඇති කර්තව්‍යයන් ගැන විස්තර කර ඇත. ඒ පිළිබඳ විස්තර මෙසේය.

ජිබ්රීල් (අලෛ) තුමාණන් දේව හෙළිදරව් පහළ කිරීම සඳහා පත් කර ඇත. අල්ලාහ් තආලා මෙසේ පවසයි. (අල්ලාහ්ගේ අණ පරිදි) රූහුල් අමීන් (හෙවත් ජිබ්රීල්) මෙය (දේව පණිවිඩය) රැගෙන පහළ විය. ( අල් ශුර 195)

- මීකාර්ල් අලෛහි සලාම් : මෙතුමා පොලොව මත බෝගවගාවන් හා වර්ෂාව ඇති කරවීම සම්බන්ධයෙන් භාරව සිටියි.

මලකුල් මවුත් හෙවත් මිනිසුන්ගේ ප්‍රාණය අත්පත් කරන්නා, කෙනෙකුගේ මෙලොව ආයුශ කාලය අවසන් වීමේදී ඔහුගේ ප්‍රාණය අත්පත් කරගැනීමේ වගකීම මෙම මලාඉකාවරයාට පවරා ඇත.

' ඉස්රාෆීල් (අලෛ) තුමා මෙලොවේ පැවැත්මෙහි අවසානය සංකේතවත් කිරීම වස් සූර් නම් නලාව පිඹීම භාරව සිටියි.

මාලික් අලෛහි සලාම් නිරය භාරව සිටින මලාඉකාවරයාය

- අස්සබානියා නිරය ගත දනන් වෙත දඬුවම් පමුණුවීම සඳහා පත්කර ඇත.

- සෑම මනුෂ්‍යයෙකු වෙතම මලාඉකාවරුන් දෙදෙනෙකු පත් කරඇති අතර දෙදෙනාගෙන් එක් අයෙකු ඒ ඒ පුද්ගලයා විසින් කරනු ලබන කුසල් ලියා ගැනීම සඳහාද අනිත් තැනැත්තා ඔහුගේ අකුසල් ලියා ගැනීම සඳහාද පත් කර ඇත.

**<u>මලාඉකාවරුන් විශ්වාස කිරීමෙන් ලබා ගත හැකි පාඩම්</u>**

1 අල්ලාහ් තආලාගේ බලමහිමය සහ ඔහුගේ ශක්තිය අවබෝධ කරගැනීමට හැකි වීම

අල්ලාහ් අවට ඇති ඔහුගේ බලවත් නිර්මානයන් ගැන වටහාගැනීමට හැකි වීම.

2 මලාඉකාවරුන් අප අධීක්ෂනය කරමින් සිටින බැවින් ප්‍රසිද්ධියේදී මෙන්ම අප්‍රසිද්ධියේදී යහපත් දේ කිරීමට සහ අයහපත් දෙයින් වැළකී සිටීමට ඇති හැකියාව සහ අපේ කතා ක්‍රියා සියල්ලක්ම මලාඉකාවරුන් විසින් සටහන් කරන බවට ඇති විශ්වාසය.

3 අදෘශ්‍යමාන දේ විශ්වාස නොකිරීම නිසා ඉස්ලාම් ඉගැන්වීම් රාමුවෙන් පිට කටයුතු කිරීමේ ප්‍රවණතාවයෙන් වැළැකී සිටීම.

4 අප ආරක්ෂා කිරීමට සහ අධීක්ෂනය කිරීමට මලාඉකාවරුන් පත් කිරීම තුලින් අල්ලාහ් තආලා අප කෙරෙහි දක්වන කරුණාව දයාව මෙනෙහි කිරීම.

**<u>අල්ලාහ් තආලා විසින් පහළ කරන ලද ග්‍රන්ථ කෙරෙහි විශවාස කිරීම</u>**

අල්ලාහ් තආලා විසින් මිනිස් සත්ත්වයාට නිවරදි මාර්ගය පෙන්වීම සඳහා ඔහුගේ පණිවිඩ කරුවන් වෙත දේවග්‍රන්ථ පහළ කරන ලදි මෙහි අල්ලාහ් පිළිබඳ සහ ඔහුගේ රසූල්වරුන් අනුගමනය කිරීමේ අවශ්‍යතාවය ගැන අඩංගු

කර ඇත. මේ ගැන අල් කුර්ආනය මෙසේ සඳහන් කරයි.

"සත්‍යවශයෙන්ම අපි අපගේ පණිවිඩකරුවන් පැහැදිලි සාධක සමග පහළ කළෙමු මවුන් කැටුව දෙවග්‍රන්ථය සහ මිනිසුන් අතර නීතිය (සාධාරනව) පසිඳලීම සඳහා (යුක්ති) තරාදියද පහළ කළෙමු. ( අල් හදීද් 25)

මුහම්මද් නබි තුමාණන්ට පෙර අල්ලාහ් තආලා විසින් පහළ කරන ලද සියළු දේව ග්‍රන්ථ කෙරෙහි මුස්ලිම්වරුන් විශ්වාසය තැබිය යුතු අතර අල්කුර්ආනය පහළ වීමත් සමගම ඒවා අනුගමනය කිරීම අවශ්‍ය නොවේ. මන්ද ඒවා එක්තරා කාලසීමාවන් සඳහා පහළ කරන ලද දේව ග්‍රන්ථ බැවිනි. මෙම පුස්තකයන් පහළ කිරීමේ අරමුණ යහපත් දේ කිරීමට සහ අයහපත් දෙයින් වැළැකී සිටීමටයි. පුස්තයන් කෙරෙහි විශ්වාස කිරීම පහත සඳහන් කරුණු අන්තර්ගත කරයි.

1. අල්ලාහ් විසින් ඔහුගේ නබි වරුන්ට පුස්තක පහළ කලේය යනුවෙන් පරිපූර්ණ වශයෙන් විශ්වාස කිරීම.

**2. අල්ලාහ් තආලා විසින් නම් කරන ලද ඔහුගේ ආගම් එලෙසම විශ්වාස කිරීම, එනම් :-**

අල්කුර්ආනය මුහම්මද් නබි ﷺ තුමාණන් වෙත පහළ කිරීම
තව්රාත් මූසා අලෛ තුමාණන් වෙත පහළ කිරීම
ඉන්ජීල් ඊසා අලෛ තුමාණන් වෙත පහළ කිරීම
සබූර් දාවූද් වෙත පතහළ කිරීම

තවද පුස්තක කිහිපයක් ඉබ්රාහීම් වෙත පහළ කිරීම් යනාදි වශයෙන් විශ්වාස කළ යුතු වේ. අල් කුර්ආනය මෙම පුස්තක අතුරින් විශිෂ්ඨ වුවද අවසානයද වේ. එය සත්‍ය වූ ධර්මයකි, එය අනුගමනය කිරීම සෑම සමාජය කෙරෙහි අනිවාර්ය වේ. අල් කුර්ආනය සඳහන් කරන ආකාරයට අල්කුර්ආනය පහළ වීමට පෙර පහළ වූ ඉන්ජීල් හා තව්රාත් වැනි ආගම්හි විවිධ වෙනස් කිරීම් සංශෝදන සිදුකර ඇත.

**3. අල් කුර්ආනය පවසන සිද්ධීන් සහ සිදුවීම් විශ්වාස කිරීම**

**4. රසූල් වරුන් විශ්වාස කිරීම**

පොදුවේ රසූල්වරුන් කෙරෙහි විශ්වාසය පිහිටු වීම අනිවාර්ය වේ. අල්ලාහ් තආලා විසින් ඔහුට පමණක් වන්දනාමානය කිරීමට සහ ඔහුට කිසිවක් සමාන

නොතබන ලෙස අවවාද අනුශාසනා කිරීමට ඔහු විසින් රසූල්වරුන් පහළ කළ බවට විශ්වාස කිරීමත් ඔවුන් අතුරින් අවසාන රසූල්වරයා සහ ශ්‍රේෂ්ඨ වූ රසූල්වරයා මුහම්මද් නබි ﷺ තුමා බවත් විශ්වාස කිරීම අනිවාර්ය වන අතර සෑම රසූල්වරුන් කෙරෙහි පොදුවේ විශ්වාස පිහිටුවීම අනිවාර්ය වේ. තවද ඔවුන් අතුරින් නූහ්, ඉබ්රාහීම්, මූසා, ඊසා, යනාදි වශයෙන් නම් වශයෙන් අල්ලාහ් විසින් සඳහන් කරන ලද රසූල් වරුන් කෙරෙහිද විශ්වාස පිහිටු වීම අනිවාර්ය වේ. සෑම රසූල්වරුන් කෙරෙහි පහළ කරන ලද දේව පණිවිඩය සත්‍ය වූ පණිවිඩයක් ලෙස පිළිගැනීම අනිවාර්ය වන අතර මෙසේ පහළ කරන ලද දේව පණිවිඩ අතරින් කෙනෙකු එකක් හෝ ප්‍රතික්ෂේප කරන්නේද ඔහු සෑම දේව පණිවිඩයක්ම ප්‍රතික්ෂේප කරන්නෙකු වේ.

අවසන් දිනය පිළිබඳ විශ්වාස කිරීම

මරණයෙන් පසු නැවත නැගිටුවීමක් ඇත. මෙලොවේදී මිනිසා විසින් කරන ලද ක්‍රියාවන් පිළිබඳ ප්‍රශ්ණ කරනු ඇත. එදින යහපත් දේ කළ තැනැත්තාට ආනිශංසද අයපත් දේ කළ තැනැත්තාට දඬුවමද පිරිනමනු ලැබේ. මරණයෙන් පසු සිදුවන සියළු දේ ගැන අල්ලාහ් තආලා සහ ඔහුගේ රසූල් විසින් සඳහන් කර ඇති දේ ඒ සැටියෙන්ම විශ්වාස කළ යුතුය. මිනිසුන් ගේ කුසලාකුසල් කිරා ඇගයීම සඳහා කියාමත් දවසේ

මීසාන් නම් තරාදිය සකස් කෙරේ. ෂෆා අතුල් උළ්මා අති වැදගත් මැදිහත් වීම නම් විශේෂ වාරය මුහම්මද් සල්ලල්ලාහු අලෛහිව සල්ලම් තුමාණන්ට පමණක් ඇතැයි ද, කියාමත් දවසෙහි මිනිසුන්ට දරා ගත නොහැකි දුක් කරදර ඇති වීම නිසා තමන් වෙනුවෙන් අල්ලාහ් වෙත ෂෆාඅත් කරන ලෙස ඉල්ලා මුහම්මද් (ﷺ) වෙත උදව් පතා පැමිණෙති. එවිට එතුමා අල්ලාහ් ගෙන් මිනිසුන්ට කරුණාව දක්වන ලෙස ඔහු ගේ විශේෂ අනුමතිය සහිතව ෂෆාඅත් කරන බව ද විශ්වාස කරමු. නරකාදියට ඉහළින් සිරාත් නම් පාලම ඇති බවද විශ්වාස කරමු. මිනිසුන් ලොවෙහි සිදු කළ අමල්වල (ක්‍රියාවල) ස්වභාවයට අනුව එය තරණය කරති.

නබි(ﷺ) තුමාණන් ගේ (හවුළ්) ජල තටාකය ගැන ද ර්මාන තබමු. මුහම්මද් නබි (ﷺ) තුමාණන් ගේ උම්මාවට (සමාජයට) අයත් මූඃමින්වරු මෙකී තටාකයට පැමිණෙති. එයින් වරක් දිය පානය කළ කෙනෙකුට, ඉන් මතු කිසි විටෙක පිපාසය ඇති නොවන බවද විශ්වාස කරමු. අල්ලාහ් තආලා විශ්වාස කළ දනන් කියාමත් දිනයේදී අල්ලාහ් බැහැ දකින බවට විශ්වාස කිරීම අනිවාර්ය වේ. තවද සැප පහසුවෙන් පිරුණු ස්වර්ගය ගැන හා කටුක වධ වේදනා සහිත නරකාදිය පිළිබඳ විශ්වාස කිරීමද අනිවාර්ය වේ.

## කළා බද්ර්

අල්ලාහ් ස්වකීය තීක්ෂණ ඥානය සහ අනුපමේය දැනුම යටතේ විශ්ව වස්තූන් පිළිබඳ ව කර ඇති කළාබද්ර් නම් ඔහු ගේ පෙර මිණුම සැබෑ වූවක් බව ද විශ්වාස කරමු.

එනම් අල්ලාහ් සියලු දේ මැනවින් දනී. පෙර සිදු වූදේ, මතු සිදුවන දේ, සහ ඒවා සිදු වන ආකාරය යනාදිය ස්වකීය ස්ථාවර හා නොනිම් ඥානය මගින් දැන සිටී.

### සිව්වන අදියරයඃ මැවීම

අල්ලාහ් ගේ මාර්ගයෙන් සිදුවන දේ ද, ඔහුගේ ගැත්තන්ගේ මාර්ගයෙන් සිදුවනදේද, මේ සිව් අදියර තුළ දී ම සිදු වේ. එම නිසා මිනිසුන් ගේ කතා සහ ක්‍රියා ද, ඔවුන් නො කර අත්හරින දේ ද, අල්ලාහ් දනී. මේවා මෙලෙස සිදුවෙතැයි තීන්දු කොට ක්‍රියාත්මක කළේ ඔහු ය. මේවා ඔහු විසින් කලින් ම තිර්ණය කළ දේවල්ය.

මිනිසා ඕනෑම දෙයක් ස්වකීය නිගමනය පරිදි ද, අල්ලාහ් ඔහුට දී ඇති හැකියාව අනුව ද කරන බව ට සාක්ෂි රැසක් ඇත.

යනාදි පාඨ ඕනෑම ගැත්තෙකුට ඔහු කැමැති දේ කිරීමටත්, තමන්ට වුවමනා අන්දමට ක්‍රියා කිරීමටත්, හැකියාව ඇති බව පෙන්වයි.

දෙවනුව : කළ යුතු හා නොකළ යුතු දේ වශයෙන් මිනිසුන්ට අණකිරීම් සහ වැළැක්වීම් නියම කර තිබීමද මීට සාක්ෂි වේ. මන්ද යත් මිනිසාට තමා සිතන පරිදි ක්‍රියාත්මක විය හැකිය යන තත්ත්වයක් නැත්නම් මෙවැනි නියෝග පැණවීමෙන් ඔහුට කළ නොහැකි දේ කරන ලෙස නියෝග කළා වෙයි. අල්ලාහ් මෙවැනි පරශ්පර ක්‍රියාවන් කරතැයි සිතීම ඔහු ගේ දැනුම, ඥානය, කරුණාව, සහ දේශනාවන්ට පටහැණි වේ.

යහපත් ක්‍රියාවන් කළවුන්ට ඒ සඳහා ප්‍රශංසා කිරීමත්, වැරදි කළවුන්ට දොස් පැවරීමත්, මේ දෙයාකාර ක්‍රියාවන් කරන අයට ඔවුනොවුන් ගේ ක්‍රියාවට අනුව සම්මාන හෝ දඬුවම් හෝ දීමත්, මිනිසාට නිදහස ඇති බවට සාක්ෂියකි. යම් ක්‍රියාවක් මිනිසා ගේ අපේක්ෂාව සහ වෑයමෙන් තොරව සිදු වේ නම් ඒ සඳහා ඔහුට ප්‍රශංසා කිරීම

නිරර්ථක වූවකි. මෙසේම කිසියම් නරක ක්‍රියාවක් කළා නම් ඔහුට දඬුවම් දීම ද අසාධාරණ වේ. අසාධාරණ හා අනවශ්‍ය ක්‍රියාවන් සිදු කිරීම යනාදියෙන් තොරව අල්ලාහ් පවිත්‍ර වන බැවින් ඔහු අසාධාරණ ක්‍රියා නොකරයි. අනවශ්‍ය ක්‍රියා කරන්නේ ද නැත.

සිව්වෙනි කාරනාව: මිනිසා ගේ ක්‍රියා ඔහු ගේ අපේක්ෂාවන් සහ වෑයමෙන් තොරව සිදුවේ නම් රසූල්වරුන් එවා මිනිසුන් යහමගෙහි ගමන් නොකළ හේතුවෙන් එකී මිනිසුන්ට දොස් පැවරීම සාධාරණ නොවේ.

පස්වෙනි කාරනාව : සෑම මිනිසෙකු ම යම් ක්‍රියාවක් කරන විට නැත්නම් එය නොකර අත් හරින විට තමා කිසිම බලපෑමකින් තොරව එසේ කරන බව වටහා ගනී. කෙනෙකු හිඳ ගැනීම, සිටගැනීම, තැනකට පිවිසීම, එතැනින් පිටවීම, ගමන් කිරීම සහ තැනක රැඳී සිටීම යනාදි සියල්ල ඔහු සිය කැමැත්තෙන් කරයි. අන් කෙනෙකු එසේ කරන ලෙස තමන්ට බල කරන බවක් ඔහුට නොවැටහේ. එපමණක් නොව සිය කැමැත්තෙන් යමක් කිරීමත් වෙන කෙනෙකු ගේ බලපෑම් හේතුවෙන් කිරීමත් අතර ඇති වෙනස ෂරීආත් නීති රීතිවල ද අනුමත කර ඇත. අල්ලාහ් සම්බන්ධ

යුතුකම් අතරින් කිසිවක් බලපෑම් හේතුවෙන් අත්හැරීමට හෝ වැරදි ලෙස කිරීමට සිදු වුණා නම් ඒ සඳහා අල්ලාහ් ඒ මිනිසා වැරදිකරුවෙකු නොකරන බව සඳහන් කළ මතය.

පාප ක්‍රියාවල යෙදෙන්නෙකු තම ක්‍රියාවනට අල්ලාහ් ගේ අපේක්ෂාවම හේතුවෙතැයි තර්ක කිරීම වැරදිය. මන්ද යත් යම් ක්‍රියාවක් සිදු වන තාක් ඒ පිළිබඳ අල්ලාහ් ගේ අපේක්ෂාව කුමක් දැයි අල්ලාහ් හැර අන් කිසිවෙක් නොදනිති. එම නිසා යම් පාප ක්‍රියාවක් කරන්නෙකු එය ඔහු ගේ පෞද්ගලික අපේකෂාව අනුවම සිදු කරනවා විනා එය අල්ලාහ් ගේ අපේක්ෂාව වශයෙන් දැන කරනවා නොවේ. එම නිසා කිසියම් ක්‍රියාවක් කරන විට ඒ සඳහා වන හේතුව කුමක්දැයි නොදැන සිටි කෙනෙකු එකී හේතුව පසුව දැන ගත් පසු තමන් කළ ඒ ක්‍රියාව එකී හේතුව සඳහා ම කළා යැයි තර්ක කිරීම නුසුදුසු වේ. මෙවැනි තර්ක වැරදි බව අල්ලාහ් ද පහත සඳහන් ලෙස දක්වයි.

“අල්ලාහ් අපේක්ෂා කර තිබුණා නම් අප ද අප ගේ මුතුන් මිත්තන් ද අල්ලාහ්ට කිසිවක් ආදේශ නො කරන්නට ඉඩ තිබුණි. (අනුභව කළහැකි ) කිසිවක් (අකැප යැයි) තහනම් නොකරන්නට ද ඉඩ තිබුණි’යි ආදේශ පිහිටුවා නමදින මොවුහු

පවසති. (නබිවරයාණෙනි! ) මෙලෙසම ඊට කලින් සිටි අය ද අපගේ වධ වේදනා විඳින තාක් (නබිවරුන් ) බොරුකාරයින් කළහ. එම නිසා ඔබ ඔවුන් අමතා මීට ඔබ වෙත කිසියම් සාක්ෂියක් ඇත්ද, ඇත්නම් එය අපට ඉදිරිපත් කරන්න. ඔබ විසින් ම මනඃකල්පනය කර ගත් (ඔබ ගේ) වැරදි අදහසෙහි ගිලී සිටිනවා විනා වෙන කිසිත් නැතැයි පවසන්න. (148)

අල්ලාහ් ගේ අපේක්ෂාව හේතුවෙන් ම තමා අකුසල් ක්‍රියා කළායැයි කියන්නන් අමතා මෙසේ පැවසිය හැක. ඔබ යහපත ම කළ යුතු යැයි අල්ලාහ් අපේක්ෂා කරන බව සිතා ඔබ යහපත් දෙය නොකළේ මන්ද? මක්නිසාද යත් අල්ලාහ් ගේ අපේක්ෂාව කුමක් දැයි ඔබ දැන ගැනීමට පෙර ඔහු අයහපත ම අපේක්ෂා කරතැයි තීරණය කිරීම වරදක් නොවේද? එය ඔබ කෙසේ දන්නේ දැ'යි අප විසින් විමසිය හැකි නොවේද?

පරලොවහි දී සැම දෙනෙකුට ම හිමි තැන ස්වර්ගයේ පිහිටා ඇත්ද නැත්නම් අපායෙහි පිහිටා ඇත්ද යන්න කලින් ම තීරණය කරන ලද බව වරෙක නබි (ﷺ) තුමෝ තම සහාබාවරුන්ට පැවසූහ. මෙය ඇසූ ඔවුහු තත්ත්වය එසේනම් අල්ලාහ්ගේ අපේක්ෂාව අනුව සිදුවෙතැයි පවසමින් යහපත් ක්‍රියා ඉටු කිරීමට තැත් නොකොට

නිකරුනේ සිටියා නම් මොකදැයි ඔවුහු විමසූහ. නැතැ ඔබ සත්ක්‍රියා කරන්න. මන්ද කෙනෙකු මවනු ලැබ සිටින්නේ කුමක් සඳහා ද ඊට අනුකූල ලෙස ක්‍රියා කිරීම ඔහුට පහසු බව වැටහේ යැයි නබි (ﷺ) තුමෝ හිතවතුන්ට විස්තර කළහ.

අල්ලාහ් ගේ (කද්ර්) නිර්ණය සමාවට හේතුවක් කර ගෙන කතා කරන්නන් ගෙන් මෙසේ ප්‍රශ්න කළ හැකිය. “ඔබ මක්කාවට යාමට තීරණය කරතැයි සිතන්න. එහි යාමයට මාර්ග දෙකක් ඇත. එකක් කටුක හා අවදානම් සහිත වේ. අනෙක පහසු හා ආරක්ෂා සහිත යැ’යි ඔබ ගේ ගෞරවයට පාත්‍ර වන කෙනෙකු ඔබට කීවා නම් ඔබ යන්නේ පළමු මාවතෙන් නොව දෙවැනි මාවතෙන් නොවේද? ඔබ එසේ නොකර සිදුවෙන දෙයක් සිදුවුනාදෙන් මොකද අල්ලාහ් ගේ අපේක්ෂාව අනුවම හැම දෙයක්ම සිදුවෙතැයි පවසමින් අවධානම් සහිත පළමු මාවතෙන් ගමන් කළා නම් මිනිසුන් ඔබට පිස්සෙකැ’යි නොකියනු ඇත්ද?

ඔබට වැඩි වැටුප් සහිත රැකියාවක් සහ අඩු වැටුප් සහිත රැකියාවක් ලැබීමේ අවස්ථාව සැලසී ඇත්නම් ඔබ අඩු වැටුප් සහිත රැකියාව පසෙකලා වැඩි වැටුප් සහිත රැකියාව නොවේද තෝරා ගන්නේ?

ලෞකික කටයුතුවලදී එසේ ක්‍රියා කරන ඔබ ආඛිරත් (මරණින් මතු ජීවිතය පළිබඳ කරුණුවලදී) පමණක් අල්ලාහ් ගේ අපේක්ෂාව හේතුවක් කර ගනිමින් කුසල් හීන ක්‍රියාවල යෙදුණා නම් එය යෝග්‍යදැයි අපට විමසිය හැකිය.

අල්ලාහ් ගේ අපේක්ෂාව අනුව ම තමා පාප කර්මවල යෙදෙන බව පවසමින් තම පාප කර්මවලට සාධාරණත්වයක් ආරූඪ කරන්නෙකු ගෙන් අපට මෙසේද විමසිය හැකිය. ඔබට අසනීපයක් වැළැඳුණා නම් ඔබට හැකි සියලුම වෛද්‍යවරුන් වෙත යනවා නොවේද? වෛද්‍යවරයා දෙන අමිහිරි බෙහෙත් බොන විටත්, ශල්‍ය කර්ම අවස්ථාවේ දීත් ඔබට ඇති වන සියලු ම දුක්වේදනා ඉවසා දරා ගන්නවා නොවේද? මෙසේ වන ඔබ පරලොව ජීවිතයට සම්බන්ධ අසනීපයට ප්‍රතිකාර කිරීමේදී පමණක් ඉවසා දරා ගැනීමට අසමත් වන්නෙහිය.

අල්ලාහ් ඉතා කාරුණික හා පිරුණු නැණ නුවණ ඇත්තා වන බැවින් අකුසල් දොස්වලට ඔහුම හේතුවෙතැයි අපි විශ්වාස නොකරමු. දොස්වලට ඔබ හේතු නොවේ යැයි නබි (ﷺ) තුමාද පවසා ඇත. අල්ලාහ් ගේ අපේක්ෂාව ඔහු ගේ කරුණාව හා ඥානය යනාදිය මත පවතින නිසා ඔහු ගේ

නිර්ණය කිසි විටෙක නරකක් නොවන බව අප ගේ විශ්වාසයයි.

එම නිසා අල්ලාහ් ගේ නිර්ණය (කළා) නරකක් වශයෙන් නොපවතී. ඔහු විසින් නිර්ණය කරන ලද ක්‍රියාවන පමණක් එසේ නරකක්වේ. නබි (සල්)තුමා හසන් (රලියල්ලාහු අන්හු) තුමාට කියා දුන් කුනූතයේ "වකිනී ෂර්ර මා කළයිත " ඔබ(කළා) නිර්නය කර ඇති දේවල දොස්වලින් මා රැක ගන්නැයි සඳහන්වේ. මෙහි දොස් යන්න අල්ලාහ් ගේ නිර්ණයෙහි නැත; නමුත් ඔහු නිර්ණය කළ වස්තුවෙහි ඇති බව පැහැදිළි කර ඇත. තවද අල්ලාහ් විසින් නිර්නය කරන ලද දේවලින් සිදුවන දොස් සැබැවින් දොස් නොවේ. මන්ද එය එක්තරා අන්දමකින් දොසක් වුවත් වෙනත් අන්දමකින් සලකන කල යහපතක් විය හැකිය. නැත්නම් නිශ්චිත අවස්ථාවක නරකක් වශයෙන් පෙනෙන දෙය, වෙනත් අවස්ථාවක හොඳක් වනු ඇත.

එම නිසා ලොවේ ඇති වන නියඟ, වසංගත, සාගත සහ භීෂණ යනාදිය එක්තරා අන්දමකින් අයහපත් දේ වශයෙන් පෙනුනත් වෙනත් දෘෂ්ඨිකෝණයකින් ඒවා යහපත සලසන ඒවා වේ.

මෙහි දී මිනිසුන් තමන් කළ දුෂ්ක්‍රියාවල විපාක විඳීමේ ප්‍රතිපලයක් වශයෙන් එවැනි ක්‍රියාවලින් බැහැර වීමට ඔවුන් පොළඹවනු ලබන බව පැහැදිලි කෙරේ.

සොර දෙටුවන්ගේ අත් කපා දැමීමේ සහ දුරාචාරයෙහි යෙදුණු අයට ගල් ගසා මරා දැමීම යන නියායෙහි සොරාට තම අත් අහමි වීම සහ දුරාචාරියා ගේ ප්‍රාණය නැති වීම යන දඬුවම් ඔවුන් ගේ පැත්තෙන් ඔවුන්ට බලපාන දේවල් ය. එහෙත් මෙබඳු දඬුවම් ඔවුන් කළ අපරාධ ක්‍රියාවට වන්දි ගෙවීමක් වන බැවින් මෙලොවෙහි දී ඔවුන්ට එය බලපෑවත් පරලොවෙහි දඬුවම්වලින් ඔවුහු ආරක්ෂා වනනෝය. මේ අනුව එකී දඬුවම් ඔවුන්ට යහපතක්ම වන්නේය. වෙනත් අන්දමකින් සලකා බලන විට මෙවැනි දඬුවම් නිසා සෙසු මිනිසුන් ගේ දේපළ ගෞරවය සහ පරම්පරාව යනාදිය ආරක්ෂා වන බැවින් ද අන් අයට මෙය පාඩමක්ද වන බැවින් එකී දඬුවම්වලින් යහපතක් ම සැලසේ.

ඉහත සඳහන් කළ උතුම් අකීදාවන් සියල්ල ඒවා විශ්වාස කරන්නන්ට ශ්‍රේෂ්ඨ යහපතක් සැලසීමට ඉවහල්වේ.

ඉස්ලාම් ධර්මයෙහි වන්දනාමාන ශේත්‍රය සඳහා විශේෂ ස්ථානයක් ලබා දී ඇත ඒවා පස් මහ වගකීම් යටතේ විස්තර කිරීමට හැක.

## පස් මහ වගකීම

### පළමු වගකීම
### ලාඉලාහ ඉල්ලල්ලාහ් යන්නෙහි අර්ථය

(ලාඉලාහ ඉල්ලල්ලාහ්) අල්ලාහ් තආලා හැර වන්දනාමානය කිරීමට වෙනත් දෙවියෙකු නැත යන මෙම වදන ස්වර්ගයේ යතුර වේ. සෑම යතුරකටම දැති අවශ්‍ය වන අතර දැති නොමැති යතුරකින් කිසිවක් විවෘත කිරීමට නොහැක.

එබැවින් (ලාඉලාහ ඉල්ලල්ලාහ්) නැමැති ශුද්ධවූ වදන සඳහාද දැති ඇත. එහි දැති වූ කලී එහි කොන්දේසියයි.

**1 එහි අදහස අවබෝධකරගැනීම**

එනම් සත්‍ය වශයෙන්ම වන්දනාමානය කිරීමට සුදුසු තත්ත්වය අල්ලාහ් හැර වෙනත් ව්‍යාජ දෙවිවරුන්ගෙන් බැහැර කොට එය අල්ලාහ් තආලාට පමණක් ස්තිරව හිමි කර දීමයි.

අල්ලාහ් තආලා මෙසේ පවසයි.

එබැවින් දැනගන්න. අල්ලාහ් තආලා හැර වන්දනාමානය කිරීමට වෙනත් (කිසිම) දෙවියෙකු නොමැත. **(සූරත් මුහම්මද් 19)**

මෙම විශ්වයෙහි සත්‍ය වශයෙන්ම වන්දනාමානයට යෝග්‍ය සුදුසු තත්ත්වය අල්ලාහ් තආලාට හැර වෙන කිසිවෙකුට නැත. මුහම්මද් නබි ( ﷺ ) තුමාණන් මෙසේ වදාලහ. අල්ලාහ් තආලා හැර වන්දනාමානය කිරීමට වෙනත් දෙවියෙකු නැත යනුවෙන් අවබෝධ කරගනිමින් කෙනෙකු මිය යන්නේ නම් ඔහු ස්වර්ගයට පිවිසේ.

## 2 සැකයකින් තොරව ස්ථිර කර ගැනීම

එනම් මෙම වදන සිත් සතන් තුලින් සැකැයකින් තොරව පිළිගත යුතුයි. අල්ලාහ් තආලා මෙසේ ප්‍රකාශ කරයි.

"සත්‍ය විශ්වාස වන්තයින් කවුරුන්ද යත් ඔවුහු අල්ලාහ් සහ ඔහුගේ රසූල් කෙරෙහි විශ්වාසය පිහිටුවා පසුව ඒ කෙරෙහි කිසිදු සැකයක් ඇති නොකරති."(අල්හුජ්රාත් 15)

මුහම්මද් නබි (ﷺ) තුමාණන් මෙසේ වදාලහ. . අල්ලාහ් තආලා හැර වන්දනාමානය කිරීමට වෙනත් දෙවියෙකු නොමත සත්‍ය වශයෙන්ම මම අල්ලාහ්ගේ පණිවිඩ කරුවෙක්ය යනුවෙන් සැකැයකින් තොරව සාක්ෂි දරන තත්ත්වයෙහි ඕනෑම කෙනෙකු අල්ලාහ් බැහැදකින්නේද ඔහු ස්වර්ගයට පිවිසීම වලක්වන්නට නොහැක.

**3 එහි පරමාර්ථය සිතෙන් හා වචනයෙන් පිළිගැනීම**
අල්ලාහ් තආලා විසින් ආදේශ කරන්නන්ගේ තත්ත්වය ගැන සඳහන් කිරීමේදී මෙසේ පවසයි.

අල්ලාහ් තආලා හැර වන්දනාමානය කිරීමට වෙනත් සත්‍ය දෙවියෙකු නැත යනුවෙන් ඔවුන්ට පැවසූ කල්හි ඔවුහු උද්දාමයට පත් වූහ. (සූරත් අස්සාෆ්ෆාත් 35)

ඉබ්නු කසීර් රහ්මතුල්ලාහ්ගේ අදහස අනුව ඉහත සඳහන් වදනෙහි අර්ථය මෙසේය. උද්දාමයට පත්වූහ යනුවෙන් පවසන ලද්දේ විශ්වාසවන්තයින් විසින් ප්‍රකාශිත දේ බැහැර කරමින් අහංකාරයට පත් වූ බැවිනි. මිනිසුන් විසින් අල්ලාහ් තආලා හැර වන්දනාමානය කිරීමට වෙනත් දෙවියෙකු නැත යනුවෙන් පවසන තුරු සටන් කරන මෙන් මා අණකරනු ලැබ ඇත. නැමදුමට සුදුස්සාවූ අල්ලාහ්

තආලා හැර වෙනත් දෙවියෙකු නැත යනුවෙන් කිසිවෙකු විසින් ප්‍රකාශ කරන ලද්දේ නම් ඔහු විසින් ඉස්ලාමයේ වෙනත් අයිතීන්හි සීමාව ඉක්මවා නොයන තුරු ඔහුගේ සේසත් සහ ඔහුගේ ප්‍රාණය මාවිසින් ආරක්ෂාකරනු ලබන්නේය. ඔහු පරීක්ෂණයට පත් කිරීම අල්ලාහ්ට භාරවී ඇත.

**4 අවනත භාවය දැක්වීම**

ඔබසැම ඔබලාගේ දෙවිඳුන් වෙතට යොමුවී ඔහුටම සම්පූර්ණයෙන් අවනත භාවය දක්වන්න. (**Zසුමර් 54**)

***5 සත්‍යවන්ත භාවය, ව්‍යාජ තත්ත්වයෙන් බැහැර වීම,***

මෙම කලිමා සිත් සතන් තුලින් සත්‍ය ලෙස ප්‍රකාශයට පත් කිරීම, අල්ලාහ් තආලා මෙසේ ප්‍රකාශ කරයි .

*"අප විශ්වාස කළෙමු" යැයි පැවැසීම නිසා පමණක් ඔවුහු පිරික්සනු නොලබා අත් හැර දමනු ලබන්නෝ යැයි මනුෂ්‍යයෝ සිතන්නෝද? සත්‍යවශයෙන්ම අපි ඔවුන්ට පෙර විසූවන්ද*

*පිරික්සුවෙමු, අල්ලාහ් සත්‍යවාදීන් ගැන දන්නේමය අසත්‍යවාදීන් ගැනද දන්නේමය. (අන්කබූත් 2,3)*

මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ පැවැසූහ. අල්ලාහ් තආලා හැර වන්දනාමානය කිරීමට වෙනත් දෙවියෙකු නැත යනුවෙන්ද *මුහම්මද් නබි* ﷺ තුමාණන් අල්ලාහ් තආගේ පණිවිඩ කරුවෙකුය. යනුවෙන්ද නිර්මල සිතින් කෙනෙකු සාක්ෂි දරන්නේද ඔහුට අල්ලාහ් තආලා නිරය තහනම් කරන්නේය. (බුහාරි මුස්ලිම්)

***6 පිවිතුරු චේතනා***

*සියළු සමානයන් තැබීමේ තත්ත්වයෙන් බැහැර වෙමින් එහි සෙවන පවා අප තුල නොගැවෙන සේ පිවිතුරු චේතනාවෙන් යුක්තව අපේ යහපත් ක්‍රියා පවිත්‍ර කරගැනීම. අල්ලාහ් තආලා මෙසේ පවසයි..*

وَمَا أُمِرُوا إِلَّا لِيَعْبُدُوا اللَّهَ مُخْلِصِينَ لَهُ الدِّينَ (5) ***سورة البينة***

*(අල්ලාහ් උදෙසා සිය වන්දනාමානය) සුවිශුද්ධ කරමින් අල්ලාහ් නැමදිය යුතයි යනුවෙන් හැර*

*(වෙනත් කරුණක් ගැන) ඔවුහු අණකරනු නොලද්දෝය. (සූරත් අල්බයියිනා 5)*

මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ පැවැසූහ. ***(ලාඉලාහ ඉල්ලල්ලාහ්)*** යන වදන පවිත්‍ර චේතනාවෙන් පවසන්නේ කවරෙක්ද ඔහුම මගේ ෂෆාඅත් හෙවත් මගේ මැදහත් වීමට ඉතා සුදුස්සෙකු වේ. (බුහාරි මුස්ලිම්)

තවද පැවැසූහ කෙනෙකු අල්ලාහ් තආලා උදෙසා . ***(ලාඉලාහ ඉල්ලල්ලාහ්)*** යන වදන පවසන්නේද ඔහුට අල්ලාහ් තිරය තහනම් කරන්නේය. (මුස්ලිම්)

**7 දයාව හා ලීලාව**

මෙම ශුද්ධවූ වදන කෙරෙහි ලැදියාවක් දැක්වීම අවශ්‍ය වේ. මෙම වදනින් විදහ දක්වන පණිවිඩය අප සිත් තුල පැල්පදියම් කරගනිමින් ඒ අනුව අප ජීවිතය හැඩගස්වා ගත යුතුය. තවද මෙහි කොන්දේසි සුරකිමින් සිය ජීවිතය හැඩගස්වා ගන්නා ජනයා කෙරෙහිද දයාව හා ලීලාව දැක්විය යුතුයි.

තවද මිනිසුන් අතර අල්ලාහු හැර ඔහුට සමානයන් කරගනු ලැබූ දෙය දෙවියකු වශයෙන් පත් කරගනිමින් අල්ලාහුට ප්‍රිය කරන්නාක් මෙන් ප්‍රිය කරන අයද සිටිති, විශ්වාස කරන අය අල්ලාහුට ප්‍රිය කිරීමෙහිලා ඉතා දැඩිය. (සූරත් බකරා 165)

මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ පැවැසූහ. කෙනෙකු තුල ගුණාංග තුනක් දක්නට ලැබෙන්නේද ඔහු (ඊමාන්) විශ්වාසයේ රසය හොඳින් හඳුනාගත් තැනැත්තාය.

1 සියළු දෙයට වඩා අල්ලාහ් සහ ඔහුගේ රසූල් කෙරෙහි ආදරය දැක්වීම

2 අල්ලාහ් උදෙසා පමණක් කෙනෙකු තවත් කෙනෙකුට ආදරය කිරීම

3 (කුෆ්ර්) ප්‍රතික්ෂේප කිරීමෙන් අල්ලාහ් ඔහුට විමුක්තිය ලබා දීමෙන් පසු ගින්නෙහි වීසි කිරීම අප්‍රිය කරන්නේ යම්සේද එසේම ප්‍රතික්ෂේප කිරීමද අප්‍රිය කිරීම

***8 අල්ලාහ් හැර වන්දනාවට ලක් කරන (තාගූතයන්) ප්‍රතිකෙෂ්ප කිරීම සහ අල්ලාහ් පමණක් සත්‍යවූ දෙවියෙකු සේ පිළිගැනීම***

අල්ලාහ් තආලා මෙසේ සඳහන් කරයි.

ඉස්ලාම්හි බල කිරීමක් නැත ඇත්තෙන්ම දුමාර්ගයෙන් සත්මාර්ගය පැහැදිලි කර ඇත. යමෙක් තාගූත් ප්‍රතිකෙෂ්ප කොට අල්ලාහු ගැන විශ්වාස කරන්නේද ඔහු බිඳී නොසිඳෙන මිට මොළුවා අත්පත් කර ගත්තේය. එය නොසැලෙන්නේමය. අල්ලාහ් (සියල්ල) අසන්නේය (සියල්ල) දන්නේය. (බකරා 256)

මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ පැවැසූහ.

කෙනෙකු අල්ලාහ් තආලා හැර වන්දනාමානය කිරීමට වෙන කිසිවෙකු නොමැත යනුවෙන් පවසා අල්ලාහ් හැර වන්දනාමානයට ලක් කරන සියල්ලක්ම ප්‍රතිකෙෂ්ප කරන්නේ නම් ඔහුගේ ස්සත් සහ රුදිරය අනුන්ට (හරාම්) තහනම්ය. ( මුස්ලිම්)

## معنى محمد رسول الله

## *මුහම්මදුර් රසූලුල්ලාහ් හි තේරුම*

මෙහි අර්ථය වනුයේ, නබිනායක තුමා අල්ලාහ් තආලා විසින් එවන ලද ඔහුගේ දූතයා (රසූල්) වශයෙන් විශ්වාසය කිරීමයි. එතුමා පැවැසූවේ කුමක්ද එය විශ්වාස කළ යුතුයි. එතුමා අණ කළ දේ කෙරෙහි යටහත් භාවය දැක්විය යුතුයි. එතුමා වැලක්වූ දෙයින් වැලකී සිටිය යුතු අතර එතුමා පෙන්වා දුන් ආකාරයට අල්ලාහ්ට අවනත බාවය දැක්විය යුතුයි. තවද එතුමා අවසාන පණිවිඩකරුවෙකු වශයෙන්ද එතුමා විසින් ගෙන ආ පණිවිඩය මිනිස් ජින් දෙවර්ගයටම පොදු වූ එකක් වශයෙන්ද විශ්වාස කළ යුතු අතර මුහම්මද් නබි ﷺ තුමාණන් විසින් අණ කළ දේ සහ වැළැක්වූ දේ කෙරෙහි ගරුත්වයක් දක්වමින් ඒවා ක්‍රියාවට නංවමින් එම ධර්මය සුරැකීමටද කැප විය යුතුයි. මන්ද ලාඉලාහ ඉල්ලල්ලාහ් යන වදනහි නියමාර්ථය නිසියාකාරව ප්‍රකාශ කරන ලද්දේ එතුමා විසිනි. එතුමා පොදුවේ සියළු ජන කොටස් අමතා ස්වර්ගය පිළිබඳ සුභාරංචිය පැතිරවූ අතර නිරය පිළිබඳ අනතුරු ඇඟවීම්ද කළහ. එතුමා අල්ලාහ්ගේ අවසරයෙන් මිනිසුන් අල්ලාහ්ගේ මාර්ගය වෙත ආරාධනා කරන්නෙකු හා ප්‍රභාෂ්වර එළිය

විහිදවන්නෙකු වශයෙන් මෙලොවට අල්ලාහ් තආලා විසින් එවන ලදි.

## නබි ﷺ තුමාණන් කෙරෙහි අපේ යුතුකම්

1 එතුමා සත්‍යවූ කෙනෙකු ලෙස තහවුරු කිරීම

ඔහු මනෝමය හැඟීමෙන් කථා නොකරන්නේය.

2 එතුමා අනුගමනය කිරීම

පවසන්න, ඔබලා අල්ලාහ් ප්‍රිය කරන්නෙහුනම් මා අනුගමනය කරවු. අල්ලාහ් ඔබ ප්‍රිය කරන්නේය. ඔබලාගේ පව් ක්ෂමා කරන්නේය අල්ලාහ් ක්ෂමාව දෙන්නේය ඔහු දයාලුය. (ආල ඉම්රාන් 31)

අල්ලාහ්ගේ පණිවිඩකරු වෙත ඔබලාට අලංකාරවූ ආදර්ශයක් ඇත. (අහ්සාබ් 21)

පවසන්න, මනුෂ්‍යයෙනි ඇත්තෙන්ම මම ඔබ සියල්ල වෙත අල්ලාහ්ගේ රසූල්වරයෙකු වෙමි. අහස්හි සහ පොළොවෙහි පාලනබලය හිමිවන්නේ ඔහුටමය, ඔහු හැර දෙවියෙක් නැත. ඔහු ජීවය දෙන්නේය, ඔහු මරණය පමුණුවන්නේය. එබැවින් අල්ලාහ් සහ (ලියන්නට හා කියවන්නට නොහැකි) උම්මි නබිවරයා වූ ඔහුගේ මෙම පණිවිඩකරුවානන් විශ්වාස කරව්. ඔහු කවරෙක්ද යත් ඔහු අල්ලාහ්

සහ ඔහුගේ වදන් විශ්වාස කරයි. (එබැවින්) ඔබලා සෘජු මාර්ගය ලබා ගැනීමට ඔහු අනුගමනය කරන්න. (අල් අඃරාෆ් 158)

### 3 දයාව ලීලාව දැක්වීම

නබිවරයාණෙනි! විශ්වාසවන්තයින්ට පවසන්න ඔබලාගේ පියවරුද ඔබලාගේ පුත්‍රයන්ද ඔබලාගේ සහෝදරයන්ද ඔබලාගේ ඔබලාගේ භාර්යාවන්ද ඔබලාගේ ඥාතීන්ද ඔබලා එක්රැස්කළ සේසත්ද අලාභවේයයි ඔබලා බියවන වෙළඳාම්ද ඔබලා ප්‍රිය කරන නිවාසයන්ද අල්ලාහ්ටද ඔහුගේ රසූල්වරයාටද ඔහුගේ මාර්ගයෙහි පරිත්‍යාගවන්ත වීර්යයන්ටද වඩා ඔබලාට ප්‍රිය වී නම් අල්ලාහ් ඔහුගේ විනිශ්චය පමුණුවන තුරු මග බලාපොරොත්තුවෙන් සිටිනු. අල්ලාහ් අවැඩ කරන ජනතාව යහමග නොපමුණුවන්නේය. ( අත්තව්බා 24)

මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ පැවැසූහ. තමන්ගේ පියවරුන් තමන්ගේ දූ දරුවන් හා අනිකුත් ජනයන්ට වඩා කෙනෙකුට මා සෙනෙහසට පාත්‍ර වූ කෙනෙකු වන තුරු ඔබලා අතරින් කිසිවෙකු විශ්වාසවන්තයින් වීමට නොහැකිය. (බුහාරි මුස්ලිම්)

**4 මුහම්මද් නබි ﷺ තුමාණන් පෙන්වා දුන් ආකාරයට අල්ලාහ්ට වැඳුම් පිදුම් කිරීම**

ඔහු මනෝමය හැඟීමෙන් කථා නොකරන්නේය. (සූරතුන් නජ්ම්)

මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ පැවැසූහ. අප විසින් අණ නොකරන ලද ක්‍රියාවක් කෙනෙකු විසින් කරන්නේද එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රසූල්වරයාට යමෙක් කීකරුවීද ඇත්තෙන්ම ඔහු අල්ලාහුට කීකරු වූයේය. යමෙක් හැරී ගියේද ඔහුට ආරක්ෂකයෙකු වශයෙන් ඔබව අප පත්නොකරමු. (අන් නිසා 80)

5 අල්ලාහ්ගේ රසූල්ට හිරිහැර නොකිරීම අල්ලාහ් තආලා මෙසේ පවසයි.

මෙම නබි වරයාට කුමක් පැවැසුවද එය ඔහු අසා සිටින්නේයැයි පවසා නබිවරයාණන්හට දුක්ගැහැට කරන්නන්ද සිටිති. (නබිවරයාණෙනි! පවසන්න) නබිවරයා එසේ (ඔවුන් තෙපලන බස් වහරය) සවන්දීම ඔවුන්ට යහපතක් ම වේ. ඔහු අල්ලාහ් විශ්වාස කරයි, තවද ඔබලා අතර විශ්වාස කරනවුන්

කෙරෙහි දයාව දක්වයි. එබැවින් අල්ලාහ්ගේ රසූල්ට දුක්ගැහැට කරන්නන් කවරෙක්ද ඔවුන්ට වේදනාත්මක දඬුවම් ඇත. ( අත් තව්බා 61)

මෙහිදී දුක්ගැහැට දීම යනු නබි ﷺ තුමාණන්ටද අල්ලාහ්ගෙන් එතුමා ගෙන ආ ආගමටද එතුමාගේ මග පෙන්වීමටද එතුමාගේ පවුලේ උදවියද මූමින්වරුන්හට මැතියන් සේ පෙනී සිටින එතුමාගේ භාර්යාවරුන්ටද එතුමාගේ මිත්‍රවරුන්ටද ඔවුහු හිරිහැර කිරීමයි.

6 නබි ﷺ තුමාණන් කෙරෙහි සලාත් සහ සලාම් කීම

නිසකවම අල්ලාහ්ද ඔහුගේ මලාඉකාවරුන්ද නබිවරයානන් වෙත සලවාත් අශිර්වාද කරන්නෝය. විශ්වාස වන්තයිනි! ඔහුට ආශිර්වාද කරවු, තවද බෙහෙවින් (සලාම් ) සාමය පවසවු (සූරතුල් අහ්සාබ් 56)

නබි ﷺ තුමාණන් පැවැසූ බව අබූ හුරෛරා රලියල්ලාහු අන්හු තුමාණන් මෙසේ වාර්තා කරයි.

කෙනෙකු මට එක් වරක් සලවාත් කියන්නේද අල්ලාහ් ඔහුට දහවතාවක් ආශිර්වාද පතයි. (ග්‍රන්ථය මුස්ලිම්)

**ඉස්ලාම් ධර්මයේ දෙවනි වගකීම සලාත් ඉටුකිරීම**

- අල්ලාහ් තආලා ඉබ්රාහීම් නබි අලෙ තුමාගේ වාග් මාර්ගයෙන් මෙසේ සඳහන් කරයි

***මගේ ආරක්ෂකයාණෙනි! මා හා මගේ පරම්පරාවෙන් පැවැත එන්නන් සලාත් ඉටුකරන්නන් බවට පත් කරනු මැනවි. (සූරත් ඉබ්රාහීම් 40)***

- අල්ලාහ් තආලා මූසා අලෙ අමතා මෙසේ ප්‍රකාශ කළේය.

***මා සිහි කරනු වස් සලාත් ඉටු කරන්න ( තාහා 41)***

- අල්ලාහ් තආලා ඊසා අලෙ තුමාණන්ගේ වාග් මාර්ගයෙන් මෙසේ සඳහන් කරයි

***මා ජීවතුන් අතර සිටින තුරා සලාතය ඉටු කරන ලෙසද සකාතය ප්‍රදානය කරන ලෙසද අනුසාසනා කළේය (මර්යම් 31)***

- ***නිසකවම සලාතය විශ්වාසවන්තයින් සඳහා කාල වේලාව නියම කරන ලද්දෙකි (අන් නිසා)***

## සලාතයේ වැදගත්කම

***සත්තකින්ම සලාත් නින්දා සහගත දේ හා පිළිකුල් ක්‍රියා වළක්වයි (අන්කබූත් 45)***
***සලාතය නිසියාකාරව (ඉටුකරමින්) එය ඔවුහු ආරක්ෂාකරන්නෝද ඔවුහු ස්වර්ගයෙහි ගෞරවයට පාත්‍රවන්නහුය. (අල් මආරිජ් 34,35)***
***අනස් රලියල්ලාහු අන්හු තුමාණන් මෙසේ වාර්තා කරයි: මුහම්මද් නබි ﷺ තුමාණන්ට එතුමාගේ මිහ්රාජ් ගමනේදී පනස් වේලේ සලාතය අනිවාර්ය කරන ලදි. පසුව පස්වේලේ සලාතය දක්වා අවම කරන ලදි. පසුව ඕ මුහම්මද් යනුවෙන් ආරාධනා කරන ලද අතර මාගේ වචන වෙනස් නොවේ, මෙම පස්වේලේ සලාතය පනස් වේලේ සලාතයෙහි ප්‍රතිඵලය ලබා දෙයි.*** යනුවෙන් ප්‍රකාශ කරනු ලැබිනි. (බුහාරි මුස්ලිම්)

*මුහම්මද් නබි* ﷺ තුමාණන් පවසනු මා ඇසුවෙමි. යනුවෙන් අබූ හුරෛරා රලියල්ලාහු අන්හු මෙසේ ප්‍රකාශ කරයි. කෙනෙකුගේ නිවස ඉදිරිපිට ගඟක් ගලා යනබව සිතාගන්න. එහි ඔහු දවසකට පස්වතාවක් ජලස්නානය කරන්නේ නම් ඔහුගේ ගතහි කුණු රැදේවිද? යනුවෙන් *නබි* ﷺ තුමාණන් විචාලේය. ඔහුගේ ගතහි කුණු

තැවැරෙන්නේ නැත යනුවෙන් සහාබාවරුන් පිළිතුරු දුන්හ. පසුව *මුහම්මද් නබි* ﷺ තුමාණන් මෙසේ පැවැසූහ. මේ ආකාරයට පස්වේලේ සලාතය තුලින් අල්ලාහ් තආලා පව් කමා කරන්නේය. ( බුහාරී මුස්ලිම්)

***අබූ හුරෛරා රලියල්ලාහු අන්හු*** තුමාණන් වාර්තාකරන හදීසයක මෙසේ සඳහන් වේ.

***නැවත*** නැගිටුවන (කියාමත්) දිනයේදී කෙනෙකුගෙන් ප්‍රථමයෙන් අසනු ලබන ප්‍රශ්නය සලාතය පිළිබඳවයි ඔහු එය යහපත් ලෙස ඉටුකළේ නම් ඔහු ජයග්‍රාහනය ලබා විමුක්තියද ලබා ගනී. ඔහු එය විනාශ කළේ නම් ඔහු පරාජයට පත්වී පරිහානියට ලක් වෙයි. ( අහ්මද් තබරානි)

***මුහම්මද් නබි ﷺ තුමාණන් පැවැසූ බව බුරෛදා රලියල්ලාහු අන්හු මෙසේ සඳහන් කරයි.***

*අප සහ කිෆිර්වරුන් අතර* තිබෙන්නාවූ සම්මුතිය සලාතයයි. එය අත්හරින්නේ කවරෙක්ද ඔහු ප්‍රතික්ෂේප කරන්නෙකු වේ. ( අහ්මද් )

**<u>තෙවන වගකීම අස් සZකාත්</u>**

"තවද, සලාත් කරන්න, සකාත් දෙන්න" ( අන් නූර් 56)

<u>සකාතය හැඳින්වීම :</u> සකාත් යනු අනිවාර්ය දීමනාවකි. එය නිශ්චිත කාලයකදී නියමිත භාණ්ඩවලින් නියමිත පංතියක් සඳහා ප්‍රධානය කළ යුතුයි.

<u>සකාත්හි ප්‍රයෝජන</u>

1. අල්ලාහ්ට අවනත වීමේ හා ඔහුගේ අණ පිළිපැදීමේ ආශිර්වාදයෙන් වස්තූන් පවිත්‍ර කිරීම, පුළුල් කිරීම හා ඒවා රැකීම.

2. ලෝභකමින් හා තණ්හාවෙන් මිනිස් සිත පිරිසිදු කිරීම

3. දුප්පත් නිර්ධන අසරණ හා අවාසනාවන්ත මිනිසුන්ගේ අවශ්‍යතා ඉටුකිරීම.

<u>දියයුතු වස්තු හා ඒවායේ නිසාබ්.</u>

1. රන් රිදී (රත්‍රංවල නිසාබ් වලට සමාන මූල්‍යමය ආධාර.) 2 වාණිජමය කොටස්, මූල්‍යමය ආධාර වල නිසාබ් පරිදිමය.3. පශුසම්පත් 4. අස්වනු (සියළුම ගබඩාකරන ලද ධාන්‍ය)

<u>සකාත් ආධාරවල ප්‍රයෝජන ලබන්නෝ</u>

අල්ලාහ් තආලා මෙසේ පවසයි: "සකාත් දියයුත්තේ අල්ලාහ්ගේ අණපරිදි නිර්ධන දනන්ටද අසරණයන්ටද එය එකතු කිරීමට යොදවන්නන්ටද ඉස්ලාම් වෙතට සිත්යොමුවූ අයටද[24] වහලුන් නිදහස්කිරීමටද, ණය වී ඇති අයටද, අල්ලාහ්ගේ මාර්ගයෙහිද, මගීන්ටද වේ. තවද අල්ලාහ් සියල්ල දන්නේය, ඥාණාන්විතය. (අත් තව්බා 9:60)

1 දුප්පතුන්

2 අසරණයන්

3 සකාත් ආධාර එකතුකරන හා ඒවායේ වාර්තා තබාගන්නා අය (ඔවුන්ට වැටුප් නැතිනම්)

4 සකාත් ආධාරවලින් කොටස් දීමෙන් ඉස්ලාම් කෙරෙහි පැහැදීමක් ඇති වේ යැයි බලාපොරොත්තු වනු ලබන මිනිසුන් හෝ මුස්ලිම්වරුන්ට හානිදායකය දේ කිරීමෙන් වලකාගැනීමට හෝ ඔවුන් මුස්ලිම්වරු ලෙස දිරිමත්ව සිටිනු පිණිස හෝ ඔවුන්ගේ අනුගාමිකයින් දිනාගනු පිණිස ප්‍රධානය කිරීම.

5 තම ස්වාමීන් සමග ගිවිසාගෙන ඇති පිරිමි හෝ ගැහැණු වහලුන් නිදහස් කරගැනීම සඳහා

6 ණය කරුවන් ඔවුහු දෙආකාරය 1) මිනිසුන් අතර සමගිය ඇතිකිරීම සඳහා උත්සාහ කිරීමේදී ණය කරුවන් බවට පත් වූ අය. 2) පුද්ගලික ණය

හේතුවෙන් ණයකරුවන්ට ගෙවා ගැනීමට නොහැකිව සිටින අය.

7. අල්ලාහ්ගේ මාර්ගයෙහි නිරතව සිටින්නන්
මෙය අල්ලාහ්ගේ මාර්ගයෙහි සටන් කරනවුන් සඳහා සහ හජ් වන්දනාවෙහි යෙදීමට කැමති එහෙත් මූල්‍යමය අඩුපාඩු ඇතිඅය

8. මඟීන් මුදල් අඩුපාඩු මත අතරමංවූ සංචාරකයින්

## <u>සිව්වන වගකීම රමදාන් මාසයේ උපවාස ශීලයේ යෙදීම</u>

අල්ලාහ් තආලා මෙසේ වදාරා ඇත.

විශ්වාසවන්තයිනි! ඔබලා ශ්‍රද්ධාවන්තයි වනු වස් ඔබලාට පෙර විසූවන් කෙරෙහි උපවාස ශීලය අනිවාර්යය කරනු ලැබුවාක් මෙන් ඔබලාටද උපවාසය අනිවාර්ය කර ඇත. (අල් බකරා 183)

<u>උපවාස ශීලය හැඳින්වීම :</u>

අළුයම ෆජ්ර් වේලාවේ සිට ඉර බැස යන මඃරිබ් වේලාව දක්වා ආහාර පාන සහ උපවාස ශීලය නිශ්ඵල කරන සියළු දෙයින් වැළැකීමෙන් අල්ලාහ් තආලා වෙනුවෙන් කරන නැමදුමක් හෙවත් ඉබාදතයක් වේ.

<u>උපවාස ශීලයෙහි මහිමය</u>

අබූ හුරයිරා රලියල්ලාහු අන්හු තුමාණන් වාර්තා කරන හදීසයක මෙසේ සඳහන් වේ. අල්ලාහ් තආලා පැවැසූ බව මුහම්මද් නබි ﷺ තුමානන් මෙසේ වදාල සේක.

ආදම්ගේ පුතුගේ සියළු ක්‍රියා ඔහු සතුය. උපවාස ශීලය හැර. උපවාස ශීලය මා සතුය ඒ සඳහා මා ආනිසංස ලබා දෙමි. උපවාස ශීලය (නපුර වළක්වාලන) පළිහකි. තවද කෙනෙකු උපවාස ශීලයේ නිරතව සිටින කෙනෙකුට දොස් පවරන්නේ නම් හෝ ඔහු සමග දඹර කර ගන්නේ නම් " මම උපවාසය රකිමි " යනුවෙන් පවසත්වා! මුහම්මද් නබි ﷺ තුමානන්ගේ ප්‍රාණය කාගේ හස්තයෙහි ඇත්තේද ඔහු කෙරෙහි දිවුරා පවසමි, උපවාසය රකින්නාගේ මුවින් පිටවන සුවඳ කස්තුරි සුවඳට වඩා සුවඳවත්ය. උපවාස ශීලයේ නිරතව සිටින කෙනෙකුට දෙයාකාර සතුටක් ඇත. එනම් උපවාසයෙන් මිදෙන අවස්ථාවේදී උපවාසයෙන් මිදීම කෙරෙහි හටගන්නා සතුට අනික උපවාසය තුලින් (මරණින් මතු දිනයේදී) අල්ලාහ් දකින අවස්ථාවේදී හටගන්නා සතුට (ග්‍රන්ථය : බුහාරි මුස්ලිම්)

<u>උපවාසයේ ප්‍රයෝජන</u>

1 සියළු දෙයකටම වඩා අල්ලාහ් සුබ්හානහු තආලාට අවනත වීම
2 තක්වා හෙවත් බියබැති කම ඇති කරගැනීමට පුහුණුවක් ලබා ගැනීම (අල්ලාහ් අණකළ දේ පිළිගැනීමටද අල්ලාහ් වැළැක් වූ දෙයින් බැහැර වීමටද හැකි වේ.)
3 තවද ඉවසීම, පිවිතුරු චේතනා යනාදී උසස් ගුණාංග මෙම උපවාසය වර්ධනය කරයි.

<u>උපවාස ශීලය නිෂ්ඵල කරන කරුණු</u>

1 ආහාර පාන ගැනීම, දුම්පානය
2 ආහාර පානවලට සමාන දේ ශරීරයට ඇතුල් කර ගැනීම
3 උවමනාවෙන්ම වමනය කරගැනීම
4 ලේ අධික ලෙස පිට කිරීම
5 ඔසප්වීම හෝ ප්‍රසව රුධිරය පිටවීම
6 අතින් පිරිමැද කරන ශුක්‍රමෝචනය
7 කායික සංසර්ගය

<u>ඊද් ෆිතර් දානය</u>

1 සාඅ් ප්‍රමාණයක් දීම : සාඅ් යනු කි. ග්‍රෑම් 3 ක් පමණ ප්‍රමාණයකි, තමන් වාසය කරන ප්‍රදේශය

තුල පොදුවෙ ජනයා ආහාර සඳහා ලබාගන්නා හාල් හෝ වෙනත් ධාන්‍ය වර්ග ප්‍රධානය කළ යුතුයි.
2 ලොකු කුඩා සෑම මුස්ලිමෙකුම දුගී දුප්පත් දනන්ට ප්‍රධානය කළ යුතුයි.
3 රද් ෆිත්ර් උත්සව දිනයේ දවසකට හෝ දවස් දෙකකට පෙර දීමට හැක. එනමුත් රද් උත්සවය වෙනුවෙන් අඬහඬ දුටු වේලාවේ පටන් රද් ෆිතර් සලාතය දක්වා වූ කාලයට පෙර ප්‍රධානය කිරීම වැදගත් වේ.

## පස්වැනි වගකීම හජ් ඉටු කිරීම

තවද කවරෙකු හෝ එහි ගමන් කිරීමට ශක්තිය ලබා සිටින්නේද ඔවුන් කෙරෙහි අල්ලාහ් උදෙසා හජ් වතාවත් ඉටු කිරීම අනිවාර්ය වේ. (ආල ඉම්රාන් 97)

### 1 හජ් ඉටු කිරීමේ අරමුණ

ආඉශා රලියල්ලාහු අන්හා දැනුම් දෙන හදීසයක මෙසේ සඳහන් වේ. මුහම්මද් නබි ﷺ තුමානන් මෙසේ වදාල සේක.
කාඃබාව වටා තවාෆ් (වටේ ගමන්) කිරීම, සෆා මර්වා අතර ඇවිදීම, ජම්රාත්හි ගල් ගැසීම, අල්ලාහ්

සිහිකිරීම වස් ඇති කළ මෙහෙයන් වේ. ( අබූ දාවූද් අත් තිර්මිදී)

## <u>2 හජ්හි වැදගත්කම</u>

හජ් සමය තුල කායික සංසර්ගයෙහි නොයෙදී අනෙකුත් පාප කර්මයන්හි නොනියළී කෙනෙකු හජ් මෙහෙය අල්ලාහ් වෙනුවෙන් ඉටු කරන්නේද ඔහු (තම සියලු පාපයෙන් නිදහස්වී) මවකගේ කුසෙන් එදින උපන් බිළිඳෙකුගේ තත්තවයට පත්වෙයි. (බුහාරී, මුස්ලිම්)

මුහම්මද් නබි ﷺ තුමානන් මෙසේ වදාල සේක. එක් උම්රා මෙහෙයක් තවත් උම්රා මෙහෙයක් දක්වා වූ කාලය අතර තුර පාපකර්මයන් සඳහා වූ නිවාරණයකි. අනුමතවූ හජ් මෙහෙයට ස්වර්ගය හැර වෙනත් පිනක් නැත. (ග්‍රන්ථය : බුහාරී)

## <u>3 හජ්හි ප්‍රයෝජන</u>

1 අල්ලාහ්ට අවනත වීම
2 එක්සත්කම ලෝකයාට ගෙනහැර දැක්වීම
3 විනිශ්චය කරනු ලබන (අවසන්) දින සිහිපත් කිරීම

## ඉස්ලාම් ධර්මයෙහි දක්නට ලැබෙන විශේෂත්වය සහ සුවිශේෂ ලක්ෂණ

ඉස්ලාමීය ඉගැන්වීම් අනුව ඉස්ලාම් දහම අල්ලාහ් තආලා විසින් පහළ කරන ලද ආගම් අතර අවසානය වන අතර ඉන් පසු කිසිදු ආගමක් අල්ලාහ් තආලා විසින් පහළ කරන්නේ නැත. එබැවින් අල්ලාහ් තආලා විසින් මෙම ඉස්ලාමය මෙලොවෙහි අවසන් දිනය උදාවෙන තුරු සෑම කලකටම සෑම අවස්ථාවකටම සහ ඕනෑම රටකට දේශ ගුණයට සරිලන ආගමක් වශයෙන් එහි කල්පැවැත්ම සුරක්ෂිත කර ඇත.

ඉස්ලාම් දහමෙහි දක්නට ලැබෙන විශේෂත්වය පහත සඳහන් ආකාරයට විස්තර ඇත.

ලෝකවාසී සත්තවයා නිවරදි මාර්ගයට යොමු කිරීම සඳහා අල්ලාහ් තආලා විසින් කාලයෙන් කාලයට ඔහුගේ පණිවිඩකරුවන් හෙවත් රසූල්වරුන්ගේ මාර්ගයෙන් ඔහුගේ දහම පහළ කළ අතර මෙම ධාර්මිය ක්‍රියාවලියෙහි ආරම්භය නූහ් (අලෛ) තුමාගෙන් ආරම්භ වී මුහම්මද් නබි තුමාණන්ගෙන් අවසන් විය. මුහම්මද් නබි තුමාණන් මේ සම්බන්ධයෙන් මෙසේ දේශනා කළහ. මා සහ මට පෙර විසූ නබිවරුන් සඳහා වූ උපමාවට උදාහරනයක් නම් එක්තරා ගෘහ නිර්මාණ

ශිල්පයෙකු විසින් අලංකාර අංගසම්පූර්ණ ගොඩනැගිල්ලක් තනා නිම කරන ලද අතර එහි එක් ස්ථානයක පමණක් සිදුරක් දක්නට ලැබිනි. මෙම නිවස නැරඹූ සැම දෙනෙකු විසින් පවසන ලද්දේ එම ස්ථානයද ගලකින් වසා නිමකර අංග සම්පූර්ණ අලංකාරයක් ලබා දිය යුතු බවයි. එබැවින් එම ගොඩනැගිල්ලේ පැවති සිදුර වසන ලද්දේ මා විසිනි, එමෙන්ම රසූල්වරුන් පහළවීමේ ක්‍රියාවලියෙහි (අවසානයාද එහි) අවසන් මුද්‍රාවද මමයි. නමුත් ඊසා අලෛ තුමාණන් අවසාන කාලායේදී නැවැත පොළොව මත පැමිණ මෙලොවෙහි යුක්තිය සර්ව සාධාරනව පසිඳලයි, ඔහු විසින් නව ආගමක් මොලොව ප්‍රචාරය කිරීමකින් තොරව ඔහු විසින් මුහම්මද් නබි තුමාණන් වෙත පහළ වූ ආගමට අනුකූලව කටයුතු කරමින් සාධාරනය ඉටු කරයි. අල්ලාහ් තආලා විසින් පහළ කරන ලද සියළු රසූල්වරුන් අල්ලාහ් තආලාගේ ඒකීයත්වය ඔහුට පමණක් වන්දනාමානය කිරීම, ඔහුට සමානව කිසිවක් සමාන නොකිරීම, අල්ලාහ් තආලා සහ ඔහුගේ ගැත්තන් අතර කිසිදු මැදිහත් කරුවෙකු පත් නොකිරීම යන ප්‍රතිපත්තීන් මෙලොව ස්ථාපිත කිරීම කෙරෙහි ජනයාට ආරාධනා කළහ. අල්ලාහ් තආලා මේ ගැන මෙසේ සඳහන් කරයි.

"නුඹට ඔහු හෙළිදරව් කළේ කුමක්ද එය ඔබට දහමක් වශයෙන් පත් කළේය. නබිවරයාණෙනි ඔබට අපි දේවහෙළිදරව් තුළින් දැනුම් දෙන දේ

සහ ඉබ්රාහීම්, මූසා, ඊසා, යන අයට අප අවවාද කරන්නේ කුමක්ද යත් ඔබලා මෙම දහම (ශක්තිමත් ලෙස) ස්ථාපිත කරන්න එහි ඔබලා (පිල්වලට) නොබෙදෙන්න යනුවනි. ( අශ්ෂූරා )

ඉසලාම් දහම හෙළිදරව් කිරීමත් සමගම ඉස්ලාමයට පෙර අල්ලාහ් තආලා විසින් පහළ කරන ලද සියළු දහම් අවලංගු කරන ලදි. මෙම දහම අවසාන දහමක් බවට පත් කළේය. මේ ගැන අල්ලාහ් තආලා අල්කුර්ආනයේ මෙසේ පවසයි.

"සත්‍ය වූ මෙම දහම අප ඔබට පහළ කළෙමු මෙම දහම මීට පෙර පහළවූ දහම් සත්‍ය කරයි තවද ආරක්‍ෂා කරයි." (අල් මාඉදා 48)

මෙම දහම අවසානවූ දහමක් බැවින් ලොව පවතින තුරා එය ආරක්‍ෂා කරන බවට අල්ලාහ් තආලා විසින් පොරොන්දු වී ඇත. මේ ගැන අල්ලාහ් තආලා මෙසේ පවසයි. " මෙම දහම අප විසින් පහළ කරන ලදි එය අප ආරක්‍ෂා කරමු (අල් හිජ්ර් 09)

ඉහත සඳහන් කරුණු අනුව ඉස්ලාම් දහමෙහි අල්ලාහ්ගේ පණිවිඩ කරුවා මුහම්මද් නබි තුමා බවත් ඔහු අල්ලාහ්ගේ අවසාන නබි වරයෙකු බවත් ඔහුගෙන් පසු කිසිදු නබි වරයෙකු පහළ නොවන බවත් පැහැදිලි වේ.

කෙසේ නමුත් මුස්ලිම් වරුන් විසින් මුහම්මදි නබි තුමාට පෙර අල්ලාහ් විසින් මූසා ඊසා වැනි නබිවරුන් වෙත පහළ කරන ලද ආගම් අදාල නබි වරුන් කෙරෙහි ඊමාන් පිහිටුවීම අනිවාර්ය වන අතර ඒවා ප්‍රතිකෙෂ් කිරීම ඉස්ලාමයෙන් බැහැර වීමට හේතුවක් වේ. මේ ගැන අල් කුර්ආනය මෙසේ පවසයි. " අල්ලාහ් සහ ඔහුගේ ධර්ම දූතයින් ප්‍රතිකෙෂ්ප කර, අල්ලාහ් සහ ඔහුගේ ධර්ම දූතයින් අතර වෙනසක් භුවා දැක්වීමට අදහස් කරමින් අපි ඇතැම් අය පිළිගෙන සෙසු අය ප්‍රතික්කෙෂ්ප කරමුයි පවසා (විශ්වාස හා අවිශ්වාස වන) ඒ අතර මැදි පිළිවෙතක් සොයන අය, සැබැවින්ම ප්‍රතික්ෂේප කරන්නෝය. ( අන් නිසා 150 - 151 )

ඉස්ලාමයට පෙර පහළ වූ දහම් දිවි ගමනේ ආධ්‍යාත්මික පැත්ත ගැන පමණක් කථා කරන දහම් සහ සිත් සතන් පවිත්‍ර කරන දහම් වශයෙන් එදා සමාජය තුල ක්‍රියාත්මක විය. නමුත් ඉස්ලාම් එලොව මෙලොව ආධ්‍යාත්මික ආර්ථික සමාජීය හා දේශපාලන යන සැම කෙෂ්ත්‍රයක් ගැන ප්‍රකට විය.

"අද දින මම නුඹලා වෙනුවෙන් නුඹලාට නුඹලාගේ ආගම සම්පූර්ණ කළෙමි. තවද නුඹලාගේ දීන් (ජීවන රටාව) වශයෙන් ඉල්ලාමය සතුටින් තෝරා දුනිමි. (අල් මාඉදාහ් 03)

පමම හේතුන් නිසා ඉස්ලාම් ශ්‍රෙෂ්ඨ දහමක් බවට පරිවර්තනය වී ඇත. අල්කුර්ආනය මෙසේ පවසයි.

මනුෂ්‍ය වර්ගයා (ගේ මාර්ගෝපදේශකත්වය) සඳහා පත් කරනු ලැබූ උසස්තම සමාජය නුඹලාය. (නුඹලා) යහපත් දේ අණ කරන්නෙහුය. අයහපත් දේ වළක්වන්නෙහුය. තවද අල්ලාහ් ගැනද විශ්වාස කරනනෙහුය. දහම් ලැබූ ජනයාද විශ්වාස කළේ නම් එය වඩාත් ඔවුන්ගේ යහපත පිණිස වන්නේය. ඔවුන් අතුරින් කොටසක් විශ්වාසිකයෝය. එහෙත් බොහෝ දෙනා අනර්ථකාමීහුය.

ඉස්ලාම් යනු ජාත්‍යන්තර ධර්මයකි. එය මිනිසා අමතා අවවාද අනුශාසනා කරන දහමකි. ඉස්ලාම් අභියස කළු සුදු යන බේදයක් නැත සෑම ප්‍රදේශයකටම සෑම කාලයකටම උචිත ධර්මයකි. එහි වෙනස් කිරීමක් හෝ සංශෝදනයක් අවශ්‍ය වන්නේ නැත. එබැවින් ඉස්ලාම් නමැති කොඩිය යටතේ එක්රැස් වීමට නම් තිබිය යුතු එකම කොන්දේසිය අල්ලාහ් තආලා, ඉස්ලාම් හා මුහම්මද් නබි ﷺ තුමාණන් විශ්වාස කිරීමයි. මේ ගැන අල්ලාහ් තආලා මෙසේ පවසයි.

**"සුභාසිංශනය පවසන්නෙකු වශයෙන් හා අනතුරු අඟවන්නෙකු වශයෙන් ලෝකවාසි ජනයාට පොදුවේ ඔබ පහළ කළෙමු."** (සබා 28)

මුහම්මද් නබි ﷺ තුමා හැර නූහ්, හූද්, සාලිහ්, ලූත්, ශුඅයිබ්, මූසා සහ ඊසා (අලෛහිම් සලාම්) යන නබිවරුන් ඒ ඒ සමාජයට හා යුගයට සුදුසු ආකාරයට පහළ කරන ලදි.

ඉස්ලාම් දහමෙහි ඇති අතිකුත් විශේෂත්වය නම් විනය ගරුක නීති ගරුක සමාජයක් උදෙසා සම්පාදනය වී ඇති එහි නීති රීති සියල්ලක්ම සෑම කාලායටම සහ සෑම තරාතිරමක මිනිසුන් සඳහා සුදුසු වීමයි. මේ ගැන අල්ලාහ් මෙසේ පවසයි.

"(ඔවුන් දේව නීතියෙන් බැහැර යන්නේ) ජාහිලිය්යත් (අඥාන) කාලයේ නීති අනුව විනිශ්චය කරනු ලැබීමට කැමැති නිසාද? (නමුත්) ස්ථිර විශ්වාසික ජනයාට අල්ලාහ්ට වඩා යහපත් විනිශ්චයකාරයකු කවරකුද? (අල් මාඉදා 50)

ඉස්ලාම් දහමට අනුව කාලායාගේ ඇවෑමෙන් ඉස්ලාම් උගන්වන සලාත් සකාත් සවම් හජ් වැනි වන්දනාමාන ක්‍රම කිසිවිටක වෙනස් නොවේ. විසඳිය යුතු ඕනෑම ගැටළුවකදී සහ ප්‍රශ්නයකදී ඒ සඳහා විසඳුම් අල්කුර්ආන් මාර්ගයෙන් හෝ අල් හදීස් මාර්ගයෙනද් එසේත් නැතිනම් මෙම මූලාශ්‍ර දෙක මුල්කරගෙනද එසේ මෙම මූලාශ්‍ර දෙක තුලින් ලබා ගැනීමට නොහැකි අවස්ථාවක මෙම මූලාශ්‍ර පදනම් කර ගෙන ඉස්ලාම් විශාරදයින්ගේ අදහස් සමීක්ෂනය කර තීරණයක් ලබා ගැනීමට හැක.

ඉස්ලාමීහි නීති රීති මිනිසා දුෂ්කර තත්වයට පත් කරන්නේ නැත. නොවැළැක්විය හැකි හේතූන් නිසා සුළු වැරදි සිදු වීම් හෝ ඒ සඳහා සමාවදීම් සමාජයේ ලොකු තනතුරක් මුලිකුපුටා දැමීමට කෙනෙකුගේ පෞද්ගලික වාසිය කැපැ කිරීමට සිදුවීම් වැනි සිද්ධන්තද ඉස්ලාමය විසින් හඳුන්වා දී ඇත.

ඉස්ලාමීහි නීති ක්‍රියාත්මක කිරීමේදී පොහොසතා දුප්පතා පාලකයා පාලිතයා යනුවෙන් කිසිදු වෙනසක් දක්නට ලැබෙන්නේ නැත. මේ සඳහා පහත සඳහන් සිදුවීම කදිම නිදසුනක් ලෙස ගෙන හැර දැක්වීමට හැක.

වරක් අරාබි සමාජයේ වැදගත් වංශයකට අයත් උසස් පවුලේ කෙනෙකු විසින් බරපතල සොරකමක් සිදු කළ අතර ඔහුට හිමි විය යුතු දඬුවම වළක්වනු පිනිස එතුමාගේ සහාබාවරුන් සොරදෙටුවා වෙනුවෙන් මැදිහත් වූහ. එවිට මුහම්මද් නබි ﷺ තුමාණන් ඔවුන් අමතා මෙසේ පැවසූහ. ඔබලා උත්සක වනුයේ අල්ලාහ් තආලාගේ දහම් සීමාවන් ඉක්මවා යන ආකාරයට මැදිහත් වීම් කිරීමටද? යනුවෙන් පවසා පසුව මෙසේ දේශනා කළහ. මනුෂ්‍යයිනි! ඔබලාට පෙර විසූ සමාජයන් විනාශයට පත් වීමට හේතුව මෙයයි, ඔවුන්ගේ සමාජයේ බලවත් කෙනෙකු සොරකම් කළ විටක දඬුවම් නොදී නොසලකා හැරියහ නමුත් දුබලයකු

සොරකම් කල විටක එය වැදගත් වරදක් කොට සලකා ඔහුට දඬුවම් කළහ. එබැවින් පවසම් මුහම්මද් නම් මගේ දියනිය වූ ෆාතිමා සොරකම් කළද ඒ සඳහා ඇයගේ අත සිදලීමට පසුබට නොවෙමි.

ඉස්ලාම් දහමෙහි කිසිදු වෙනසක් හෝ අඩු වැඩි කිරීමක් සිදු කිරීමට අවශ්‍ය නැති ආකාරයට ඉස්ලාම් දහම පහළ වී ඇත. එහි පදනම අල්කුර්ආනය සහ අල් හදීසයයි.

අල්කුර්ආනය යනු ඉස්ලාමයේ පළමු මූලාශ්‍රයයි, එය අල්ලාහ් තආලා වෙතින් මුහම්මද් නබි ﷺ තුමා වෙත පහළ වූ දේව ග්‍රන්ථයකි. එය එක්වතාවකදී සම්පූර්ණයෙන්ම පහළ නොවූ අතර කාල වේලාව අනුව හා මුහම්මද් නබි තුමාගෙන් අසනු ලැබූ ප්‍රශ්න සඳහා විසඳුමක් වශයෙන් සූළු වශයෙන් වදන් බැගින් සූළු පරිච්ඡේද බැගින් පහළ විය. අල් කුර්ආනය මුහම්මද් නබි තුමා වෙත පහළ වූ සෑම අවස්ථාවකදීම එය කුත්තාබුල් වහී හෙවත් දේව හෙළිදරව් ලියා ගන්නන් විසින් ලියා තබන ලදි. එපමනක් නොව මුහම්මද් නබි තුමාණන් විසින් දේශනා කරන ලද " ඔබලා අතරින් ශ්‍රේෂ්ඨවන්තයා අල්කුර්ආනය හදාරා එය අන් අයට කියා දෙන්නාය' 'මෙවැනි දේශනා කෙරෙහි අවධානය යොමුකල සහාබාවරුන් හා සහාබා කාන්තාවන් විසින් එය වනපොත් කරන ලදි. මේ ආකාරයට අල් කුර්ආනය

පහළවූ දා පටන් අද දක්වා සුරක්ෂිතව පවත්වා ගනු ලැබේ.

ඉස්ලාමයේ දෙවන මූලාශ්‍රය අල් හදීස් හෙවත් මුහම්මද් නබි තුමාගේ කතා ක්‍රියා හා සම්මතයන් අන්තර් ගතවූ ග්‍රන්ථයයි. එය මුහම්මද් නබි තුමාගේ සත්‍ය වූ මධු වදන් වලින් සමන්විතයි. එම හදීස් අල්කුර්ආනයේ අර්ථ විවරණයක් ලෙස හඳුන්වා දිමට හැක. මෙම හදීසයේ නිර්මලභාවය ආරක්ෂා කිරීමෙහිලා ඉස්ලාමීය විද්වතුන් විශාල වශයෙන් ඇප කැප කිරීමක් කර ඇත.

ඉස්ලාම් ධර්මයේ ඇති විශේෂත්වය නම් මෙලොවෙ සිටින සියළුම මනුෂ්‍යයින් අල්ලාහ් විසින් නිර්මානය කල බවට ඇති සිද්ධාන්තයයි. අල්ලාහ් තආලා විසින් ප්‍රථම වරට මවන ලද මිනිසා ආදම් (අලෛ) තමා වන අතර මිනිස් සංහතියේ පියාය. පළමු කාන්තාව ආදම්ගේ භාර්යාව වන අතර ඇය මිනිස් සංහතියේ මවයි. එබැවින් ඉස්ලාමීය ඉගැන්වීම් අනුව ලොවේ සැමා එකම මවකගෙන් පියකුගෙන් පැවැත එන්නෝ වෙති මේ ගැන අල්කුර්ආනය මෙසේ පවසයි.

“මිනිසුනි! එකම ආත්මයකින් නුඹලා මවා එයින්ම නුඹලාගේ සහකාරියද මවා එම දෙදෙනාගෙන් අනන්ත අප්‍රමාණ පුරුෂයින්ද ස්ත්‍රීන්ද (ලොවපුරා) පැතිර වූ රබ් (පරාධිපති)ට බියබැතිමත් වනු.

ඔහුගේ නාමයෙන් නුඹලා එකිනෙකා (තම උරුමය) ඉල්ලා සිටින අල්ලාහ්ට බිය වනු. ලේ උරුමය (කඩ කිරීම) ගැනද බිය වනු. නියතවශයෙන්ම අල්ලාහ් නුඹලා ගැන සුපරීක්ෂාකාරීව සිටින්නෙහිය. (අන් නිසා 1)

- ඉස්ලාමීය ඉගැන්වීම් අනුව ලොව ආරම්භයේ මිනිසුන්ගේ දහම එකක් විය. ඔවුන් කථා කල භාෂාව එකක් විය. නමුත් කාලයාගේ ඇවෑමෙන් ජනසංඛ්‍යාව වැඩිවීමත් සමගම සහ ලොවේ අස්සක් මුල්ලක් නැර සංක්‍රමනය වීමේදී ඔවුන්ගේ වත් පිළිවෙත් සියල්ලක්ම වෙනස් වීම ආරම්භ විය. මෙහිදී ඔවුන්ගේ ජීවන ක්‍රමයෙහි සහ චින්තනය තුල විපර්යාශයක් ඇති විය මේ ගැන අල්කුර්ආනය මෙසේ සඳහන් කරයි.

- 

“(මුලදී) මනුෂ්‍යයින් (සියලු දෙනා) එකම ජනසමාජයක් මිස නොවීය. පසු (එකිනෙකට වෙනස් දහම් පිළිවෙත් සොයා ගනිමින්) ඔවුහු බේද භින්න වූහ. නුඹගේ රබ් (පරමාධිපති) ගෙන් පෙරටුව ගිය තීරණයක් නිසා නොවේ නම් එහි ඔවුන් වෙනස් වූ දැහි ඔවුන් අතර විනිශ්චය කරනු ලබන්නේමය. (යූනුස් 19)

අල්ලාහ් තආලා ඉදිරියේ සියළුදෙනා එකහා සමාන බව පහත සඳහන් අල්කුර්ආනය තහවුරු කරයි.

"මනුෂ්‍යයිනි! අප ඔබ සැම එකම පිරිමියෙකුගෙන් සහ කාන්තාවකගෙන් මැවුවෙමු. ඔබලා එකිනෙකා හඳුනාගැනීම වස් ජනකොටස් සහ ගෝත්‍ර ඇති කළෙමු ඔබලා අතුරින් අල්ලාහ් වෙත ගෞරවනීය තැනැත්තා ඔබලා අතුරින් භියබැති තැනත්තාය. (අල් හුජ්රාත් 13)

ඉස්ලාම් මිනිස් අයිතිවාසිකම් නිදහස සියළු දෙනා වෙත සර්වසාධාරන ලෙස ක්‍රියාත්මක කරයි. එම නිදහස තිරිසනුන්ගෙන් වෙනස් කොට දැක්වීම සඳහා ශරීආ හෙවත් ධාර්මික රාමුවක් තුල ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි. එබැවින් නිදසුන් වශයෙන් පහත සඳහන් ආකාරයේ මානව අයිතිවාසිකම් ඉස්ලාමය විසින් හඳුන්වා දී ඇති බව පැහැදිලි වේ.

1. සිතීමේ සහ ප්‍රකාශ කිරීමේ අයිතිය : මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ දේශනා කළහ. උත්තරීතර ජිහාදය අසාධාරන පාලකයෙකු ඉදිරියේ සාධාරනත්වය පහදා දීමයි.
මුහම්මද් නබි තුමා විසින් දේශනා කරන ලද මෙම හදීසය සහාබාවරුන් නිසියාකාරව අනුගමනය කළහ.
වරක් උමර් (රලි) තුමාණන් රාජ්‍ය නායකයෙකු වශයෙන් සිටිය කල්හි සාමාන්‍ය වැසියෙකු විසින් උමර් තුමා අමතා ඔබ අල්ලාහ්ට බියව කටයුතු කරන්න යනුවෙන් පැවැසූ කල්හි එහි අසල සිටි

කෙනෙකු එය වළක්වාලීමේ අදහසින් ඔබ අල්ලාහ්ට බියවන්න යනුවෙන් පවසන්නේ උමර් රාජ්‍ය නායකයා අමතාද? යනුවෙන් පැවැසුවේය. එය දුටු උමර් රාජ්‍ය නායකයා ඔහුට කථාකිරීමට නිදහස ලබා දෙන්න මන්ද සමාජයක දියුණුව ඇත්තේ රටවැසියන් රාජ්‍යනායකා අමතා ප්‍රශ්න කිරීමෙන් හා රාජ්‍ය නායකයා එයට සවන් දීමෙන්ය යනුවෙන් ප්‍රකාශ කළේය.

2. හාලාල් හෙවත් සාධාරන ලෙස දේපල මිළ මුදල් උපයාගැනීමට ඇති අයිතිය. මේ සම්බන්ධයෙන් අල්ලාහ් තආලා මෙසේ පවසයි " නුඹලාගෙන් ඇතැමකුට සෙස්සන්ට වැඩියෙන් අල්ලාහ් විසින් ප්‍රදානය කොට ඇති දැයට නුඹලා ගිජු නොවනු. තමන් උපයාගත් දැයින් නිසි කොටස පුරුෂයින්ට ලැබෙනු ඇත. එමෙන්ම තමන් උපයාගත් දෙයින් නිසි කොටස ස්ත්‍රීන්ටද ලැබෙනු ඇත. –

3. සියළු දෙනාටම අධ්‍යාපනය හැදැරීමේ අයිතිය ලබා දී ඇත. මුහම්මද් නබි ﷺ තුමාණන් මෙසේ දේශනා කළහ.

අධ්‍යාපනය හැදැරීම සියළු මුස්ලිම් කාන්තා හා පිරිමි පක්‍ෂය කෙරෙහි අනිවාර්ය වේ. ( සුනන් ඉබ්නු මාජාහ්)

4. ශරීආ පෙන්වා දුන් ආකාරයට මෙම විශ්වය තුල ඇති සියල්ලක්ම භුක්තිවිඳීමට සියළු දෙනාටම නිදහසක් ඇත.
මෙය සම්බන්ධයෙන් අල්ලාහ් මෙසේ පවසයි
ඔහුය ඔබ සැමට පොළොව වසඟ කෙළේ එසේ හෙයින් එහි දිසා විදිසාවන්හි ඔබලා ගමන්කර එහි සම්පාදිත දෙයින් අනුභව කරන්න. (සූරතුල් මුල්ක් 15)

5. සුදුසුකම් හා හැකියාව ඇත්නම් ඕනෑම කෙනෙකුට සමාජයේ නායකත්වය භෙබවීමට නිදහක් ඇත.
මුහම්මදි නබි (සල්) තුමාණන් මෙසේ දේශනා කළහ.

සමාජයේ වගකීම් දරන්නට කෙනෙකුට අවකාශය ලැබීමෙන් පසු තමන්ගේ හිතවතුන්ට විශේෂ සැළැකිලි ලබා දෙන්නේ නම් ඔහු අල්ලාහ්ගේ ශාපය පහළ වන බව පැවැසූහ. (ඉමාම් අහ්මද්)

සුදුස්සාට සුදුසු තැන නොදී නොසුදුසු තැනැත්තාට සමාජයේ වගකීම් භාරදීම සමාජ පරිහානියට හේතුවක් බව ඉස්ලාම් පෙන්වා දෙයි. මේ සම්බන්ධයෙන් මුහම්මද් නබි (සල්) තුමාණන් මෙසේ දේශනා කළහ. “ වගකීම් පැහැරහැරීම තුලින් අවසන් දිනය බලාපොරොාත්තුවන්න එය එසේ සිදුවන්නේ කෙසේදැයි විමසන ලදි. එවිට

එතුමාණන් මෙසේ පැවැසූහ සමාජ වගකීම් (හා නිළ තානාන්තර) නොසුදුසු තැනැත්තාට පැවැරීම තුලින් විශ්ව අවසන් දිනය බලාපොරොත්තු වන්න (ග්‍රන්ථය සහීහුල් බුහාරි)

ඉස්ලාම් ධර්මය විසින් ස්වාධීන ආධ්‍යාත්මික බලතල කිසිවෙකුට පවරා නැත එවැනි බලතල වෙනත් ආගම් ධර්මයන්හි පූජක හෝ පූජ්‍ය පක්‍ෂයට ලබා දී ඇත. මෙසේ සර්ව බලධාරී දෙවියන් වහන්සේ සහ මිනිසා අතර කපුකම් කරන හෝ මැදිහත්ව කටයුතු කරන තරම් කරුවන් ඉස්ලාම් දහම විසින් හඳුන්වා දී නොමැත

අවංක මාර්ගය අල්ලාහ්ටම වේ. ඔහු හැර වෙනත් ආරක්‍ෂකයානන් වශයෙන් තෝරා ගත් පිරිස් (මෙසේ පවසති- අප ඔවුන් නමදින්නේ ඔවුන් අප අල්ලාහු වෙතටළං කිරීමටයයි පවසන්නෝය ඇත්තෙන්ම ඔවුන් විවාද කෙරෙමින් හුන් දැයෙහි ඔවුන් අතර අල්ලාහු විනිශ්චය කරන්නේය. ඇත්තෙන්ම අල්ලාහු බොරු කාරයෙකුට යහමග පනාපෙන්වන්නේය.( අස් සුමර් 3)

මිනිසා සහ දෙවියා අතර මැදිහත්ව කටයුතු කිරීමේ ක්‍රමවේදය ඉස්ලාම් සහමුලින්ම ප්‍රතික්ෂේප කරයි. මන්ද ඒ තුලින් අගතියක් හෝ සුගතියක් නොලැබෙන බැවිනි.

ඍජුව අල්ලාහ් සමග පිළිසඳරක යෙදී මැදිහත් කරුවෙකුගෙන් තොරව අපේ අවශ්‍යතාවය සඳහා අයද සිටීම සහ අපේ වැරදි පාප ක්‍රියා හා දුර්වලතා සම්බන්ධයෙන් අල්ලාහ්ගෙන් පාපෝච්චාරනය කිරීම කෙරෙහි ඉස්ලාම් මිනිසා දිරිගන්වයි. මේ ගැන අල්ලාහ් තආලා අල් කුර්ආනයේ මෙසේ පවසයි.

"කෙනෙකු අකුසල් ධර්මයෙහි යෙදී සිය ආත්මයටද අපරාධයක් කර ගෙන පසුව අල්ලාහ් තආලාගෙන් සමාව අයද සිටින්නේ නම් අල්ලාහ් සමාව ලබා දෙන්නෙකු හා දයාව දක්වන්නෙකු සේ දැක ගැනීමට හැකි වෙ." (110 النساء)

ඉස්ලාම් ධර්මයෙහි අල්ලාහ් තආලා වෙනුවෙන් මිනිසා ඉදිරිපිට පෙනී සිටිමින් අකුෂලය මෙයයි කුෂලය මෙයයි යනුවෙන් හෝ මිනිසාගේ වැරදි සඳහා සමාව බජනය කරන්නෙකු නියෝජිතයෙකු වශයෙන් පත් කර නැත. මේ ගැන අල්ලාහ් තආලා මෙසේ පවසයි.

ඔවුන්ගේ පූජකයින් හා නායකයින්
අල්ලාහ් වෙනුවටසිය දෙවියන් හැටියට
ඔවුහු තොරාගත්හ. ( අත්තව්බා 31)

මෙහි අර්ථය ඔවුහු ඔවුන්ගේ නායකයින් දෙවත්වයෙන් අනුගනකය කල නමුත් ඔවුන්ට වන්දනාමානය නොකළහ. ඔවුන්ගේ නායකයින් දෙයක් තහනම් කළේ නම් එය තහනම් දෙයක්සේ පිළිගත්හ. දෙයක් අනුමත කළේ නම් එය අනුමත දෙයක් සේ පිළිගත්හ. ( සුනන් තිර්මිදි)

ඉස්ලාම් දහම යනු සමාජයේ සියළු කටයුතුවලදී භාහිර හා අභ්‍යන්තර වශයෙන් සාකච්ඡා හා සම්මුති මාර්ගයෙන් සමාජ ප්‍රශ්න විසඳා සමාජයක් ගොඩ නංවන ධර්මයකි.

සාකච්ඡා මාර්ගයෙන් හා සම්මුතියෙන් සුහදව පෞද්ගලික හා සමාජ ප්‍රශ්න විසඳාගැනීමේ මාර්ග සඳහා ඉස්ලාම් දහම විසින් ප්‍රමුඛ ස්ථානය ලබා දී ඇත. මේ සම්බන්ධයෙන් අල් කුර්ආනය මෙසේ පවසයි.

'ඔවුන්ගේ හිමිට කීකරුවන්නා වූද සලාත්හි නිරතවෙන්නාවූද **<u>ඔවුන්ගේ කරුණු ඔවුන් අතර සාකච්ඡා කරන්නා වූද</u>** අප ඔවුනට දුන් දෙයින් අගිදම් කරන්නා වූ අයටද" (අල් ෂූරා 38)

ආරම්භ මුස්ලිම්වරු ඉහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කළ බැවින් ඔවුහු ආගමික හා ලෞකික වශයෙන් සෑම අංශයකින්ම ජයග්‍රහනය කළහ. නමුත් මෙම තත්ත්වයෙන් බැහැර වූ බැවින් ඔවුහු බොහෝ අංශවලින් පරාජයට පත් වූහ.

ඉස්ලාම් ඥාති හිතමිතුරන් හා අසල්වැසියන් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය ගැන පැහැදිලිව විස්තර කරයි. අල්කුර්ආනය මේ ගැන පවසන්නේ මෙසේය.

"අල්ලාහ්ට නමදින්න ඔහුට කිසිවකින් සමානයන් නොතබන්න දෙමාපියන්දට නෑයන්ටද අනාථයින්ටද දිළිඳුනටද අසල්වැසි නෑයන්ටද අසල්වැසි නොවන්නන්හටද සහකාරයාටද මගීන්ටද ඔබලාගේ දකුණු අත් හිමාකර ගත් අයටද (සංග්‍රහ කරවු) ඇත්තෙන්ම අල්ලාහ් අහංකාර අයටද පුහුමාන්නක්කාර අයටද ප්‍රිය නොකරන්නේය. (4 : 36)

මුහම්මද් නබි (සල්) තුමාණන් මෙසේ දේශනා කළහ.

"ඔබලා එකිනෙකාට ඊර්ෂ්‍යා නොකරන්න. (ලෞකික) සම්පත් සඳහා තරඟ පනාකරන්න. ක්‍රෝද නොකරන්න. වෙළඳාම් කටයුතුවලදී අනුන්ගේ වෙළඳාම්වලට අකුල් නොහලන්න. ඔබ සැම දෙන සහෝදරයින් මෙන් කටයුතු කරන්න. (සහීහ් බුහාරි) තවද මෙසේ ප්‍රකාශ කළහ. තමන්

ප්‍රිය කරන දේ තම සහෝදරයා කෙරෙහි ප්‍රිය කරන තුරු ඔබලා අතුරින් කිසිවෙකු මුඃමින් වරයෙකු වන්නේ නැත. (සහීහ් බුහාරි)

ඉස්ලාම් දහමට හතුරුකම් කරන අයටද තමන්ගේ අයිතිවාසිකම් ලබා ගැනීමට අයිතියක් ඇත.

බද්ර් යුද්ධයේදී අත් අඩංගුවට පත් අබී අසීස් බින් උමෙයිර් මෙසේ පවසයි. අප සිර අත්අඩංගුවේ සිටි අවස්ථාවේදී මුහම්මද් නබි තුමාණන් මෙසේ පැවැසූහ " සිර අත්අඩංගුවේ සිටින අයට යහපතක්ම කරන්න—මෙම අනුශාසනාවට අනුකූලව දිවා රාත්‍රී ආහාර ගැනීමේදී සේවක පිරිස් විසින් ඉඳි අනුභව කල අතර අපට වටිනාකමින් වැඩි රොටි අහාර වශයෙන් පිරිනැමූහ. (හදීස්)

මිනිසුන්හට පමණක් නොව සිව්පාවන් පක්ෂින් සඳහාද සිය අයිතීන් ලබා ගැනීමට ඉස්ලාමය විසින් මග පාදා ඇත.
මුහම්මද් නබි (සල්) තුමාණන් මෙසේ පැවැසූහ.

කෙනෙකු විසින් පක්ෂීන් නිරපරාදේ මරණයට පත් කරන්නේ නම් කියාමත් දිනයේදී එම පක්ෂීන් අල්ලාහ් අභියස පැමිණ අසවල් පුද්ගලයා විසින් මා නිරපරාදේ මරණයට පත් කළේය යනුවෙන් පවසනු ඇත.

මුහම්මද් නබි (සල්) තුමාණන් මෙසේ පැවැසූහ. ඔබ පිට නැග ගමන් කරන සව්පාවන්ගේ ආහාර පාන ගැන සැළැකිළිමත් වන්න.

ඉස්ලාම් ධර්මය විසින් අයිතිවාසිකම් ගැන සැළකිමේදී මහජනයා විසින් තනි පුද්ගලයා කෙරෙහිද තනි පුද්ගලයා විසින් මහජනයා කෙරෙහිද යුතුකම් හා අයිතිවාසිකම් ඉටු කිරීමේ ක්‍රම වේදයන් ගැන උගන්වා ඇත.

මහජන පහසුව උදෙසා තනි පුද්ගලයෙකුගේ දේපොළ සම්පත් බාධාවක් ලෙස පවතීනම් එයින් කොටසක් හෝ මහජනයාගේ පහසුව සඳහා උපයෝගී කර ගැනීමට ඉස්ලාමය දිරිගන්වයි. උදා : වරක් මුහම්මද් නබි (සල්) තුමාණන් මාර්ගයක් පළල් කිරීම සඳහා කෙනෙකුගේ ඉඩමෙහි කොටසක් අවශ්‍ය වූ විටක එය අල්ලාහ් වෙනුවෙන් පූජා කරන ලෙෂ ඉල්ලූ විටකදී ඔහු එය ප්‍රතික්ෂේප කළේය. එවිට මුහම්මද් නබි (සල්) තුමාණන් එම ඉඩමෙන් කොටසක් මිළදී ගැනීමට ඔහු සමග එකඟ විය.

ඉස්ලාම් දහම යනු ආදරය කරුණා දයාවේ ධර්මයකි. මුහම්මද් නබි (සල්) තුමාණන් මේ ගැන මෙසේ දේශනා කළහ. “ ආදරය කරන්නන් හට අල්ලාහ් ආදරය කරුණාව දක්වයි, එබැවින්

පොළොව මත සිටින් සියළු ජීවින් හට ආදරය කරුණාව දක්වන්න.

ආදරය කරුණාව දයාව යන ගුණාංගයන් මිනිස් සත්තවයාට පමණක් නොව සතා සර්පයාට පවා පෙන්වන ලෙස ඉස්ලාමයේ ඉගැන්වීමයි. මුහම්මද් නබි (සල්) තුමාණන් මේ ගැන මෙසේ පැවැසූහ. " ආහාර පාන නොදී කුඩු ගත කළ බළලෙකු මරණයට පත් වීමෙන් ඒ සඳහා වගකිව යුතු කාන්තාවක් නිරයට ඇතුල් වූවාය යනුවෙන් පැවැසූහ.

සත්ව කරුණාව නිසා මිනිසුන්ගේ පාප ක්‍රියාවන් සඳහා අල්ලාහ් තආලා ඔහුට සමාව දෙන බව මුහම්මද් නබි (සල්) තුමාණන් දේශනා කළහ. මේ සම්බන්ධ සිදුවීමක් ගැන මෙසේ පැවැසූහ.

වරක් කෙනෙකු දුර බැහැර ගමනක යෙදී සිටියදී අධික පිපාසයට පත් විය. ළිඳක් සොයාගත් එම පුද්ගලයා එම ළිඳ තුලට බොහෝ අමාරුවෙන් බැස සිය පිපාසය නිවා ළිඳෙන් ගොඩ විය. ඉක්බිති ඔහු අසල සුනඛයෙකුද පිපාසය නිසා වේදනාවෙන් පසුවෙනු දුටු ඔහු නැවැත ළිඳ තුලට බැස අවශ්‍ය ජල ප්‍රමාණය රැගෙන එම සුනඛයාගේ පිපාසය නිවීමට කටයුතු කළේය. මේ පුන්‍ය කර්මය හේතුවෙන් සද්ධාවට හා සතුටට පත් එම පුද්ගයා අල්ලාහ්ට තුති පුදකරමින් ඔහුගේ පාප කර්ම සඳහා

සමාව අයද සිටියේය. මුහම්මද් නබි තුමාණන්ගේ ශ්‍රාවක තුමන්ලා මුහම්මද් නබි තුමාගේන් මෙසේ විචාලේය " සතුන්ට උපස්ථාන කිරීම නිසා අපහට ආනිසංස ලැබේද? එවිට මුහම්මද් නබි තුමාණන් එසේය යනුවෙන් පිළිතුරු දුන්හ.

සතා සර්පයාට මෙසේ උපස්තාන කිරීමේන් ආනිසංස ලැබේ නම් මිනිසුන් වෙත උපස්තාන කිරීමේන් කොතරම් ආනිසංස ලැබේද යනුවෙන් කල්පනා කළ යුතු වේ. මන්ද අල්ලාහ් තආලා විසින් ලෙවේ සියළු සත්ත්වයින්ට වඩා මිනිස් සත්ත්වයා උසස් තත්වයට පත් කර ඇත. අල්ලාහ් දෙවිදුන් මේ ගැන මෙසේ පවසයි.

"තවද අපි ආදම්ගේ දරුවන් උත්තරීතර තත්ත්වයට පමුණුවා ඇත. පොළෝ තලයෙහිද සමුද්‍රයෙහිද ඔවුන් සම්භාවනීය තත්ත්වයට පත් කළෙමු. අගනා දෙයින් ඔවුන් වෙත ආහාර පාන දුනිමු. අප නිර්මාන කළ දෑ අතරින් ඔවුන් විශිෂ්ඨ කෙළෙමු. ( බනී ඉස්රාර්ල් 70)

ඉස්ලාමීය ඉගැන්වීම් ලොකික ජීවිතයෙන් අත්මිදී දුෂ්කර ක්‍රියා කරන ලෙස උගන්වා නැත. මෙලොව ආශිර්වාදයක් ලෙස ලැබී ඇති වරප්‍රසාදයන් භුක්ති විඳින මෙන් ලෝවැසි ජනයාට ආයාචනා කරයි. මුහම්මද් නබි (සල්) තුමාණන් මෙසේ දේශනා කළහ. " ඔබලා සිය ජීවිතය දුෂ්කර තත්ත්වයට

පත් නොකරන්න. එවිට ජීවත් වීම ඔබට දුෂ්කර වනු ඇත.—

මුහම්මද් නබි (සල්) තුමාණන් මෙසේද වදාලහ. " අහාර පානාදිය අනුභව කරන්න දනට පිනට දෙන්න, නමුත් නාස්ති කාර ක්‍රමයෙන් වැළකී සිටින්න. දෙවියන් වහන්සේ ඔහු විසින් පිරිනමා ඇති වරප්‍රසාද සහ ආශිර්වාදයන් මිනිසා භුක්තිවිඳිනවා දකින්නට ඔහු ප්‍රිය කරයි.

තවද ඉස්ලාම් දහම විසින් මෙලොව ජීවිතයෙහි අශ්වාදයන් කෙරෙහි ඇලී ගැලී බැඳී තන්හා ආශා හා රාගයෙන් දිවි ගෙවීමද කෙනෙකුගේ දරුණු පරිහානියට හේතුවක් බව උගන්වා ඇත. එබැවින් ලොකික හා ආධ්‍යාත්මික මාර්ග අතුරින් මධ්‍යස්ථ මාර්ගයක් අනුගමනය කරන ලෙසත් සමබර ජීවිතයක් ගත කරන ලෙසත් අවවාද අනුශාසනා කර ඇත.

ලොකික හා ආධ්‍යාත්මික මාර්ග දෙක සමබරව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් අල් කුර්ආන් වදන කදිම නිදසුනකි. " විශ්වාසවන්තයිනි! ජුම්ආ දින සලාතය සඳහා ආරාධනා කරනු ලැබූ කල්හි ඔබේ වෙළඳාම් කටයුතු අත්හිටුවන්න. ඔබ දැන සිටින්නේ නම් මෙම පිළිවෙත ඉතා යහපත් වූ එකකි. ( පරිච්ඡේදය ජුම්ආ 09)

තවද මෙසේ සඳහන් කරයි. "සලාතය නිමවූවායින් පසු පොලෝ තලයෙහි විසිර ගොස් අල්ලාහ්ගේ වරප්‍රසාදයන් සොයා යන්න. ජයග්‍රාහනය සඳහා අධික ලෙස අල්ලාහ් දෙවියන්වහන්සේ සිහිකරන්න. ( ජුම්ආ 10)

ඔබැවින් ඉස්ලාම් දහම විසින් ලෞකික හා ආධ්‍යාත්මික යන මාර්ග දෙක සඳහා වැදගත් ස්ථානයක් ලබා දී ඇත. අල්ලාහ් තආලා මේ ගැන මෙසේ පවසයි.

මිනිසුන් වෙළඳාම හා ගනු දෙනු තුලින්ද අල්ලාහු මෙනෙහි කිරීමෙන්ද සලාත්හි නිරතවීමෙන්ද සකාත් දීමෙන්ද ඔවුන් නොවලක්වති. සිත්ද දෑස්ද පෙරළෙන දින ගැන ඔවුන් භිය වෙති. (24:37)

ඉස්ලාම් දහම විසින් සිය ආධ්‍යාත්මික භාවය ගත සිත සියල්ල ගැන හොඳ සෝදිසියෙන් සිටින ලෙසත් ඒ සඳහාවූ අයිතිවාසිකම් නිසි ලෙස ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කරයි.

මෙම සිත කය වචනය යන දොරටු ගැන පරීක්ෂා කාරීවෙන ලෙසත් ඒවා පවිත්‍ර ලෙස පවත්වාගෙන යන ලෙසත් ඉල්ලීමක් කරයි.

**"කෙනෙකු අණු ප්‍රමාණයක් හොඳක් කෙළේ නම් ඔහු එය දකින්නේය. යමෙක් අණු ප්‍රමාණයක් නරකක් කෙළේ නම් ඔහු එය දකින්නේය. (99: 7 – 8)**

අල්ලාහ් තආලා විසින් අනුමත කරන ලද ආශිර්වාදයන්ගෙන් වැළකී සිටින කිසි විටක අවවාද නොකරන අතර ලොවෙහි හිත සුව පිණිස වැඩ පිණිස පවතින දේ භුක්ති විඳින ලෙස ඉල්ලීමක් කරයි.

" අල්ලාහ් තආලා විසින් සිය ගැත්තන් වෙනුවෙන් ප්‍රධානය කරන ලද පවිත්‍ර වූ අහාර (භුක්ති විඳීමට නොදී) වළක්වන්නේ කවරහුද ( අඃරාෆ් – 32)

අපේ ශරීරයෙහි අන්තර් ගතවී ඇති ප්‍රාණය තුලින් සියළු අවයවයන් ඒ ඒ කාර්යයන්හි යෙදෙන්නේ අල්ලාහ් තආලා සියළු අවස්ථාවන්හිදී වන්දනා මානය කිරීමටය එබැවින් මෙම ශරීරයට අල්ලාහ් විසින් ආශිර්වාදයක් සේ ප්‍රධානය කළ දේ භුක්ති වීඳීම අවශ්‍ය වන අතර එම ආශිර්වාදයන් විනාශයට පත් කිරීම නොහොබිනා කරුණක් වේ. මෙම ආශිර්වාදයන් නිසිලෙස භුක්ති විඳීම තුලින් සිය ශරීර සෞඛ්‍යයට යහපතක්ම සිදු වන බව අල් කුර්ආනයේ ඉගැන්වීමයි.

" මිනිසා මනා ලෙස නිර්මාණය කළෙමු. " ( අත් තීන් 4)

එබැවින් ශරීර සෞඛ්‍යය නිසි ලෙස ආරක්ෂා කිරීම සඳහා ඉස්ලාමය විසින් පහත සඳහන් අවවාද ලබා දී ඇත.

1. පිරිසිදු කම :

අල්ලාහ් තආලා මෙසේ පවසයි.
පාපය සඳහා සමාව අයද සිටින්නන් හා පිරිසිදු වන්තයින් අල්ලාහ් ප්‍රිය කරයි. ( 2 : 222 )

පස් වේලේ සහ අතිකූත් සලාතයන් සම්පූර්ණ වීමට වුදූ හෙවත් අර්ධ දෝවනය අනිවාර්ය කර ඇත.

තවද සංසර්ගයෙහි යෙදීමෙන් පසු පවිත්‍ර වීම අනිවාර්ය කර ඇත. එමෙන්ම සමහර වන්දනාමාන ඉටු කිරීමට පෙර ජලස්නානය කිරීම ප්‍රියජනක මෙහෙයක් ලෙස හඳුන්වා දී ඇත. උදා:ලෙස ජුම්ආ සලාතය, ඊද් හෙවත් අවුරුදු උත්සව දිනයන්හි සලාතය උම්රා - හජ් යනාදි වන්දනාමාන ක්‍රියාවන් සඳහා ජනස්නානය කිරීම වැදගත් මෙහෙයක් ලෙස හඳුන්වා දි ඇත.

2. පවිත්‍රතාවයන්හි අවශ්‍යතාවය

ආහාර ගැනිමට පෙර දෙඅත් සෝදාගැනීම : ආහාරයක ආශිර්වාදය පවතින්නේ ආහාරයට පෙර සහ පසු දෙඅත් හොඳින් සෝදා ගැනීමෙන්ය. යනුවෙන් මුහම්මද් නබි (සල්) තුමාණන් දේශනා කළහ.

**<u>දත් මැදීම</u>**

දත් මැදීම කෙරෙහි ඉස්ලාම් දහම විසින් විශිෂ්ඨ ස්ථානයක් ලබා දී ඇත. මිනිසුන්ට සිදුවන අවහිරතාවය ගැන සැළැකිල්ලට නොගත්තා නම් සෑම සලාත් අවස්ථාවකම මිස්වාක් භාවිත අනිවාර්ය කරන්නට ඉඩ තිබිණි.

<u>විවිධ රෝගයන්ගෙන් දුරු විම</u>

මුහම්මද් නබි (සල්) තුමාණන් මෙසේ දේශනා කළහ. ස්වාභාවික පිරිසිදුකම් පහකි. එනම් පිරිමින්ගේ චර්ම ඡේථනය, කිහිල්ලෙහි රෝම ඉවත් කිරීම, රහසිගත ස්ථානයන්හි රෝම ඉවත් කිරීම, උඩු රැවුල් කැපීම, නියපොතු කැපීම, යනාදය වේ. (හදීස්)

3. ගුණවත් දෙයින් අහාර පාන ලබාගැනීම : අල්ලාහ් තආලා මෙසේ පවසයි.

"විශ්වාස වන්තයිනි! අප විසින් ඔබ සැමට පිරිනමන ලද පවිත්‍ර වූ ආහාර අනුභව කරන්න. ඔබලා ඔහු(අල්ලාහ්) ටම වන්දනාමානය කරන්න. අල්ලාහ්ට තුති පුද කරන්න, ( 2 : 172)

4 ඉස්ලාම් දහම විසින් අගුණ හා අපවිත්‍ර දේ තහනම් කර ඇත.

උදා : ගෙල සිඳීමකින් තොරව මරණයට පත් වූ සතුන්ගේ මාංශ, රුදිර ලේ , ඌරු මස්, මත් ද්‍රව්‍ය, මත් කුඩු. දුම්පානය. මෙසේ ඉහත සඳහන් ද්‍රව්‍ය තහනම් කර ඇත්තේ කෙනෙකුගේ ශරීර සෞඛ්‍යය ආරක්‍ෂා කර ගැනීම සඳහාය. මේ ගැන අල්ලාහ් තආලා මෙසේ පවසයි.

,, ඇත්තෙන්ම ස්වභාවයෙන් මළ සතුන්ගේ මාංසද, රුධිරද, සූකර මාංසද අල්ලාහ් හැර වෙන දැයට කැප කළ දැයද ඔබලා කෙරෙහි තහනම් කර ඇත. ( 2 : 173)

අල්ලාහ් තආලා මෙසේද පවසයි. " විශ්වාස වන්තයිනි! මත් පැන් පානයද, දූ කෙළියද ( ඇදහීම් පිණිස සිටුවන ලද) පිළිරුද, නිමිති බැලීමද, ශයිතාන්ගේ ක්‍රියාවන්ගෙන් පිළිකුල් කරන ලද නීච දෑ වේ. ඔබ ජයග්‍රාහනය වෙනු පිණිස එයින් වැළකී සිටින්න.

මත්පැන් පානයන්ද දූ කෙළියන්ද තොප අතර විරෝධයද ද්වේෂයද හටගන්වා අල්ලාහ් සිහිකිරීමෙන්ද සලාත් කිරීමෙන්ද ඔබ වළක්වන්නේය. ෂයිතාන් අදහස් කරන්නේ එසේ හෙයින් එයින් වැළකෙන්නහුද? (වැළකෙවු) ( 5 : 90 - 91 )

5. මිනිසාගේ ගත සිත පිනවන්නට ඉස්ලාම් දහම විසින් ක්‍රීඩා අංගයන්ද අනුමත කර ඇත: උදා : මල්ලව පොර , දිවීම පිහිනීම හා වෙනත් ක්‍රීඩා අංගද අනුමත කර ඇත.

මුහම්ද් නබි (සල්) තුමාණන් ප්‍රසිද්ධ මල්ලව පොර විරයෙකු වූ රිකානා හෙවත් සහාබි මිතුරු සමග මල්ලව පොර ක්‍රිඩාවේ යෙදි ඇත.

මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ බිරිඳ වූ ආඉෂා තුමිය මෙසේ පවසන්නිය.

මුහම්මද් නබි තුමාණන් මා සමග දුර දිවිමේ තරගයක යෙදුනේය එහිදී එවිට මා විසින් ජයග්‍රාහනය අත්පත් කර ගන්නා ලදි. තවත් වරෙකදී එවිට මා තරබාරුවී සිටියම් එවිට මුහම්මද් නබි තුමා විසින් ජයග්‍රාහනය හිමි කර ගන්නා ලදි. (හදීස්)

තවද ඊතල විදීම පිහිනීමේ ක්‍රීඩාවන් හා අශ්ව සවාරි සඳහා පුහුණුවක් ලබා ගැනීමේ අවශ්‍යතාවය ගැන පිළිබඳ මුහම්මද් නබි තුමාණන්ගේ ප්‍රධාන පෙළේ ශ්‍රාවක මිතුරෙකු වූ උමර් රලියල්ලාහු අන්හු තුමා විසින් කිහිප අවස්ථාකදීම මතක් කර දෙන ලදි. එතුමා මේ පිළිබඳව මෙසේ පැවැසූහ.

ඔබලා ඔබේ දරුවන්හට ඊතල විදීම්, පිහිනීමේ ක්‍රීඩාවන් හා අශ්ව සවාරි සඳහා පුහුණුවක් ලබා දෙන්න.

සමහර ආගමික දර්ශනයන් අනුගමනය කරන දනන් විසින් ලෙඩ රෝග පවා දෙවියන් වහන්සේගේ කැමැත්ත බව සිතා ගිලන් ගත වූ විට අවශ්‍ය ප්‍රතිකාර නොගෙන ඉතා අසීරු තත්ත්වයන්ට හා සමහර විට අවසානයේදී දි මරුවාගේ උගුලටද හසු වෙන පුවත් අපට අසන්නට ලැබේ. ඉස්ලාම් දහම මෙම චින්තනය ප්‍රතික්ෂේප කරන අතර ලෙඩ රෝග සඳහා ඒ සඳාහා විශේෂඥයින්ගේ මාර්ගයෙන් ප්‍රතිකාර ලබා ගැනීමට උනන්දු කර ඇත. මුහම්මද් නබි තුමා විසින් රෝග සඳහා ප්‍රතිකාර ලබා ගැනීමේ අවශ්‍යතාවය ගැන මෙසේ සඳහන් කර ඇත.

“අල්ලාහ් දෙවියන් විසින් රෝග සහ ඒ සඳහා ප්‍රතිකාරද පහළ කර ඇත. එබැවින් ඔබලාගේ රෝග සඳහා නිසි ප්‍රතිකාර ලබාගන්න. තවද

ඔබගේ රෝගාය සඳහා අනිසි ප්‍රතිකාර ලබා ගැනීමෙන් වැළැකී සිටින්න. (හදීස්)

විටින් විට යාච්ඥාවන්හි යෙදීමෙන් සිතට මෙන්ම ගතටද සුවය සැනසුම සොම්නස ලබා ගැනීමට හැකි බව අල් කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

විශ්වාස කොට අල්ලාහ් සිහි කිරීමෙන් ඔවුන්ගේ සිත් සැනැසෙනු ඇත. සත්‍ය වශයෙන්ම අල්ලාහ් සිහි කිරීම තුලින්ය සිත් සහනයට පත් වන්නේ. ( 13 : 28 )

අනුන් වෙනුවෙන් ඉටු කළ යුතු යුතුකම් මෙන්ම තමන් වෙනුවෙන්ද, සිය ශරීරය සඳහා ලබා දිය යුතු යුතුකම් ගැනද ඉස්ලාම් දහම විසින් දේශනා කර ඇත. සිය ශරීර සෞඛ්‍යය ගැන උදාසීනව සිටීම ගැන මුහම්මද් නබි තුමා විසින් තරයේ හෙළා දැක ඇත. සිත ගත රැක ගැනීමේ අවශ්‍යතාවය ගැන හා එහි වැදගත් කම ගැන පහත සඳහන් හදීසයෙන් මනාව පැහැදිලි කර ඇත.

අනස් රලියල්ලාහු අන්හු තුමාණන් දැනුම් දෙන හදීසයක මෙසේ සඳහන් වේ.

මුහම්මද් නබි තුමාණන්ගේ මිතුරන් තිදෙනෙකු එතුමානන්ගේ අඹුවන්ගේ මාර්ගෙයෙන් මුහම්මද්

නබි තුමාණන්ගේ වන්දනාමාන වත් පිළිවෙත් පිළිබඳ තොරතුරු ලබා දැනගැනීමෙන් පසු එතුමාණන්ගේ විශිෂ්ඨ වන්දනාමාන කටයුතු ගැන ඉතා විශ්මයට හා මවිතයට පත් වූ ඔවුහු තම තමන්ගේ වන්දනාමාන පිළිවෙත් ඉදිරි අනාගතයේදී ඉටු කළ යුතු ආකාරය ගැන පහත සඳහන් ආකාරයට තමන් අතර සාකච්ඡා කර ගත්හ.

මුහම්මද් නබි තුමාගේ ඉබාදත් ගැන සළකා බලන විට අපේ වන්දනාමාන තත්ත්වයන් ඉතා පහත් තත්ත්වයක වැටී ඇත. එතුමාගේ පෙර සහ පසු සියළු වැරදි සඳහා අල්ලාහ් සමාව දී ඇත. එබැවි මා අද දින සිට රාත්‍රී කාලය පුරා සලාතයෙහි නිරත වෙමි. යනුවෙන් පළමු වැන්නා ප්‍රකාශ කළේය. මා දිවා කාලය පුරා උපවාසයෙහි නිරත වෙමි. යනුවෙන් දෙවැන්නා පැවැසීය. මා විවාහ ජීවිතයෙන් අත්මිදී ඉබාදත් වන්දනා මාන කටයුතුවල නිරත වෙමි. යනුවෙන් තෙවන්නා පැවැසීය. මෙම පුවත ආරංචි වූ මුහම්මද් නබි තුමාණන් මෙම මිතුරන් තිදෙනා අමතා මෙසේ ප්‍රකාශ කළහ. මා ඔබලාට වඩා අල්ලාහ්ට බිය බැති කෙනෙකි නමුත් මා උපවාසයෙහි යෙදෙන්නෙමි උපවාසයෙන් මිදෙන්නෙමි සලාත් ඉටුකරමි සලාතය අවසන් කර පෞද්ගලික කටයුතුවල නිරත වෙමි තවද අඹු දරුවන් සමග පවුල් ජීවිතයක් ගත කරමි. එබැවින් මගේ වත්පිළිවෙතින් කෙනෙකු

අත්මිදෙන්නේද ඔහු මගේ සමාජයට අයත් කෙනෙකු නොවේ. ( සහීහ් බුහාරි )

ඉස්ලාම් දහම යනු දැනුම ඥානය පදනම් කර ගත් දහමකි. එය අධ්‍යාපනය හැදෑරීම කෙරෙහි මිනිසි දිරිගන්වයි.

අල් කුර්ආනය මේ පිළිබඳව මෙසේ සඳහන් කරයි. "දැනුම ඇත්තා සහ දැනුම නැත්තා එක සමාන වේද" ( Zසුමර් 9 )

ඉස්ලාමය විසින් අඥානය හෙළා දැක ඇත. මේ ගැන අල් කුර්ආනය මෙසේ සඳහන් කරයි.
අඌදු බිල්ලාහි අන් අකුන මිනල් ජාහිලීන් එනම් අඥානයෙකු නොවීම සඳහා අල්ලාහ් තආලාගෙන් පිහිට පතමි.

සිය පාපී අකුසල් ක්‍රියාවන් සඳහා පශ්චස්තාප වෙමින් සහ නැවැත එම අකුසල් ක්‍රියාවෙන් දුර සිටම දුරුවෙන බවට අධිෂ්ඨාන කරන දනන් සඳහා පව් සමා දීම ඉස්ලාමයේ ඉගැන්වීමයි. මේ ගැන අල්කුර්ආනය මෙසේ පවසයි.

" පසුතැවිලි වි විශ්වාස කොට යහකම් කළ අය හැර්ය. අල්ලාහු මොවුන්ගේ කුහකකම් යහකමට මාරු කරන්නේය. අල්ලාහ් සදා සමා කරන්නේය. ඔහු දයාලුය. (25 : 70 )

ඉහත සඳහන් ක්ෂමා දීම සිය ඉදුරන් පිනවීමේදි අල්ලාහ් දෙව්දුන්ට බලපාන ආකාරයට කළ වැරදි සඳහාය. නමුත් මිනිසා විසින් මිනිසෙකුට කරන පාපිෂ්ඨ ක්‍රියාවන්හිදී පළමුව අපරාධයට ලක් වූ තැනැත්තාගේන් සමාව අයද සිටිය යුතුය. එසේම කෙනෙකුගේ මුදලට සහ සම්පත් සඳහා අලාභයක් සිදු කර ඇත්නම් එම අලාභය ගෙවීමෙන් පසු සමාව අයද සිටිය යුතුය.

අකුසල් ධර්මයෙහි නිරතවූවන් එහි ආදීනත්වය දැනගැනීමෙන් පසු එයින් අත්මිදෙන්නට ඉදිරිපත් වීමේදී ඒ සඳහා දිරිගැන්වීම ඉස්ලාමයේ මාර්ගයයි. අල් කුර්ආනය මේ සම්බන්ධයෙන් මෙසේ පවසයි.

"තමනටම පරිහානියක් කරගත් මගේ වහලුනි! අල්ලාහ්ගේ දයාලුභාවය ගැන අපේක්ෂා භංගත්වයක් ඇත් නොකරනු. ඇත්තෙන්ම අල්ලාහ් සියළු පව් ක්ෂමා කරන්නේය. ඇත්තෙන්ම ඔහු ක්ෂමාන්විතය. දයාලුය යැයි පවසන්න. ( 39 : 53 )

සත්‍ය වශයෙන්ම ලෝක වාසි මිනිස් සත්වයාගේ මෙලොව වශයෙන් එකම බලාපොරොත්තුව සමෘධිමත් ජීවිතයක් ගත කිරීම යන්නෙහි කිසිම සැකයක් නැත. මේ සම්බන්ධයෙන් කිසිවෙකුට දෙවැනි අදහසක නැත. මිහිපිට ජීවත්වන සියලු දනන් සිය ජීවිත කාලය තුල සියළු දුක් කරදර ඉවත දමා සුව පහසු ජීවිතයක් ගතකිරීමට දරන උත්සාහය කිය නිම කරන්නට නොහැක. මේ සඳහා මෙතරම් පරිශ්‍රමයක් දරන්නේ සමෘධිමත් ජීවිතය යන්නයි. මෙසේ ඒ වාසනාවන්ත ජීවිතය අත්පත් කර ගැනීම වස්, දිවා රාත්‍රී, වෙහෙස දරන්නේ සිය සමෘදිමත් ජීවිතයේ සිහිනය සැබෑ කිරීමක් වශයෙනි.

හුදෙක් දුප්පත් පොහොසත් උගත් නූගත් යන බේදයකින් තොරවල ඒ වාසනාවන්ත අවස්ථාව ලබා ගැනීමට උත්සාහ නොකරන කෙනෙකු මේ මිහිපිට කිසිසේත් සිටීමට නොහැකිය. හොඳ නරක තෝරා බේරා ගැනීමට අපොහසත් වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජනජීවිතයේ කඩාවැටීමක් ඇතිවන බව එක පැත්තකින් මනාව වැටහී යන්නේය. නිදසුනක් ලෙස මත්ද්‍රව්‍ය සූදුව සුරාව තුලින් තම සතුට සැනසුම ලඟාකර ගත හැකියැයි සිතන කෙනෙකු එයට නැඹුරු වෙයි. ඉක්බිති අවසානයේදී එය පාළුවෙන් කාන්සියෙන් සහ දොම්නසෙන් පිරුණු අවස්ථාවක් බවට පරිවර්තනය වේ.

භාහිර වශයෙන් සතුටෙන් ජීවත්වනවායැයි පවසන බොහෝ දෙනා අසහනයෙන් පිරි දිවියක් තුල හිරවී සිටින්නේ සුවය ලබා දිය හැකි නියම ජීවන ක්‍රමය කුමක් දැයි මනාව වටහා ගැනීමට නොහැකි වූවාක් මෙනි. එබැවින් ඉස්ලාම් දහම තුලින් අසහාය සමෘද්ධිය ලබා ගැනීමට නම් එය ක්‍රමානුකූලව අධ්‍යයනය කල යුතුවේ. එබැවින් මුහම්මද් නබි තුමාණන්ගේ චරිතය සහ අල්කුර්ආනය මුල්කරගෙන ඉස්ලාම් උගන්වන සමාජ සාරධර්ම ගැන සාකච්ඡා කිරීම වැදගත්වේ.

විශිෂ්ඨ ඉගැන්වීම්වලින් හෙබි ඉස්ලාම් දහම මිනි මිනිස් සත්වයාගේ ලෞකික සහ ලෝකෝත්තර ජීවිතයේ උවමනාවන්ද සපුරාදෙන දහමකි. ඒවා නම්

1. සර්වබල දෙවිඳුගෙන් සහ ඉස්ලාම් දහම ඔහු ගැන පරිසමාප්ත අන්දමින්ම විස්තර කරයි. ඒ ගැන අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනයේ මෙසේ පවසයි :

*'(විශ්වය සහ එහි සියල්ල) නිර්මාණය කළ භවතා කවරෙකු දැයි නොදන්නේද? ඔහු සාවධානව නිරීක්ෂණය කරන්නා සහ සුවිඥානය'.* (67 : 14)

2. මිනිසාගේ ප්‍රාතමික අවිද්‍ය සහ මිනිසාගේ මැවීම් තුල අන්තර් ගතවී ඇති හේතුව ගැන මෙසේ පැහැදිළි කරයි :

*'මිනිසුනේ, ඔබ ඔබගේ දෙවිඳුට බිය වව්. ඔහු ඔබ සියල්ල එකම ආත්මයකින් නිර්මාණය කළේය. එයින් ඔහුගේ බිරිඳද නිර්මාණය කළේය. ඉන්පසු ඒ දෙදෙනාගෙන් අපමණ පුරුෂයින්ද ස්ත්‍රීන්ද නිර්මාණය කර (මිහිපිට සාමය පැතිර වීම සඳහා) පැතිර විය'.* (4 : 1)

මිනිස් නිර්මාණයේ ඉලක්කය ගැන මෙසේ පවසයි :

*'තවද, ජින් (සමූහය) සහ මිනිස් (වර්ගයා)මා හට වන්දනාමාන කිරීමට වීනා මා නිර්මාණය නොකළෙමි'.* (51 : 56)

3. ඉස්ලාම් සහජ ස්වභාවික ධර්මයකි. අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනයේ මෙසේ පවසයි :

*'කුමණ ස්වභාවයෙහි අල්ලාහ් මිනිසා (නිර්මාණය) කළේද එය ඔහුගේ (ස්ථිර) සහජ ධර්මය වේ'.* (30 : 30)

4. එය බුද්ධියට ඔරොත්තු දෙන දහමකි. අල්කුර්ආනය මෙසේ පවසයි :

*'දැනුම ඇත්තාද දැනුම නැත්තාද සම වන්නේද? ඇත්තවශයෙන්ම (මෙම කුර්ආනය මගින්) මෙනෙහි*

*කරන්නන්* *නුවණැත්තන්ය'.*
(අල්කුර්ආන් 39 : 9)

අල්ලාහු අල්කුර්ආනයේ මෙසේ පවසයි

*ඇත්තෙන්ම අහස් සහ පොලොව නිර්මාණයෙහිද, දිවා රෑ මාරුවී පැමිණීමෙහිද නුවණැත්තන්ට සාධකයන් වේ.* (3 : 190)

**5.** ඉස්ලාම් දහම ෂරීආ හෙවත් දෙවියන්ගේ නීති සහ අවවාද යනාදියෙන් සමන්විත ප්‍රතිපදාවකි : එය සර්වඥාන දෙවිදුගේ ෂරීආ හෙවත් පරිසමාප්ත පරමාධිපත්‍ය ආඥාවෙන් හෙබි දහමකි. එය තනි පුද්ගල සහ සමාජයට සුදුසු ප්‍රතිපත්තිවලින් සහ විනයගරුක ක්‍රියාකාරකම්වලින් යුතු සැලැසුම් සහගත සම්පූර්ණවූ දහමකි.

6. එය මිනිස් සත්වයාගේ ජීවන මග යහපත් කිරීම සඳහා වූ මගපෙන්වීමකි. එය මිනිසා අමතන්නේ යහමග හැරෙන විලසිනි. .

7. සතුරන් වුවද ඔවුන් සමග යුක්තිගරුක ලෙස වෙසෙන්නට සහ හැසිරෙන්නට අන කරන දහමකි. යුක්තිය පසිඳලීමේදී මිතුරා සහ හතුරා යන දෙපාර්ශ්වය අතර සමව වෙසෙන ලෙස අනකරන දහමකි. ඒ ගැන අල්ලාහ් දෙවිදු පරිශුද්ධවූ අල්කුර්ආනයේ මෙසේ පවසයි :

*'සමූහයක් කෙරෙහි වූ ඔබගේ ක්‍රෝධය ඔවුන්ට අසාධාරණකම් කරන්නට නොපෙලඹේවා. යුක්තිය ඉටු කරව. එය බියබැති බවට ඉතා සමීපය'.* (5 : 8)

*'ඇත්තෙන්ම අල්ලාහ් යුක්තිය ගැන අණ කරයි'.* (16 : 90)

*'ඔබ යමක් කිවහොත් නැයන්ට හෝ වේවා යුක්තියම පිළිපදිව්'.* (6 : 152)

**8. ඉස්ලාම් දහම :ජාති, වර්ණ හෝ උස් පහත් බේදයකින් තොරව විශ්වාසවන්ත සහෝදරත්වයක් මතු කරන දහමකි. ගෝත්‍ර වාදයට හෝ වංශ වාදයට අතුගා දමා ඇත. ŋිත්තසන්තානයේ බියබැති කමට පමණක් වැදගත් ස්ථානයක් ලබා දී ඇත.**

**9.: දැනුම අධ්‍යාපනය ලබා ගැනීම සියලු පිරිමි සහ ස්ත්‍රීන් කෙරෙහිම අනිවාර්යය වේ. ඒ දැනුම මිනිසා උත්තරීතර තත්වයට පත්කරයි යන්න එහි සංකල්පයයි. ඒ ගැන අල්ලාහ් අල්කුර්ආනයේ මෙසේ පවසයි :**

*'සැබැවින්ම ඔබගෙන් විශ්වාසවන්තයින්ගේද ඥානය ප්‍රධානය කරන ලද්දන්ගේද තත්වය උසස් කරන්නේය'.*

(58 : 1

**10. ඉස්ලාම් දහම පිළිගන්නා කෙනෙකු සෞභාග්‍යමත් තැනකට පත් කරන බවට පොරොන්දු වෙයි.**

***'ඔබ අතරෙන් කවරෙකු විශ්වාස කර යහපත් කර්මයන්හි යෙදෙන්නේද ඔවුන් ඔවුන්ට පෙර විසූවන් (මිහපිට) පාලන තන්ත්‍රයට පත් කළා සේ නියත වශයෙන්ම ඔවුන්ද පාලන තන්ත්‍රයට පත්කරන බවද, ඔහු ඔවුන් වෙත පවරා දුන් දහමෙහිම සත්‍ය ලෙස ස්ථිර කරන බවද, සැබැවින්ම ඔවුන් තුල පවතින බිය සතුටක් ලෙස වෙනස් කරන බවද අල්ලාහ් පොරොන්දු වෙයි. ඔවුන් මට ආදේශ නොකර මා වන්දනාමානය කරනු ඇත.*** (24 : 55)

තවද, අල්ලාහු අල්කුර්ආනයේ මෙසේ පවසයි

***'පිරිමියෙක් හෝ වේවා ස්ත්‍රියක් හෝ වේවා කවරෙකු හෝ විශ්වාස වන්තව යහපත් කර්මයන් කරන්නේද සැබැවින්ම අප ඔවුන්ට සෞභාග්‍යමත් දිවි පෙවෙතක් ලබා දෙන්නෙමු. තවද (එලොව) ඔවුන් කළ හොඳ දෙයින් ඔවුන්ට මනහර ප්‍රතිපල ලබා දෙන්නෙමු'.*** (16 : 97)

11. පොදුවේ මිනිසා මෙලොව වශයෙන් මුහුණ පාන සියළු ආකාරයේ ගැටළු සඳහා ඉස්ලාම් දහම තුල මනා විසඳුම් ඇත. කෙටියෙන් සඳහන් කරනවා නම් කෙනෙකුගේ ජීවිතයට අවශ්‍ය කරන මගපෙන්වීම් සඳහා ඉස්ලාම් දහම මනා ආදර්ශමත් ආඥා සහ නීතිරීති සකස් කර ඒ යටතෙහි දිවි මග පවත්වා ගෙන යන ලෙස ඉල්ලා සිටී.

ෂරීආ නීති පද්ධතිය උසස් මිනිස් සමාජයක් සංස්ථාපනය කර ඇති බව තහවුරු කරන ඉස්ලාම් දහම ඒ සඳහා මුහම්මද් නබි තුමාණන්ගේ ජීවිතය ආදර්ශයක් ලෙස ගෙන හැර දක්වයි.

ඉස්ලාම් දහම සෑම දෙනෙකුටම සියලු කාලයටද සියලු තැනටද සියලු අවස්ථාවන් හටද සුදුසු දහමකි. සියළු දෙනා කෙරෙහි පරිසමාප්ත විසඳු මක් ගෙන දේ. එසේම එදා ජීවත්වූ සමාජයට සේම වත්මන් සමාජයටද, අනාගත සමාජයටද එය සුදුසු බව සාක්ෂාත් කරයි.

ඉස්ලාම්, සමාජ ක්‍රමය තුල ශක්තිමත් බැඳීමක් ඇති කරවන අතර බලවත් සබධතාවයක් ගොඩ නගන දයාන්විත දහමකි. මෙම තත්ත්වය ගැන මුහම්මද් නබි (සල්) තුමා පවසන විට 'විශ්වාස වන්තයින් අතර පවතින සබඳතාවයට නිදසුනක් නම් මිනිසාගේ කය වේ. කයෙහි එක් අවයවයක්

රෝගයට පත්වූ කළ එහි වේදනාව මුළු ශරීරයටම ගෙන දෙයි.

ඉස්ලාම් අලස කම හෙලා දකින අතර ධෛර්යවවන්ත භාවය දිරිමත් කරයි. හම්මද් නබි (සල්) තුමා වරෙක මෙසේ දෙසූහ : 'බෙලහීන දුර්වල විශ්වාස වන්තයාට වඩා ධෛර්යවන්ත විශ්වාස වන්තයා කෙරෙහි අල්ලාහ් බොහෝ සෙයින් ප්‍රිය වන්නේය.

16. ඉස්ලාම් දහම මිනිසා තුල අවුල් ඇති කරන, පරස්පර විරෝධ මත ගැන කුතුහලයක් ඇති කරවන අදහස් සම්පූර්ණයෙන්ම ඉවත් කර සෑම දෙනාටම පහසුවෙන් වටහා ගත හැකි පැහැදිලි අදහස් ඉදිරිපත් කරයි.

17. ඉස්ලාම් විවෘත දහම් මගකි. දහමට ඇතුල් වීමට කිසිදු බාධාවක් නැත එහි දොරටුව සැමදා විවෘතව ඇත.

20. ඉස්ලාම් දහම බුද්ධිය, දැනුම, ආත්මය සහ මිනිසාගේ චරිත ලක්ෂණ උසස් ලෙස ස්ථිරවත් කරයි.

21. ඉස්ලාම් දහම සෑම කෙනෙක්ම යහපත් ගතිගුණ සහ යහපත් ක්‍රියාවන් කෙරෙහි සෘජුව අමතයි:
අල්ලාහු අල්කුර්ආනයේ මෙසේ පවසයි :

*' (නබි තුමනි) සමාව සතු කරගනිව. යහකම පිළිපදින ලෙස (මිනිසුනට) අණ කරව. තවද අඥානයින්ගෙන් ඉවත් වෙව්'.* (7 : 199)

තවද අල්ලාහ් දෙවිදු අල්කුර්ආනයේ මෙසේ පවසයි :

*'යහපත තුලින් (නපුර) දුරුලන්න' එවිට ඔබ අතරත් කා අතරත් අමනාපයක් ඇත්නම් ඔහු ඔබට ප්‍රියමනාපවන්තයෙකු වනු ඇත'.* (41 : 34)

22. ඉස්ලාම් මිනිසාගේ මානුසික හැගීම් විකෘති තත්වයට පත් වීමට තුඩු දෙන මාර්ග නසා සිහිබුද්ධිය ආරක්‍ෂා කරන මං සඳහා මග පෙන්වයි. එබැවින් සුරාපානය, මත් ද්‍රව්‍යය සහ මිනිසාගේ සිහිය විකල්ප කරන මත් වතුර මත් කුඩු මත් ගුලි යනාදි වශයෙන් කුමක් වුවද ඒ සියලු දේ තහනම් කරයි. අන් සතු දේපල සම්පත් සහ පොදුවේ සේසත් රැකගැනීම සඳහාද ආරක්‍ෂා කර දීම සඳහා ද ඉස්ලාම් දහම විසින් විශේෂ නීති හඳුන්වාදී ඇත. වංචාව සහ විශ්වාස කඩ කිරීම තරයේ හෙලා දකී. විශ්වාස වන්ත ලෙස කටයුතු කිරීමේ අවශ්‍යතාවය

සහ එහි වැදගත්කම ගැන විශේෂයෙන් ගෙනහැර දක්වා ඇත.

ස්වර්ගයට පිවිසීමට මුස්ලිම්වරයකුගේ අවසාන ඉලක්කය බැවින් සාරධර්ම ජීවිතයක් ගත කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දෙයි.

ඉස්ලාම් දහමට අනුව (අනෙකාගේ සේසත්) සොරකම් කිරීම මහා පාපයකි. එය තරයේ හෙළා දැකී, සොරකම සමාජයෙන් තුරන් කිරීමට සොරකම් කළ පුද්ගලයාගේ අත්සිඳින ලෙස එහි නීති අණ කරයි. මෙවැනි නීති සමාජගත කිරීම නිසා සොරකම් කිරීම් ඉස්ලාම් සමාජයක් තුල අවම තත්ත්වයක පවතී. එබැවින් මෙම නීති සහ සාරධර්ම මාලාවන් ප්‍රවර්ධනය කිරීම තුලින් මහජන සේසත් වර්ධනය ඇති වීමේ ඉඩ කඩ ඉහළ තත්වයකට පත් වෙයි. සොරකම වෙනුවෙන් අත් සිඳිනු ලබන්නේ බලවත් සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසුවය. සමස්තයක් වශයෙන් ගත් මෙවැනි දඬුවම් ක්‍රියාත්මක වන්නේ සීමිත ප්‍රමාණයකින් පමණි.

එහෙයින් ඉස්ලාමීය නීති රටාවක් පවතින සමාජයක් තුල සොරසතුරු බියෙන් තොරව තම සේසත් ආරක්ෂා කරගනිමින් නිදහසේ ජීවත් වන්නට අවශ්‍ය පරිසරයක් හදා දී ඇත.

ඉස්ලාම් මිනිස් ජීවිතයක ඇති වටිනාකම ඉතා උසස් මට්ටමකින් විස්තර කරන අතර කිසිදු හේතුවක් නොරව තවත් මිනිසෙකු ඝාතනය කිරීම මහාපාපයක් ලෙස සලකන අතර එය තරයේ හෙළා දකී. යමෙකු කිසිදු හේතුවකින් තොරව තවකෙකු ඝාතනය කළේ නම් එයට දඬුවම ඝාතනය කල තැනැත්තා දඬුවමක් ලෙස ඝාතනය කිරීම වේ. ඉස්ලාම් මෙවනි නීති පද්ධතියක් හඳුන්වා දෙන බැවින් මුස්ලිම් රටවල ඝාතනය අඩු මට්ටමකින් පවතින්නේය. එසේම මෙවැනි පරිසරයක් තුල මිනිසුන් මරණ බියෙන්ද ඉවත්වී සහනයකින් යුතුව ජීවත් වන්නටද අවස්ථාවද උදා වෙනු ඇත.

ඉස්ලාම් දහම ශරීර සෞඛ්‍ය ආරක්ෂා කරයි : මෙම කරුණු සම්බන්ධව අල්කුර්ආනයේද මුහම්මද් තුමාගේ හදීස් සංකල්පයේද බොහෝ මගපෙන්වීම් වේ.

සෞඛ්‍යට අහිතකරවන කිසිවක් අනුභව කිරීම තරයේ තහනම් කර ඇත. අල්ලාහ් තආලා විසින් දායාද කර දී ඇති ගුණවත් දේ පමණක් අහාර පාන වශයෙන් ගන්නා ලෙස අල් කුර්ආනය අණ කරයි. මත්පැන තහනම් කිරීම එහි වැද ගත් කරුනකි.

කාමයේ වරදවා හැසිරීම සහ සමලිංක සේවනය වැනි පහත් නීච ක්‍රියා ඉස්ලාමය විසින් තරයේ

තහනම් කරයි. එවාට ඇබ්බැහි වන්නේ නම් ඒ පුද්ගයාගේ ජීවිතය තුල ව්‍යාකුල තත්තවයක් ඇති විය හැකිය. ඒඩ්ස් වැනි සමාජ රෝග වර්ධනය වීමේ ප්‍රවාහයක් ඇති විය හැක.

දිනපතා පස්වේලක් දේවනැමදුම කරන මුස්ලිම් වරයෙකු දිනකට පස්වතාවක් වුළු දෝවනය කිරීමේදී මුහුණ, අත්පා, නාස්පුඩු සහ කන් වැනි අවයවයන් පිරිසිදු කරයි. මෙය මිනිසාගේ ශරීර සෞඛ්‍ය ආරක්ෂාව සඳහා ප්‍රයෝජනවත් පිළිවෙතකි.

ඉස්ලාම් දහම ඥානය මුල් කරගත් දහමකි. නවීන යුගයේදී පවා විද්‍යාව හා තාක්ෂණ අතින් විවිධ සොයාගැනීම් සහ නව චින්තනයේ යථාර්ථයට පටහැනි නොවී එක්ව අත්වැල් බැඳගෙන මතවාදවලට පටහනා නොවී එකට ගමන් කරයි.

සුප්‍රසිද්ධ ප්‍රංශ විද්වතෙකු වන මොරිස් බුකයිල් තම 'විද්‍යාව බයිබලය සහ කුර්ආනය' යන ග්‍රන්ථයේ මෙසේ විස්තර කරයි අල්කුර්ආනය අද වනතුරු සහසුද්දෙන්ම වෙනසකට භාජනය නෙවී පවතී. අල්කුර් ආනය කිසිදු හේතුවක් උදෙසා, අවස්ථාවේ හෝ ඥානයේ හෝ නූතන සොයා ගැනීම මත හෝ ප්‍රභේද නොවී ඒ සමග එක්ව අත්වැල් බැඳ ගෙන ඉදිරියට ඇදෙන්නේ අපූරු සහගත අන්දමිනි.

ස්වභාවික දැනුම් ඥානයට කිසිවිටක ඉස්ලාම් දහම පටහැනි නොවී ඒහා එකගවීම එහි ඇති

විශේෂත්වයයි. උද්භිත විද්‍යා තාරකා විද්‍යාව හා වෙනත් ක්ෂේත්‍රයන් ගැන අල් කුර්ආනයේ දක්නට ලැබීම සහ කිසිදු අධ්‍යාපනයක් නොලද මුහම්මද් තුමා මගින් පැහැදිලිව විස්තර කිරීම ඉස්ලාම් දැනුමට ලබා දෙන වැදගත්කම මනාව පැහැදිලි කරයි.

උත්භිත විද්‍යාව සහ ජීව විද්‍යා දැනුම අල්කුර්ආනය පාතමික වශයෙන් හෙළි කරන ආකාරය.

වර්ෂාපතනය ගැන අල්කුර්ආනය මෙසේ විසතර කරයි.

*'අප (වර්ෂාව ඇති කරවන) සාරවත් සුළං එවන්නෙමු'.* (15 : 22)

ශාක වර්ග සහ එහි ස්වභාවය එහි ලක්ෂණ යනාදිය ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

*'අප එහි අලංකාර ශාක වර්ගයන් යුගල වශයෙන් හට ගැන්වූයෙමු'.*
(50 : 7)

*'අප සියලු දැය යුගල වශයෙන් නිර්මාණය කළෙමු'.*
(51 : 49)

*'සෑම වර්ගයක්ම යුගල වශයෙන් නිර්මාණය (අල්ලාහ් දෙවිඳු වන) ඔහු සුවිශුද්ධය'.*
(36 : 36)

සාගරය සහ එහි පතුලෙහි සංයුතිය ගැන අල්කුර්ආනය මෙසේ පවසයි :

*'(ඔවුන්ගේ ක්‍රියාවන්) ගැඹුරු මුහුදෙහි අඳුරු වැනිය. එය රැල්ලක් වසා ගන්නේය. ඒ මත තවත් රැල්ලකි. ඒ මත වළාකුළුය. (මෙසේ) අඳුරු මත අඳුරු කීපයකි. (එහිවූ) කෙනෙකු තම අත දිග හැර බැලීනම් තම එය (අත) නොදකී.* (24 : 40)

කෙනෙකුගේ නිදහස සෑම ක්ෂේත්‍රයක් තුලම තහවුරු වන ආකාරයට ඉස්ලාම්හි ඉගැන්වීම් සම්පාදනය වී ඇත. සැබැවින්ම ඉස්ලාම් දහම තුලින් මිනිසාගේ ආකල්ප වර්ධනයට සහ චින්තනයට ලබා දී ඇත්තේ ප්‍රශංසනීය ස්ථානයකි. එසේ ලබා ඇති නිදහස සහ අනගි අවස්ථාව ඔහු විසින් විනාශ කර ගනී නම් එහි වගකීම බාර ගත යුත්තේ ඔහු විසින්ය.

උදාහරනයක් ලෙස කෙනෙකුට වෙළඳාම් කිරීමට අයිතියක් සහ නිදහසක් ඇත. නමුත් එම කටයුත්ත රැවටීම, විශ්වාස භංගව කට යුතු කිරීම වැනි විවිධ මාදිලියේ නොහොබිනා ක්‍රියාවන්හි නිරත නොවී කටයුතු කල යුතුයි. මෙහිදී අල්ලාහ්ගේ සීමා වන් කඩ නොකර යුක්තිගරුකව කටයුතු කරන්නෙකු ලෙස ගණන් ගනු ලැබේ.

ඉස්ලාම් දහම යනු සම්පූර්ණ, උසස් මගපෙන්වීමකි. නමුත් අවාසනාවකට මෙන් සමහර ඉස්ලාමිකයන් තමන් ඉස්ලාමීය භක්තිකයන් යනුවෙන් පවසා ගනිමින් එහි ඉගැන්වීම්වලට පටහැනි කටයුත්තන්හී නිරත වනු දක්නට ලැබේ. මෙසේ දහමට පටහැනිව කරන සමහර කටයුතු ඔවුන්ගේ මිනිස් දුර්වලතා මිස එය ඉස්ලාම් දහම අනුමත කළ එකක් ලෙස හැදින්වීම වැරැදිය. මක්නිසාද යත් සත්‍ය ඉස්ලාම් සෑම කාලයකට උචිත අන්දමින් එහි කිසිදු වෙනසක් හෝ අඩුවැඩි කිරීමක් හෝ කිරීමට නොහැකි ලෙස සකස්වී ඇත.

**ඉස්ලාම් දහම සහ එහි විශේෂත්වය සංෂිප්ත වශයෙන්.**

1.තපස් රැකීමේ ක්‍රම හෝ බ්‍රහ්මචාරී පිළිවෙතක් ඉස්ලාමයේ දක්නට නොමැත. ගිහි පැවිදි කියාද ඉස්ලාමයේ කොටස් නොමැත. මව්ලවි, ආලිම් යනුවෙන් හඳුන්වනු ලබන පිරිස් ඉස්ලාමීය කටයුතු මෙහෙයැවීමේදී මූලිකත්වය දරයි. ඔවුන් ඉස්ලාමය හැදැරූ විද්වතුන් වන අතර ඔවුනට විශේෂ පූජනීය තත්වයක් ලබා දී නැත. ඔවුහ් සාමාන්‍ය ලෞකික ජීවිතයක් ගතකරති.. සියළු නැමදුම් අල්ලාහ් ටම පමණක් සිදුකල යුතුය.

2. ලෞකික ජීවිතයෙන් ඈත්වීමක් ගැන උගන්වන්නේ නැත. නමුත්, ලෞකික කම්සැප

සුවයටද සහමුලින්ම වහල් නොවී මධ්‍යස්ත ජීවිතයක් ගත කිරීමේ අවශ්‍යතාවය ගැන මගපෙන්වා ඇත.

3. අනුන්ට බරක් නොවී ජීවත් වීමට උනන්දු කරයි.

4.විවාහය දිරිගන්වයි. තිසි වයසට පත්වූ තරුණ තරුණියන්ගේ විවාහ කටයුතු ප්‍රමාද නොකර තිසි කාලයේදී එම කටයුතු ඉටුකර දීම කෙරෙහි මගපෙන්වා ඇත.

5.යහපත් ලෞකික ජීවිතයක් ගත කිරීම තුලින් මතු ජීවිතයේ සාර්ථකත්වය අත්පත් කර ගැනීම කෙරෙහි උනන්දු කර ඇත.

6. කෙනෙකු විසින් විශ්වාසයක් තබා යම් කිසි දෙයක් ආරක්ෂාව සඳහා තබා ආපසු දෙන ලෙස ඉල්ලා සිටි විටක ඒ කෙරෙහි විශ්වාස වන්ත අන්දමින් කටයුතු කරන ලෙසද, දුන් පොරොන්දු ඉටු කරන ලෙසද, අන කරයි.

7. අන් අයගේ අවශ්‍යතා සහ උවමනාවන් සපුරා ගැනීමට පිහිට වන ලෙසද ඥාතී හිතමිතුරන්ගේ අවශ්‍යතා ඉටු කර දෙන ලෙසද අණපනවයි.

8. ගිලන් ගත වූවන්ගේ ලෙඩ දුක් විමසා බලන ලෙසද ඔවුන් දැක බලා ගැනීමට යන ලෙසටද අන

කරන ඉස්ලාම් දහම ඔවුන්ට ආදරය කරුණාව උපදවන විලසින් කතා කිරීමද ඉල්ලා සිටියි. අවමංගල්‍ය කටයුතුවලට සහභාගි වීමද, හිතවතුන්ගේ වියෝවකදී දුකට පත් අයවෙනුවෙන් ශෝකය පකාශ කරන ලෙසටද අන කරයි. මරණයට පත් අය වෙනුවෙන් පව් සමා අයැද ප්‍රාර්ථනා කරන ලෙසද අණ කරයි.

9. දෙමාපියන්ට ඇප උපස්තාන කරන දෙසද විශේෂයෙන් ඔවුන් මහළු තත්වයට පත් වූ කල කරුණා මෛත්‍රිය මුල්කරගෙන ඔවුන් හට සිය යුතුකම් ඉටු කරන ලෙසද අවවාද කර ඇත.

10. සැක කටයුතු ඇති කරවන දේ වෙතින් බොහෝ දුරට ඉවත් වී කටයුතු කරන ලෙසද අණපනවයි.

11. හැකි පමණින් නීති ගරුකව සහ යුක්තිගරුකව සිය ජීවනෝපාය සොයා ගන්නා ලෙසත් අධාර්මිකව කට යුතු නොකරන ලෙසටත් උපදෙස් දී ඇත.

12. ප්‍රිය වූ හෝ නොවූ මිනිසුන්ට උපරිම අන්දමින් යුක්තිය ඉටුකරන ලෙස ආඥා කරයි.

13. අසල්වැසියන් කුමන ආගමකට හෝ වේවා ජාතියකට හෝ වේවා ඔවුන් කෙරෙහි අනුකම්පාව දයාව දක්වන ලෙසද, ඔවුන් හා යහපත් ලෙස කටයුතු කරන ලෙසද, ප්‍රයෝජනවත් දේහී උත්සාහ

කරන ලෙසද, ඔවුන්ට යහපත් යැයි හැඟෙන දේ සපයන ලෙසත් ආඥා කරන අතර ඔවුන්ට විපත්තියක් කරදරයක් ඇති විය කරුණුවලින් ඉවත් වන ලෙසද ආඥා කරයි.

13. කාන්තා පිරිමි දෙපාර්ශ්වයටම අධ්‍යාපනය හැදෑරීම අනිවාර්ය කර ඇත.

14. අඹුදරුවන් වෙත ඉටුකල යුතු සේවය සම්පූර්ණව ඉටුකර ඔවුන් හා මනා ලෙස හැසිරෙන ලෙස අණ කරයි.

14. ඉස්ලාම් සත්‍ය දැය කර නරක දේ කිරීමේදී ලැජ්ජාශීලී වන ලෙසද, කාරුණික වන ලෙසද, ගෞරව දක්වන ලෙසද, නිර්භීත වන ලෙසද සත්‍ය කරුණු වෙනුවෙන් පිටිවහල් වන ලෙසද අණ පනවයි.

15. වෙනත් ආගම් හා විශ්වාසයන් අපහාසයට ලක් නොකරන ලෙසද යහපත් ලෙස සංවාදයන්හි යෙදෙන ලෙසටද අන කරයි.

**ජීවිතාරක්ෂණය පිලිබද ඉස්ලාම්හි මතය ෙකටිෙයන්.**

මේ පිළිබඳව ඇති අල් කුර්ආන් (5:32) වදන ෙමෙස් පවසයි.

“කෙනෙකු තව අයෙකුව ඝාතනය කිරීමට හෝ පොළොව මත කලහකම් ඇතිකරවීමට දඬුවම් වශයෙන් හැර මිනිසෙක්ව නිරපරාධේ මරා දැමීම මුළු මහත් මිනිස් වර්ගයාම මරා දැමීමට සමාන වන්නේය. එලෙසම යමෙක් මිනිස් ජීවිතයක් ආරක්ෂා කරගනීද ඔහු මිනිස් වර්ගයාම ආරක්ෂාකරගත්තා හා සමානය.”

ඉහත අල් කුර්ආන වැකියෙන් මිනිස් ජීවිතයක් නිකරුනේ ඝාතනය කිරීම මුළු මහත් මනුෂ්‍ය වර්ගයාම ඝාතනය කිරීමකටද, එලෙසම යමෙක් මිනිස් ජීවිතයක් ආරක්ෂා කර ගනීද එය මුළු මහත් මනුෂ්‍ය වර්ගයාම ආරක්ෂා කර ගැනීමකටද සමාන කර ඇත.

**මේ අනුව මිනිස් ජීවිත ආරක්ෂා කිරීම ඉස්ලාමයේ උසස් ඉගැන්වීමක් බව මනාව පැහැදිවේ.**

ඉස්ලාමීය රාජ්‍යය රාමුවක් තුල නීතිය හා සාමය පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාවය පෙන්නුම් කරඇත. නීතිය හා සාමය පවත්වා ගෙන යෑමද ජීවිත ආරක්ෂණය සඳහා පදනම් වුවකි.

“අවබෝධ කරගන්නෙනි, ‘කිසාස්’ (සමබර ලෙස සාධාරනය ඉටුකිරීමේ නීතියෙ) හි ජීවිතයක් (සුරුකෙනු) ඇත; නුඹලා (ඝාතනයෙන් ඇත්වී) බිය බැතිමත් වනු පිණිස” (අල් කුර්ආනය 2:179)

‘මෙහිදී අල්ලාහ් අවධාරණය කරනුයේ මෙවනි දඬුවම් නීති ප්‍රසිද්ධියේ ක්‍රියාත්මක කිරීම මගින් එය සෙසු අයට

එවැනි අපරාධ ක්‍රියාවකට පෙළඹීමට ඇති අවස්ථා මුලිනුපුටා දැමීමයි.

මේ සම්බන්ධයෙන්ද ලොෙවහි අද පවතින කිසිම නීති ක්‍රමයක නොමැති ජීවිතාරක්ෂණය සහතික කරන ක්‍රමයක් ඉස්ලාමීය නීතියෙහි අන්තර් ගතවී ඇත.

“විශ්වාස වන්තයිනි, ඝාතනයට ලක් කරනු අයවලුන්ගේ විෂයයෙහි කිසාස් (සමබර ෙලස සාධාරනය ඉටුකිරීෙම් නීතිය) අනිවාර්යය කරනු ලැබ ඇත; නිදහස් පුද්ගලයාට නිදහස් පුද්ගලයාද, වහලෙකුට වහලාද, ස්ත්‍රියකට ස්ත්‍රිය ද (මරණ දණ්ඩනයේ නීතීන්ට යටත්) වේ; එනමුත් තම (ඝාතනයට ලක්වූ තැනැත්තාගේ) සහෝදරයා විසින් කවරෙකු (ඝාතකයා) ට යම් කිසි සමාවක් දෙනු ලබන්නේද ඔහු (ඝාතනයට ලක්වූ තැනැත්තාගේ සහෝදරයා එවිට වන්දි මුදල සම්බන්ධයෙන්) සාධාරණත්වය අනුගමනය කළ යුතුය; තවද ඔහු (ඝාතනයට ලක්වූ තැනැත්තාගේ සහෝදරයා) වෙත යහපත් අයුරින් (වන්දිය) ඉටු කළ යුතුය; එය නුඹලාගේ පරමාධිපතිගෙන්වූ සහනයකි, තවද කරුණාවකි; ඉන්පසුව කවරෙකු හෝ සීමාව ඉක්මවා යන්නේ නම් ඔහුට වේදනීය දඬුවමක් ඇත.” (අල් කුර්ආනය 2:178)

**ෙමහි අර්ථ විවරණය සංක්ෂිප්තව ෙමෙස් සදහන් කිරීමට හැක.**

මිනිස් ඝාතනයකදී ඝාතනයට ලක්වූ පවුෙල් පාර්ශවයට සර්ව සාධාරනය ඉටුකිරීෙම් නීතිය යටතේ ඝාතකයාට මරණ දඬුවම පමුණුවන ලෙස අධිකරණයෙන් ඉල්ලා සිටීමේ අයිතිය ඇත. නමුත් තවත් විකල්පයද අැත ඒනම් මරණ දඬුවම වශයෙන් 'දියා' යනුවෙන් හැඳින්වෙන වන්දි මුදලක් ලබාගෙන ඝාතනයට ලක්වූ පවුෙල් පාර්ශවයට ඝාතකයාට සමාව දීමේ අයිතියද ලබාදී ඇත. මෙය රටක පාලකයා විසින් හෝ ඉහල උසාවියකින් දෙනුලබන සමාව හා සම නොවේ.

පවුලක් නඩත්තු කරන වගකීම සහිත පුද්ගලයා ඝාතනයට ලක්වූ විට පවුෙල් අය අසරණ තත්ත්වයට පත් ෙව්. ඒබැවින් මෙවනි අවස්තාවකදී ඉස්ලාමීය නීතිය අනුව අධිකරණය මරණ දඬුවම නියම කලද අසාධාරනයට පත් පාර්ශවයට මරණ දඬුවම ෙවනුවට වන්දි මුදලක් ලබා ගැනීෙම් වරමක් ලබා දී තිෙබ්.

ඒෙමන්ම වන්දි මුදලක් ලබා ගැනීමකින් ෙතාරව සමාව දීමේ අයිතියද අසාධාරනයට පත් පාර්ශව කරුවන්ට ලබාදී තිබේ.

**මුහම්මද් නබි තුමා ලෝක ඉතිහාසයේ සුවිශේෂ සංකේතයකි.**

**<u>විශ්වාස වන්තයිනි! මුහම්මද් නබි (ﷺ) තුමාණන් ඔබ සැම බැහැදැකීමට පෙරුම් පුරයි.</u>**

අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන හදීසයක මෙසේ සඳහන් වේ. මුහම්මද් නබි (ﷺ) තුමාණන් වරක් සුසාන

භූමියකට පැමිණි අවස්ථාවේදී මෙසේ පැවැසූහ. සොහොන් ගැබ් තුල සැතැපෙන විශ්වාස වන්තයිනි! ඔබ සැමට අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය ඇති වේවා! ඉන්ශා අල්ලාහ් අප සැමද ඔබ සැම සමග එක්වීමට නියමිතයි. දවසක් දා අප සහෝදරයින් හමුවීමට අපේක්ෂා කරමි.

එවිට සහාබාවරුන් නබි තුමාණනි! අපි ඔබ තුමාගේ සහෝදරවරුන් නොවේද? යනුවෙන් පැවැසූහ, එවිට මුහම්මද් නබි (ﷺ) තුමාණන් "ඔබලා මගේ මිත්‍ර සොහොයුරන්ය. මගේ සහෝදරයින් මෙතෙක් පැමිණියේ නැත" යනුවෙන් පවසා ඔවුහු විනිශ්චය දිනයේදී වුදු කිරීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන්ගේ අවයවයන් ප්‍රභාශ්වර එළියකින් යුක්තව මා හමුවට පැමිණෙති. ඔවුන් සඳහා හව්ද් හෙවත් ජල තටාකයෙන් ජලය සැපැයීමට මා සූදානමින් සිටිමි. (සාධක ග්‍රන්ථය : මුස්ලිම්)

සහෝදර මුස්ලිම්වරුනි! ඔබ සැම බැහැදැකීමට පෙරුම් පුරාගෙන සිටින නබි (ﷺ) තුමාණන්ගේ ආදර කරුණාවෙහි හැඟුම් බර උපහාරයට මහෝපකාරයක් ඔබ විසින් කළ යුතු නොවේද? එතුමා විසින් දේශනා කොට වදාල පහත සඳහන් රුවන් වැකිය ඔබේ ජීවිතය සමග මුසු කළ යුතු නොවේද? එනම් " මගේ ජනසමාජයෙහි මට ඉතා ලැදි ජනයා කවුරුන්ද යත් මගේ (වියෝවෙන්) පසු පැමිණෙන ජනයන් වේ. ඔවුහු ඔවුන්ගේ මිළ මුදල් සම්පත්, ඥාතී හිතවතුන්ට වඩා මා හමුවීම ප්‍රිය කරති. (ග්‍රන්ථය: මුස්ලිම්)

**<u>මුහම්මද් නබි (ﷺ) තුමාණන් අපහාසයට ලක් කරන ජනතාවට ඔබ විසින් පෙරලා තිසි පිළිතුරක් ලබා දෙන්නේ කෙසේද?</u>**

ඇත්ත වශයෙන්ම වචනයෙන් පිළිතුරු දීමට වඩා ඔබ කළ යුත්තේ ඔවුන්ට ආදර්ශමත් වීමයි. එනම් ඔබ විසින් මුහම්මද් නබි (ﷺ) තුමාණන්ගේ උතුම් ගුණාංග, එතුමාගේ අවවාද අනුශාසනා සහ මග පෙන්වීම් අනුගමනය කළ යුතු අතර ඒ අනුව ඔබේ ජීවිතයද ගොඩ නගා ගතයුතුයි. එවිට එතුමාගේ චරිතය ඝාතනය කරන සහ එතුමාට විරුද්ධව නැගී සිටින බලවේග අබල දුබල වන අතර ඔවුන්ගේ බලාපොරොත්තු සුනු විසිනු වීමේ හේතුවෙන් ඔවුහු පළා යනු ඇත.
නබි තුමාණන් මක්කාවේ විසූ කාලයේදී පවා **එතුමාණන් අපහාසයට ලක් කල ජන කොටසක් විසූහ. මේ ගැන අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.**

**ඔබ අපහාසයට ලක් කරමින් ඔවුන් පවසන දේ නිසා ඔබේ සිත වේදනාවට ලක් වන බව නිසකවම අපි දනිමු ○ එබැවින් ඔබ ( ඔවුන් පවසන දේ නිසා සිතෙහි අනවශ්‍ය කළබලයක් ඇති නොකර) ඔබගේ ආරක්ෂකයානන්ගේ ප්‍රශංසාව මුල් කරගෙන ඔහුට ස්තෝත්‍ර කරන්න ○ තවද (ඔහුට සිරස නමා) සුජූද් කරන්නන් අතර කෙනෙකු වන්න ○ ඔබට (යකීන් හෙවත්) මරණය පැමිණෙන තුරු අල්ලාහ්ට නැමැදුම් කරන්න ○ (සූරතුල් හිජ්ර්)**

මුහම්මද් නබි (ﷺ) තුමානන් දේහ ලක්ෂණය අතින්ද ගතිගුණයෙන් ද සියළු දනන්ට වඩා ශ්‍රේෂ්ඨ වූහ. වෙළඳ පොළේදී ශබ්ද නගා කතා කළේ නැත, නපුර නපුරෙන් ඉවත් කිරීමේ පුරුද්දක් එතුමා දක්නට ලැබුනේ නැත, සමාව දීම මෛත්‍රී කිරීම වැනි යහපත් ගුණාංග එතුමා තුල දක්නට ලැබුණි. අසාධාරනය අසාධාරනය තුලින් නැති කළේ නැත. නමුත් අල්ලාහ් තආලා විසින් තහනම් කරන ලද දෙයක් (කෙනෙකු විසින් ) ක්‍රියාවට නැංවීම දකින අවස්ථාවේදී එතුමාට අධික ලෙස සධාරන කෝපයක් ඇති විය.

ඕනෑම කටයුත්තක් එය ඉටු කිරීමට මං දෙකක් ඇත්නම් එයින් පවක් සිදු නොවන අකාරයට පහසු මාර්ගය තෝරා ගත්හ. අල්ලාහ්ගේ මාර්ගයෙහි (බහුතර ජනයාගේ සුභ සිද්ධියට විනාශයක් සිදු කිරීමට පෙළෙඹෙන ඕනෑම කෙනෙකුට විරුද්ධව ශුද්ධවූ චේතනාවෙන් එරෙහි වීමට) ජිහාද්හි යෙදුනු නමුත් එතුමා කිසිවිටක වහල් පුද්ගලයකුට කාන්තාවකට, සේවය සේවිකාවන්ට පහර දුන්නේ නැත.

අනස් (රලි) තුමා මෙසේ වාර්තා කරයි. මම මුහම්මද් නබි (ﷺ) තුමාණන්හට අවුරුදු 10 ක් තිස්සේ ආවතේව (සේවය) කළෙමි. කිසිදාක මගේ සිත පැරෙන ආකාරයේ වචනයක් පවා පැවසුවේ නැත. මා විසින් නොකළ දෙයකට ඇයි නොකළේ යනුවෙන් හෝ කළ දෙයකට එසේ කළේ ඇයිද යනුවෙන් හෝ පැවැසුවේ නැත.

අතිනත දී කෙනෙකු සුහදව පිළිගත් අවස්ථාවේදී හෝ එතුමාණන් පිළිගැනීමට ලක්වූ මොහොතේදී සිය සහෝදරයා ඔහුගේ දැත මුලින් ඉවත් කලා විනා එතුමා සිය දැත ඉවත් කර ගත්තේ නැත.

ඕනෑම කෙනෙකු ප්‍රිය මනාප ලෙස සිනහමුසු මුහුණෙන් පිළිගැනීමට වග බලා ගත්හ. මුහම්මද් නබි (ﷺ) තුමානන් සමග පිළිසඳරක යෙදුනු සෑම දෙනාම එතුමාට ඉතා ලැදි හා ආදරයට ලක්වූ තැනැත්තා තමන් යැයි සිතන තරමට ඕනෑම කෙනෙකුට උසස් පිළිගැනීමක් ලබා දී නෙතින් නෙත ගැටී සෘජුව ඔහුගේ මුහුණ දෙස බලමින් කථා බහ කළහ.

ජරීර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමාණන් මෙසේ පවසයි. මා ඉස්ලාම් ධර්මය වැළඳගත් දින පටන් මුහම්මද් නබි (ﷺ) තුමාණන්ව දුටු සෑම මොහොතකම එතුමාගේ ශුද්ධ වූ මුහුණ සිරියාවන්ත බවින් හා සිනහ මුසු මුහුණෙන් දිස්විය.

අබ්දුල්ලාහ් බින් හාරිස් (රලි) තුමාණන් මෙසේ වාර්තා කරයි. මුහම්මද් නබි (ﷺ) තුමා තරම් සිනහ මුසු මුහුණෙන් දිස් වූ වෙන කිසිඳු පුද්ගලයෙකු මා දුටුවේ නැත.

වැය වූ කාලය මෙපමණයි යනුවෙන් කිව හැකි තරමට එතුමාණන්ගේ කථා බහ කෙටි විය. එතුමාණන් පොදු ජනයාට කරුණු අවබෝධ වෙන ආකාරයට සිය දේශනාව පැහැදිලි කළහ. නොකඩවා වේගවත් ලෙස

සියළු දේ එකවර පැවැසුවේ නැත. කරුණු වටහා ගැනීම දුෂ්කර තැන් ඇත්නම් ඒවා (දෙවතාවක් හෝ) තුන්වතාවක් පහදා දුන්හ.

කෙනෙකු සම්බන්ධයෙන් තොරතුරක් ලැබුනු මොහොතක ඒ තැනැත්තා අමතා අසවල් පුද්ගලයා මෙසේ පවසන්නේ මන්දැයි යනුවෙන් එක් පුද්ගලයෙකු දෙසට ඇඟිල්ල දික් කරනවා වෙනුවට බහුතර මෙසේ පවසන්නේ මන්දැයි යනුවෙන් පැවැසීමට පුරුදු වූහ.

මුහම්මද් නබි (ﷺ) තුමාණන් සැම විටම අල්ලාහ් තආලා සිහි කළහ. සිය මිත්‍ර සහෝදර වරුන් සමග රැස්ව සිටින අවස්ථාවන්හිදී සිය වතාවක් අල්ලාහ් තආලාගෙන් සමාව අයද සිටි බව එතුමාගේ සහෝදර මිතුරන් විසින් පවසා ඇත. එනම් :

(رب اغفر لي وتب علي انك انت التواب الرحيم)

**රබ්බිග් ෆිර්ලී වතුබ් අලයිය ඉන්නක අන්තත් තව්වාබුර් රහීම්**

තේරුම: යා අල්ලාහ් මගේ වැරදි සහ පව් සඳහා සමාව අයද සිටිමි ඔබ අපේ පාප ක්‍රියාවන් සඳහා සමාව දෙමින් අපට කරුනාවද දක්වන්නේය.

එතුමා වරක් මෙසේ පැවැසූහ. ඇත්ත වශයෙන්ම මා දවසකට 70 වතාවක් අල්ලාහ්ගෙන් සමාව අයදමින් පාපෝච්චාරනය කරමි.

එතුමා බොහෝ අවස්ථාවන්හිදී පහත සඳහන් දුආ (ප්‍රාර්ථනය) කිරීමට පුරුදු පුහුණු වි සිටියහ. ربنا آتنا في الدنيا حسنة وفي الآخرة حسنة وقنا عذاب النار

**රබ්බනා ආතිනා ෆිද් දුන්යා හසනතන් වෆිල් ආහිරති හසනතන් වකිනා අදාබන්නාර්**

තේරුම: අපේ ආරක්ෂකයාණෙනි අපට මෙලොවද අලංකාර කරන්න එලොවද අලංකාර කරන්න.

يا مقلب القلوب ثبت قلبي على دينك

**යා මුකල්ලිබල් කුලූබ් සබ්බිත් කල්බී අලා දීනික**

තේරුම : සිත් සතන් වෙනස් කරන්නාණෙනි ඔබේ ධර්මය කෙරෙහි මගේ සිත ස්ථාවර තත්ත්වයෙහි තබන්න.

රැස්වීමක් අවසානයේදී පහත සඳහන් ප්‍රාර්ථනය කළහ.

سبحنك اللهم وبحمدك أشهد أن لا إله إلا أنت أستغفرك وأتوب إليك

**සුබ්හානකල්ලාහුම්ම වබිහම්දික අශ්හදු අන් ලාඉලාහ ඉල්ලා අන්ත අස්තග්ෆිරුක වඅතූබු ඉලයික.**

තේරුම : යා අල්ලාහ් ඔබ ප්‍රශංසාවට ලක් කිරීම තුලින් මා ඔබ ස්තෝත්‍ර කරමි. ඔබ හැර වන්දනාමානය කිරීමට වෙන කිසි දෙවියෙකු නැති බවට සාක්ෂි දරමි.

මුහම්මද් නබි (ﷺ) තුමාණන් නිවෙස් අඩස්සිය තුල සිටින කන්‍යාවකට වඩා ලැජ්ජා සහ විනය ගරුක වූහ. නමුත් සමාජය තුල නොහොබිනා අශිෂ්ඨ තැන් දුටුකළ එතුමා සිය මුහුණෙහි ඉරියව් තුලින් එය පිළිකුල් කළහ.

දනට පිනට දීම අතින් මුහම්මද් නබි (ﷺ) තුමාණන් අන් සියළු දෙනා අභිබවා ඉදිරියෙන් සිටියහ. එතුමාගෙන් ආධාර උපකාර පතා පැමිණි කෙනෙකුගේ ඉල්ලීම කිසිවිටක ප්‍රතික්ෂේප කළේ නැත. පුන්‍ය කර්මයක් ප්‍රධානය කිරීමේදී දිළිඳු හා දරිද්‍රතාවයට බිය නොවී සාගරයක් සේ අල්ලාහ් උදෙසා දනට පිනට දුන්හ.

පුන්‍ය කර්ම කටයුතු පිළිබඳව එතුමා වරක් මෙසේ දේශනා කළහ. උහද් කඳු වැටිය තරම් රත්‍රං කඳක් දායාදයක් වශයෙන් මට ලැබුනද එයින් මගේ නය බේරා ගැනීමට අවශ්‍ය තරම් ප්‍රමාණයක් ලග තබා ගන්නවා විනා ඉතුරු කොටස් දවස් තුනකට වඩා මා සතුව තබා ගැනීමට අකමැති වෙමි.

මුහම්මද් නබි (ﷺ) තුමාණන් ප්‍රඥාශීලී පුද්ගලයෙකු විය. වරක් දරුණු අරාබි ජාතිකයෙකු එතුමාගේ පසු පසින් පැමිණ එතුමාගේ ගෙල තුවාල වන ආකාරයට එතුමාගේ වස්ත්‍රයෙන් ඇද බැන විදින්නටද විය. එම අවස්ථාවේදී උරණ නොවූ එතුමානෝ සිනහමුසු මුහුණින් හා කරුණාවෙන් එම පුද්ගලයා දෙස බලා ඔහුටද යමක් දනට පිනට ප්‍රධානය කරන ලෙස ඉල්ලා සිටියහ.

එතුමා වීර්‍යය අතින් සැම දෙනාටම වඩා බලවික්‍රම වූහ. වීර්‍යය ගුණාංගයට ප්‍රතිමූර්තිය වූ අල් බර්රා බින් මාලික් (රලි) තුමා මෙසේ පවසයි. ශුද්ධ වූ යුද්ධයක් උනුසුම් මුහුණුවරක් ගත් අවස්ථාවකදී එතුමා සතුරන්ට ඉතා සමීපව සිටි අතර අපි එතුමා පිටු පස සිට සටන්

කළේමු. එතුමා හතුරන්ට ලංවෙන මොහොතක අප අතර සිටින සටන් කාමීන් එතුමා අසලට වී සටන් කළහ.

සිය මිත්‍ර (සහාබා) සහෝදරයින්ගේ බොහෝ අවශ්‍යතා ඉටු කර දෙමින් එතුමා පරිත්‍යාග ශීලීව කටයුතු කළේය. බිලාල් වැනි නය බරින් සිටි සහාබාවරුන්ගේ නය තුරස් පියවූහ. සහෝදර සහෝදරියන්ගේ ආවාහ විවාහ කටයුතු ඉටු කර දුන්හ. ජාබිර් නමැති පුද්ලයා යුදෙව් ජාතිකයෙකුට නය වී සිටියදී එම නය පියවීමට කල් ඉල්ලා ඔහු වෙනුවෙන් පෙනී සිටියේය. කාන්තාවක් ඇයගේ ස්වාමි පුරුෂයා ගැන පැමිණිලි කල අවස්ථාවකදී ඔවුන් අතර පැන නැගී ඇති ගැටළු නිරාකරනය කිරීමට වගබලා ගත්තේය. තවත් අවස්ථාවකදී පුද්ගලයෙකු සිය ඔටුවාගෙන් සිදු වන අපහසුතා ගැන පැමිණිලි කළ අවස්ථාවේදී එම ඔටුවා බැහැදැකීමට ගියහ. එවිට එතුමාණන්ට එම ඔටුවා විසින් තම ස්වාමියා තමන්ගෙන් අධික වැඩ ගන්නා බවත් නිසි ලෙස කෑම බීම නොදී නොසලකා හරින බවටත් පැමිණිල කරන ලදි. එබැවින් මිනිසුන් පමණක් නොව සතුන්ද එතුමාගෙන් පිළිසරණ පැතීය. ( ග්‍රන්ථය : අහ්මද්)

මෙතුමාගේ මෙම ගුණාංගය ගැන අල්ලාහ් තආලාගේ පහත සඳහන් අල් කුර්ආන් වදනින් සනාත කරයි. وما أرسلناك إلا رحمة للعالمين (වමා අර්සල්නාක ඉල්ලා රහ්මතන් ලිල් ආලමීන්) තේරුම: (මුහම්මද්) ඔබ ලෝකවාසී සත්වයාට කරුණාව දයාව දක්වන්නෙකු මිස පහළ කළේ නැත. (පරිච්ඡේදය : අල් අන්බියා)

මුහම්මද් නබි (ﷺ) තුමාණන් නිහතමානී සහ අවංක පුද්ගලයෙකු වූහ. එතුමාණන් අනාත අසරණ වූවන්ගේ සහ වැන්දඹු කාන්තාවන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට ඇප කැප වී කටයුතු කළ අතර එය තමන්ගේ ගෞරවයට මදි කමක් ලෙස කිසිවිටක නොසිතූහ. වරක් එක් කාන්තාවක් එතුමාගේ අභියසට පැමිණ " ඔබ තුමා විසින් මගේ අවශ්‍යතාවක් ඉටු කළ යුතුයි" යනුවෙන් පවසන ලදි. එවිට " ඔබේ අවශ්‍යතාවය ඕනෑම මාර්ගයකින් ඉටු කර දීමට මා සූදානම්ය" යනුවෙන් පවසා ඇයගේ අවශ්‍යතා ඉටු කර දුන්හ.

එපමණක් නොව දිළිඳු දුප්පත් තිවසකින් තත්ත්වයෙන් අඩු කල්ගත වීමේ හේතුවෙන් සුවඳ වෙනස්වූ තෙල් දමා පිසින ලද අහාරයක් අනුභව කිරීම සඳහා කැඳවීමක් ලැබුනද එයට සහභාගිවී එම ආහාර අනුභව කළහ.

එතුමා වරක් මෙසේ පැවැසූහ : මට ප්‍රමිතියෙන් අඩු තත්තවයෙන් බාල ආහාරයක් ත්‍යාගයක් ලෙස ප්‍රධානය කළද එය භාර ගනිමි, ඒ සඳහා ආරාධනාවක් ලැබුනු කල එයට සහභාගි වෙමි. එතුමානන්ට අයිති වටිනා පලිහක් යුදෙව්වෙකු වෙත උගසට තබන ලදි, එතුමාගේ වියෝවය දක්වා එය නැවත බේරා ගැනීමට තරම් ධන ශක්තියක් එතුමාට නොතිබිණි.
එතුමා කුඩා දරුවන්හට ආදරය කරුණාව දැක්වූහ. තවද ඔවුන් සමග එකතු වී කෙළි සෙල්ලම්ද කළේය. අනස් (රලි) තුමාණන් මෙසේ දේශනා කළහ. මුහම්මද් නබි (ﷺ) තුමාණන් මෙන් පවුලේ ඥාතීන් සමග සුහදව කටයුතු කළ වෙන කිසිවෙකු මම දුටුවේ නැත. එතුමා

කුඩා දරුවන් අතරට පැමිණ ඔවුන්ට සලාම් ආශිර්වාදය කිරීමට පුරුද්දක් කර ගත්හ.

**ඉස්ලාම් සම්බන්ධ මෙවන් පොත් සිංහලෙන් කියවා ජනයා ඉස්ලාම් ධර්මය අවබෝධ කර ගැනීම මාගේ එකම ප්‍රාර්ථනාවයි. සියලු දෙනාමට අල්ලාහ්ගේ ආශිර්වාදය ලැබේවා**

********

ISLAM LAND

www.islamland.com